# දළදා වරුණ

මහනුවර ශ්‍රී දළදා මාළිගාව මාසිකව නිකුත් කරන
ලංකාවේ වැඩිම පිරිසක් කියවන බෞද්ධ සඟරාව

■ ශ්‍රී බුද්ධ වර්ෂ 2560 උඳුවප් මස පුර පසළොස්වක නම් තිථිය ලත් කුජ දින ■ 2016 දෙසැම්බර් මස 13 වැනි අඟහරුවාදා



■ නොමිලේ පිරිනමන දහම් පඬුරකි ■ විකිණීම සඳහා නොවේ



# උඳුවප් පුන් පොහොය දිනයේ වැදගත්කම

ශ්‍රී ලංකාවේ බුදු සසුන පිහිටුවීමට මුල්වූ මිහිඳු මහ රහතන් වහන්සේගේ අවසරය පරිදි දෙවන පෑ තිස් රජුගේ ආරාධනාවෙන් සංඝමිත්තා මෙහෙණිය ප්‍රමුඛ භික්ෂූන් ලක්දිවට වැඩම කරන ලද්දේ අද වන් පුන් පොහෝ දිනකය. අනුලාවන් ඇතුළු සෝවාන් ඵල ලැබ සිටි කාන්තාවන් පිරිසක් පැවිදි බවට ලත්කර ලක්දිව මෙහෙණි සස්න පිහිටවනු ලැබුවේද උඳුවප් පුර පෝය දවසකය.

ශාසනික වශයෙන් සිංහල බෞද්ධයාට උඳුවප් පෝය ඉතා වැදගත් වෙයි. ලංකාවේ භික්ෂුණී ශාසනයේ ආරම්භය සිදුවීමත්, සංඝමිත්තා රහත් තෙරණිය ප්‍රධාන මෙහෙණින් වහන්සේලා 11 නමක් ශ්‍රී මහා බෝධියේ දක්ෂිණ ශාඛාව දඹදිව සිට ශ්‍රී ලංකාවට වැඩමවීමත් උඳුවප් පෝය සම්බන්ධ කෙරෙන ඓතිහාසික, ශාසනික සිදුවීම්ය.

උඳුවප් මාසය සිංහල ජන ජීවිතයටද වඩාත්ම වැදගත් මාසයකි. මෝසම් වැසිවලින් කෙත් වතු සරුකර ගත හැකිය. අගෝස්තු, සැප්තැම්බර් මාසවලදී එළි පෙහෙළි කරගත් අලුත් හේන්වල බව භෝග සිටුවන්නේද මෙම වැසි බලාපොරොත්තුවෙනි. මාස් කන්නය සඳහා කුඹුරු අස්වද්දන්නේද මේ මාසයේය. විශේෂයෙන් උඳු වපුරන මාසය උඳුවප් යනුවෙන් හැඳින්වීමෙන්ම එහි වැදගත්කම කැපී පෙනේ.

''මේ ලෝකයේ කවරදවත් වෛරයෝ වෛරයෙන් නොසන්සිඳෙත්. අවෛරයෙන්ම වෛරයෝ සංසිඳෙත්.''



# සිහියක් නැතිනම් නිවනත් බොරුවක්

සතිය හෙවත් සිහිය යන කාරණයට බුදුදහමේ ප්‍රමුඛ ස්ථානයක් හිමිවෙයි. බුදුරජාණන් වහන්සේ බොහෝ අවස්ථාවල මනාව සිහිය පිහිටුවා ගැනීමෙන් ලැබෙන යහපත් ප්‍රතිඵල පිළිබඳව දේශනා කොට වදාළ සේක. යම් මිනිසෙක් යහපත් මාර්ගයට හෝ අයහපත් මාර්ගයට ප්‍රවිෂ්ඨ වීමට සතිය හෙවත් සිහිය ප්‍රබල ලෙස බලපායි. එයට හේතුව වන්නේද හොඳ සිහියෙන් තොර වූ විට මිනිසුන් කරන කටයුතු අවුල් සහගත වීමයි. සමහර අවස්ථාවල අවුල් සහගත සිහියෙන් යුතු පුද්ගලයා තම ජීවිතයද හානිකර ගනියි.

එපමණක්ද නොව සමහර අවස්ථාවල වටිනා ජීවිතවලටද, දේපොළවලටද හානි පමුණුවයි. එය ඉතා භයානකය.

වර්තමාන සමාජයේ අසන්නට ලැබෙන කනගාටුදායක සිදුවීම් බොහෝමයකට මූලික හේතුවක් වන්නේ අසිහියයි. දිනපතා සිදුවන රිය අනතුරු පිළිබඳව හොඳින් අධ්‍යයනය කළහොත් අපට පෙනී යන්නේ එවැනි අනතුරු රාශියකට මූලික හේතුව වන්නේ සම්මා සතිය හෙවත් හොඳ සිහියෙන් යුක්ත නොවීමයි. වාහනයක් පදවන විට දුරකථනය පාවිච්චි කිරීම, වටපිට බැලීම, අන්‍යයන් සමග උසුළු විසුළු කිරීම ආදී ක්‍රියාකාරකම් හේතුවෙන් මානසික ඒකාග්‍රතාව බිඳී යයි.

විපිළිසර වූ මානසික ඒකාග්‍රතාව බිඳී ගිය සිතින් යුතු පුද්ගලයා වඳුරෙකු හා සමානය. එවැනි පුද්ගලයන්ගෙන් අනතුරු සිදුවීමට ඉඩ ප්‍රස්ථාව වැඩිය. අද වාර්තා වන රිය අනතුරුවලින් වැඩි ප්‍රමාණයක් සිදුවන්නේ රියැදුරන්ගේ මානසික ඒකාග්‍රතාව බිඳී යාම හෙවත් සිහිය අසිහිය වීමයි.


එපමණක් නොව මනා සිහියෙන් යුක්ත නොවීම සමාජයට බරපතළ ඛේදවාචකයක් බවට පත්වී හමාරය. සමහර අවස්ථාවල සාමාන්‍ය පෙළ, උසස් පෙළ සිසුන් විභාග යේදී තමා ලියූ පිළිතුරු පත්‍රයද රැගෙන ගෙදර ගිය අවස්ථා වාර්තා වෙයි. විශේෂයෙන්ම අධ්‍යාපනය ලබන වයසේ පසුවන්නන් මනා සිහියෙන් යුක්ත විය යුතුය.

නමුත් එවැනි සිදුවීම් අසන්නට ලැබීම ජාතියේ අවාසනාවකි. එපමණක්ද නොව රෝහල්වලින් ඉතා දුක්ඛදායක පුවත් අසන්නට ලැබෙයි. ශල්‍යකර්ම සිදුකර අවසානයේදී කුස තුළ හෝ එම තුවාල තුළ පුළුන් කැලි, ගෝස් කැලි, කතුරු ආදිය දමා තුවාලවලට මැහුම් දමා වසා දැමූ අවස්ථා පිළිබඳ නොයෙක් අවස්ථාවල අනාවරණය වෙයි. වෛද්‍යවරයකු අතින් මෙවැනි අතපසුවීමක් සිදුවීම බරපතළ ඛේදවාචකයකි. එවැනි අතපසුවීමක් සිදුවීමට ප්‍රධානම හේතුව සිහිය පිහිටුවා නොගැනීමයි. එවැනි දෙයකින් රෝගියාගේ ජීවිතය පවා අහිමි වීමට ඇති ඉඩකඩ බොහෝය.

සංයුක්ත නිකායේ 'සකුනග්ගී' සූත්‍රයේදී බුදුරජාණන් වහන්සේ ගිජු ලිහිණියකු සහ කැට කුරුල්ලකු උපමා කරගනිමින් සිහිය පිහිටුවා ගැනීමේ වැදගත්කම පිළිබඳව දේශනා කළ සේක.

සිහිය පිහිටුවා ගැනීම ලෞකික ජීවිතයට මෙන්ම ලෝකෝත්තර ජීවිතයටත් ඉතා වැදගත් බව බුදුරජාණන් වහන්සේ දේශනා කළ සේක. සිහිය පිහිටුවා ගත යුතු ආකාරය පිළිබඳව බුදුරජාණන් වහන්සේ සතිපට්ඨාන සූත්‍රයේදී මෙසේ දේශනා කළ සේක.

''යමකු බැරිවීමකින් පවක් කළත් නැවත නැවත එය නොකළ යුතුය. පව් කිරීම නිසැකවම දුකට හේතු වේ.''



1. **අභික්කන්තේ පටික්කන්තේ සම්පජාන කාරී හෝති**

ගමන් කිරීමේදී මනා සිහියෙන් යුක්තව ගමන් කළ යුතුය.

2. **අලෝකිතේ විලෝකිතේ සම්පජානකාරී හෝති**

ඉදිරිය, පසුපස බලන විට සිහියෙන් යුක්ත වීම.

3. **සම්මිඤ්ජිතේ පසාරිතේ සම්පජානකාරී හෝති**

අතපය හකුළුවන, දිග හරින විට මනා සිහියෙන් යුක්ත වීම.

4. **සංඝාටිය පත්තචීවරධාරනේ සම්පජානකාරී හෝති**

පාත්‍ර සිවුරු දැරීමේදී සිහියෙන් යුක්ත වීම. මෙම උපදේශය ගිහියන්ටද අදාළය. ගිහියෝ පාත්‍ර සිවුරු නොදැරුවත් ඔවුන්ගේ ඇඳුම් පැළඳුම්, ආහාර පාන ආදිය සම්බන්ධයෙන් මෙම ඉගැන්වීම ඉතා වැදගත් වෙයි.

5. **අසිතේ පීතේ ඛායිතේ සායිතේ සම්පජානකාරී හෝති**

කෑම බීම ගැනීමේදී මනා සිහියෙන් යුක්ත වීම.

මෙම ඉගැන්වීම වත්මන් සමාජයට ඉතා වැදගත්ය. ඊට හේතුව වන්නේ බොහෝ දෙනකු කෑම ගැනීමේදී සිහි නුවණින් යුක්ත නොවීම හේතුවෙන් විවිධ ප්‍රශ්නවලට මුහුණ දීමට සිදුවෙයි. විශේෂයෙන් මාළු කටු හිරවීම, පිඟානට වැටෙන කෘමි සතුන් පවා බත් සමග මුසුකර කෑම ආදිය සිදුවෙයි. මෙවැනි නිදසුන්වලින් පැහැදිලි වන්නේ මනා සිහි නුවණින් යුක්ත නොවීමේ ආදීනවයි.

6. **උච්ජාර පස්සාව කම්මේ සම්පජානකාරී හෝති**

වැසිකිළි කැසිකිළි යාමේදී මනා සිහියෙන් යුක්ත විය යුතුය.

7. **ගතේ ඨිතේ නිසින්නේ සයිතේ ජාගරිතේ භාසිතේ තුණ්හී භාවේ සම්පජානකාරී හෝති**


ඇවිදින විට, සිටගෙන සිටින විට, ඉඳගෙන සිටින විට, නිදාගෙන සිටින විට, කතා කරන විට, නිශ්ශබ්දව සිටින විට යන මේ සෑම අවස්ථාවකම සිහිය පිහිටුවා ගත යුතුය.

අද පවුල් ආරවුල් ඇතිවීමටද බොහෝ අවස්ථාවලදී අසිහිය බලපායි. ගෘහණිය කෑම පිසින අවස්ථාවලදී පවා රූපවාහිනිය නරඹමින්, අන්තර්ජාලයේ සැරිසරමින් ආහාර පිසියි. එම අවස්ථාවලදී සමහරවිට පිසින ව්‍යංජනයට දෙවරක් හෝ තෙවරක් ලුණු දමයි.

සමහර අවස්ථාවල තේ කෝප්පයට සීනි වෙනුවට ලුණු දිය කරයි. එසේ වූ විට සැමියයි, බිරිඳයි අතර ගැටුම් ඇතිවෙයි. එවැනි කුඩා දෙයකින් ඇරඹුණු ගැටුම් අවසානයේදී කෙළවර වන්නේ උසාවියෙනි. මෙවැනි උදාහරණවලින් පැහැදිලි වන්නේ සතිය හෙවත් සිහිය පිහිටුවා ගැනීමේ අගය නොවේද?

**පූජ්‍ය කැලණියේ ශාසනවංශ හිමි**

"පව් කරන්නා මෙලොවත් ශෝක කරයි. පරලොවත් ශෝක කරයි. දෙලොවම ශෝක කරයි."



# සඟමිත් තෙරණිය ගැන බොහෝ දෙනෙක් නොදැන සිටි කතාවක්

උඳුවප් පුර පසළොස්වක පොහෝ දින සිහිකරන වැදගත්ම සිදුවීම නම් දෙවන පෑතිස් රජු කළ (ක්‍රි.පූ. 250-210) පෑතිස් රජුගේ ආරාධනාවෙන් අශෝක රජු තම දූ වූ සංඝමිත්‍රා තෙරණිය ජය ශ්‍රී මහා බෝධි ශාඛාව සමග ලංකාවට වැඩම කොට මෙහෙණි සස්න පිහිටුවීමයි.

මහාවංශය 15 වන පරිච්ඡේදයේ 59-160 ගාථා අනුව මේ භද්‍ර කල්පයෙහි පහළ වූ තුන් බුදුවරුන් තමන්ට පිට දුන් බෝධි ශාඛා අනුරාධපුර මහමෙවුනා උයනේ පිහිටුවා ඇත.

කකුසඳ බුදු හිමි "ඕජදීප" නම් වූ ලංකාවට මහරි බෝ රුක් ශාඛාව රූපනන්දා තෙරණිය අත එවා ඇත.

කෝණාගම බුදු හිමි කල "වරදීප" නම් වූ ලංකාවට කණකදත්තා නම් තෙරණිය උදුම්බර බෝ ශාඛාව ගෙනාවාය.

කාශ්‍යප බුදු හිමි කල "මණ්ඩදීප" නම් වූ ලංකාවට සුධර්මා තෙරණිය නීග්‍රෝධ බෝ ශාඛාව වැඩමවා ඇත.

දඹදිව මෞර්ය පරපුරේ අශෝක රජුට සමකාලීනව ලංකාවේ රජ කළේ පෑතිස් රජුය. එකල මිහිඳු හිමි ලංකාවට වැඩ සංඝ ශාසනය ඇති කරන විට රජ මැදුරේ සිටි අනුලා බිසව ඇතුළු ඇගේ පිරිවර පන්සීයට පැවිදි වීමට අවශ්‍ය සුදු රෙදි හැඳ උපාසිකා රාම නම් විහාරයේ කල් ගෙවා ඇත. අනුලා බිසවගේ ඉල්ලීම ඉටු කිරීමට පෑතිස් රජු අරිට්ඨ ඇමැති දූතයකු ලෙස අශෝක රජු වෙත යවා ඇත. ඒ මිහිඳු හිමිගේ උපදෙස් පිට සංඝමිත්‍රා තෙරණිය ලංකාවට වැඩමවීමටය.

අශෝක රජුට දාව දේවී බිසව ලද දියණිය සංඝමිත්‍රාය. ඈ මුල් කල අග්ගිදත්ත කුමරුට පාවා දී ඇත. අග්ගිදත්ත කුමරුට දාව ඇය ලද පුතා පසු කළ පැවිදිව ලංකාවට වැඩි සුමන සාමණේරයි. මහාවංශයේ 18-19 විශ්ව පරිච්ඡේදවල මුළු ගාථා 246, සංඝමිත්‍රා තෙරණියගේ ලංකාගමනයට වෙන්කර ඇත. රීස් ඩේවිස්ගේ "බෞද්ධ ඉන්දියාව" ග්‍රන්ථය අනුව සාංචි තොරණේ කැටයම් දෙකක ජය ශ්‍රී මහා බෝධි ශාඛාව රැගෙන ඇය ලංකාවට වැඩම කළ අයුරු කැටයම් කර ඇත. තාම්‍රලිප්ති තොටුපොළේ සිට ලංකාවේ දඹකොළ පටුනට නැව යාත්‍රා කිරීමට දින හතක් ගතවී තිබේ. ඇය ජය ශ්‍රී මහා බෝධියෙන් අධිෂ්ඨාන බලයෙන් කැපී වෙන්වූ ජය ශ්‍රී මහා බෝධි දකුණු ශාඛාව කටාරමක බහා ලංකාවට රැගෙන ආවාය. මුහුදේ බෝධිය වැඩම වන විට සිදුවූ හාස්කම් "සිංහල බෝධි වංශය" විස්තර කරයි.


දඹකොළ පටුනට පැමිණි බෝධි ශාඛාව රැගත් තෙරණිය කර දක්වා මුහුදට බැස මහත් ගෞරවයෙන් පෑතිස් රජු භාර ගත්තේය. දඹකොළ පටුන පටන් අනුරාධපුරය දක්වා මාර්ගය අලංකාර ලෙස රාජ අණෙන් සරසා තිබේ. ඇය සමග දහඅට කුලයක ශිල්පි ශ්‍රේණි ලංකාවට පැමිණි බැව් මහාවංශය කියයි. මහාවංශයේම පසු තොරතුරුවල මේ ශිල්පි ශ්‍රේණි ප්‍රමාණය 16 ලෙසද විස්තර කරයි.

ඈ සමග පරිවාර මෙහෙණිවරු ඇතුළු දොළොස් නමක් පැමිණ ඇත. දීපවංශය අනුව උත්තරා, පබ්බතා, මල්ලා, ධම්මදාසී ඒ දොළොස් නමගෙන් කීපනමකි.

කෝට්ටේ කල ශ්‍රී රාහුල හිමි ලියූ "කාව්‍යශේඛරය" අනුව ඇය සමග පැමිණි සුමනා තෙරණිය සිවුරු හරවා බෝධිගුප්ත කුමරුට විවාහ කර දී ඇත.

අනුරාධපුර මහමෙවුනාවට වැඩි ජය ශ්‍රී මහා බෝධි ශාඛාව මහත් උත්සවශ්‍රීයෙන් මහමෙවුනා උයනේ රෝපණය කළ අයුරුද මහාවංශය හා බෝධිවංශය විස්තර කර තිබේ. මෙම

"අනුන්ගේ රළු පරළු කතාත් අනුන් කළ නොකළ දේත් නොසෙවිය යුතුය. තමාගේම කළ නොකළ දේ සෙවිය යුතුය."



බෝධි රෝපණ උත්සවයට තිවක්කගම තිවක්ක බමුණා, කතරගම ක්ෂත්‍රිය රජු, චන්දනගම ක්ෂත්‍රිය රජු පැමිණීමෙන් පෙනෙනුයේ ඒ ප්‍රාන්ත පාලකයන් පෑතිස් රජුගේ ආධිපත්‍යය පිළිගත් බවයි. ඒ අනුව බෝධි රෝපණ උළෙල පෑතිස් රජුගේ දේශපාලන බල ව්‍යාප්තියක්ද සිදුකර ඇත.

ජය ශ්‍රී මහා බෝධි ශාඛාවෙන් මුලින්ම අංකුර අටක් පැන නැගි අතර ඒවා පිහිටු වූ තැන් වංශකතා විස්තර කරයි. ඉන්පසුව මතුවූ අංකුර 32 පිහිටු වූ තැන් ''සිංහල බෝධි වංශය'' විස්තර කරයි. ඒවා පිහිටු වූ ස්ථාන ලංකාව පුරා විසිර තිබුණි.

පෑතිස් රජු සංඝමිත්‍රා ඇතුළු තෙරණීන්ට චුලංගන, මහංගන, සිරිවඩ්ඪ ඇතුළු මෙහෙණි ආරාම දොළහක් කරවා පිදුවේය. මේ මෙහෙණි ආරාම දොළහම අනුරාධපුර යුගය පුරා අභයගිරිය, ජේතවනය යන මහායාන නිකායවලට නොබැඳී මහා විහාරයේ පිරිසිදු ථෙරවාදී භික්ෂුණී පරපුරම දිගටම රැඳී සිටි බව මහාවංශය කියයි.

සංඝමිත්‍රා තෙරණිය වැඩි නැව සමග රැගෙන ආ නැවේ කුඹ ගස හා නැවේ යොත ඒ මෙහෙණි ආරාම අසලම කටු ගෙයක් තනවා ප්‍රදර්ශනයට තබා ඇත. මේ අනුව ලංකාවේ කටු ගෙයක් ගැන කියැවෙන පළමු වංශකතා සටහන මෙයයි.

නගරයට කිට්ටුව පිහිටි වාසය කළ මෙහෙණිවරු ප්‍රිය නොකළහ. භාවනාව සඳහා නිස්කලංක පරිසරයක් ඔවුහු අගය කළහ. මේ අනුව පෑතිස් රජු රජුගේ මඟුල් ඇතා ගැවසුණු බිමේ ''හත්ථාලවක'' නමින් අලුත් මෙහෙණි අසපුවක් මේ භික්ෂුණීන් සඳහා කරවා පිදුවේය.

රාජ කුමාරිකාවන්, බිසෝවරුන්, පුරෝහිත බමුණු දියණියන්, ධනවත් වෙළෙඳ දියණියන් මෙන්ම උගත් කුල කතුන් පෑතිස් රජ කළම රටපුරා මෙහෙණි සස්නේ පැවිදිව රහත් බව ලැබූහ.

බී. සී. ලෝ මහතා අනුව දීපවංශය යනු මෙහෙණින් ලියූ පාලි වංශ කතාවකි.

පෑතිස් රජු භික්ෂූන් හා භික්ෂුණීන්ගේ දානය උදෙසා මහා පාලි දාන ශාලාව කරවා ඇත. දෙපිරිසටම ඉන් දානය සැපයුණේය.

ලංකාවට වැඩි සංඝමිත්‍රා තෙරණිය ඇතුළු පිරිස ආපසු දඹදිව වැඩියේ නැත. ඔවුහු ලංකාවේම ජීවත් වූහ. පෑතිස් රජු මියගිය පසු උත්තිය රජු රජ විය.

පේරාදෙණිය විශ්වවිද්‍යාලය පල කළ ''ලංකා ඉතිහාසය'' ග්‍රන්ථය උත්තිය රජුගේ රාජ්‍ය කාලය අපැහැදිලි නිසා නොදක්වයි. කොඩ්රින්ටන් ලියූ ''ලංකා ඉතිහාසය'' ග්‍රන්ථය අනුව උත්තිය රජු රජ කළේ (ක්‍රි.පූ. 267-257) අතරයි.

උත්තිය රජුගේ රාජ්‍ය කාලය තුළ මුලින්ම මිහිඳු හිමි අපවත් වූහ. රජු මහත් ගෞරවයෙන් මිහිඳු හිමිගේ ආදාහනය සිදුකර ඇත.

උත්තිය රජුගේ අටවැන්නේ හෙවත් ක්‍රි.පූ. 255 පමණ පැවිදිව, රහත්ව 59 වැනි අවුරුද්දක් ජීවත් වූ සංඝමිත්‍රා තෙරණිය අපවත් වූවාය. රජු මහත් ගෞරවයෙන් සංඝමිත්‍රා තෙරණියගේ දේහය ආදාහනය කොට, ධාතු නිදන් කොට දාගැබ් කරවා ඇත. සංඝමිත්‍රා තෙරණියගේ ගිහි කළ පුතා වූ බුද්ධධාතු පුරවා ගත් පාත්‍රා ධාතුව ලංකාවට වැඩම කළ සුමන සාමණේර හිමි තවත් දිගු කලක් ලංකාවේම වැඩ වාසය කොට අපවත් වී ඇත්තාහ.

**එස්. කේ. ජයවර්ධන**

''මෝඩයා මට දරුවෝ ඇත. මට ධනය ඇත කියා සිතමින් උද්දම වෙයි. තමාට තමනුත් නැති කල කුමන දරුවෝද? කුමන ධනයද?''

# කුසල් අනුමෝදන් කළ හැකිද?



බෞද්ධ විමුක්ති මාර්ගය සදාචාරාත්මක පදනමක් මත මෙහෙයවූවකි. එහිලා හොඳ-නරක, පුඤ්ඤ-පාප, කුසල-අකුසල, සාවජ්ජ-අනවජ්ජ, සම්මා-මිච්ඡා ආදී ප්‍රභේද ගත කිරීම් බාහුල්‍යයෙන් හමුවෙයි. ඒ වනාහී බුදු දහමෙහි ඇති ආචාර විද්‍යාත්මක අගය පිළිබිඹු කරන්නකි. නමුත් මෙකී සදාචාර ධර්මයන්හි එකිනෙකට පරස්පර වූද, වෙනස් වූද විශේෂතාවන් පවතී. එකී විෂමතාවන් නිවැරදිව විග්‍රහ කර නොගැනීම නිසා බෞද්ධයා දුර්මතයන්හි එල්බගෙන ඇති වගක් වත්මන් සමාජ මතය පිරික්සීමෙන් පෙනී යයි.

කුසලය හා පින පිළිබඳව මනා අර්ථ විග්‍රහයක් සම්බුද්ධ දේශනාවට අනුකූලව සිදුකිරීම අතිශයින් වැදගත්ය. එනම් පින හා කුසලය පිළිබඳව බෞද්ධ මතය ඇතැම් විට විවාදයට භාජනය වන සුළුය. නමුත් එය එතරම් යහපත් දෙයක් නොවේ. ඇතැමෙක් පින් සිදු කොට පමණක් නිවන් අවබෝධ කරගැනීමට අපේක්ෂා කරති. නමුත් පින යනු හුදෙක් ලෞකිකත්වය පදනම් කර ගත්තකි. පින් කිරීම තුළින් ලෞකික පුණ්‍ය විපාක ලද හැකිය.

"ඉධ නන්දති පෙච්ච නන්දති - කත පුඤ්ඤෝ උභයත්ථ නන්දති
පුඤ්ඤං මේ කතන්ති නන්දති - භියෙ‍යා නන්දති සුග්ගතිං ගතෝ"

යනුවෙන් පින් කළවුන් මෙලොවත්, පරලොවත් සතුටු වන බවත් සුගතිගාමී වී බොහෝ සෙයින් සතුටු වෙති, යනුවෙන් බුද්ධ දේශනාව පිනෙහි ඇති ලෞකික ස්වභාවය පිළිබඳව පැහැදිලි කර ඇත.

දස පුණ්‍ය ක්‍රියාවන්හි පත්ති දාන යනුවෙන් පින් කිරීමත්, පත්තානුමෝදනා යනුවෙන් පින් අනුමෝදන් කිරීමත් පින් කිරියවත් ලෙස දක්වා ඇත. එනම් එක් පුද්ගලයෙක් සිදුකර ගන්නා පින තවත් කෙනකුට අනුමෝදන් විය හැකිය. අනුමෝදනා යනු අනුව සතුටු වීමයි. එනම් අපට තවකෙක් සිදුකරන පින්කමක් දැක සාධුකාර දී සතුටු සිත් ඇතිකර ගත හැකි නම් අපටද එම පුණ්‍ය විපාක සලසා ගත හැකිය. පින ලෞකික වශයෙන් පරිපූර්ණ සැපවත් ජීවිතයක් ගත කිරීමට අත්‍යවශ්‍යය. එම නිසා ධර්මය තුළ නිතර නිතර පින් සිදුකිරීම වැදගත් බව පෙන්වා දී ඇත. (පුඤ්ඤං චේ පුරිසො කයිරා කයිරා කයිරා තේ තං පුනප්පුනං - තම්හි ඡන්දං කයිරාථ සුඛො පුඤ්ඤස්ස උච්චයො) පින් සිදුකිරීම තුළින් පුද්ගලයා සැපයෙන් උච්ඡ භාවයට පත් කරලයි. නමුත් එකී ස්වභාවය තාවකාලිකය. පුණ්‍ය විපාක යනු විපාක දීමත් සමග ක්ෂය වන දෙයකි. එසේ සිදු වන්නේ පින ලෞකිකත්වය පදනම් කොටගෙන පවතින නිසාවෙනි.

නමුත් කුසලය යනු ඊට හාත්පසින්ම වෙනස් වූ ස්වභාවයකි. කුසල යන වචනයෙහි අර්ථය විග්‍රහ කර බැලීමේදී සමත් බව, දක්ෂ බව, හැකියාව යනාදී අර්ථ මතු කර ගත හැකිය. මෙකී දක්ෂකම හෙවත් හැකියාව තම තමන් විසින් ආත්මීය වශයෙන් ඇතිකර ගත යුත්තක් මිස තවකෙකුට ලබාදිය හැක්කක් නොවේ. නිදසුනක් ලෙස ගත් විට, සිල් සමාදන් වී, පිළිවෙත් පුරමින් නිවන් අවබෝධය සඳහා වූ හැකියාවන් ප්‍රගුණ කරන පුද්ගලයකු දැක සාධුකාර දීම තුළින් එම පුද්ගලයා දියුණු කරන හැකියාවන් ලබාගත නොහැකිය. එනම් එය හුදු ලෞකිකත්වය පදනම් කර ගත්තක් නොවන නිසාවෙනි.

පින පැවැත්ම උදෙසා පවතින්නක වන අතර කුසලය නැවැත්මක් උදෙසා පෞද්ගලික වශයෙන් දියුණු කළ යුත්තකි. ඒ අනුව නිවන අරමුණු කොටගෙන පුද්ගලයා තුළ දියුණු කළ යුතු ශක්‍යතාවන් සමූහය කුසල් නම් වෙති. පින් සිදු කොට පුණ්‍යානුමෝදනා කළ හැකි වුවද කුසලය එසේ අනුමෝදන් කළ හැකි ලෞකික ස්වභාවයක් නොවන වග පැහැදිලිය. ඒ නිසා කුසල් අනුමෝදන් කිරීම යන පාඨය පවා ප්‍රකාශ කිරීම ප්‍රඥාගෝචර නොවේ. එහෙයින් ලෞකික සුවය පතා පින් සිදු කළ යුතු වන්නා සේම ආධ්‍යාත්මික විමුක්තිය අරමුණු කොටගෙන තම තමා තුළ කුසල් දියුණු කිරීමට සුදීඝු උත්සාහ දරත්වා.

පූජ්‍ය ඕපනායක ධීරානන්ද හිමි

"යමක් කොට පසුතැවෙන්නට වේද යමක විපාකය කඳුළු පිරි මුහුණෙන් යුක්තව හඬමින් විඳින්නට සිදුවේ."



# බුදුන් වහන්සේට පවා විපාක දුන් කර්ම විපාක

යම් පුද්ගලයෙකු කරනු ලබන හොඳ හෝ නරක ක්‍රියාව කර්මය නම් වේ. එසේම සිතා මතා කරන ඕනෑම කායික, වාචසික, මානසික ක්‍රියාවන් කර්මය ලෙස සඳහන් කළ හැකිය. එසේම සියළු කුසල් හා අකුසල් ක්‍රියා කර්ම වේ. එම කර්මයන්හි ප්‍රතිඵලය විපාකයි. හැම වස්තුවකට සෙවනැල්ලක් ඇති පරිදිම, හැම සචේතනික ක්‍රියාවකටම විපාකයක් ද ඇත. කර්මය පැළවෙන්නට ශක්තිය ඇති බීජයක් වැනිය. විපාකය ගසක ඵලය වැනිය.

බෝධි සම්භාර පුරණ පෙර ආත්මවල දී කරන ලද අකුසල කර්මයන් පිළිබඳව පුබ්බ කම්ම පිලෝතික ආපදානයේ බුදුන් වහන්සේ විසින්ම තමන්ට විපාක දුන් කර්මයන් මෙසේ විස්තර කරන ලදී.

1. බුදුන් වහන්සේට සය අවුරුද්දක් දුෂ්කර ක්‍රියා කරන්නට හේතු වූ අකුසල කර්මය නම් : කාශ්‍යප බුදුන් කල ජෝතිපාල නම් මානවක ලෙස ඉපිද සිටි කාලයෙහි, කාශ්‍යප බුදු රදුන් දැක, "මේ මුඩු ශ්‍රමණයාට බුදු බව කොයින් ද? එය පරම දුර්ලභ එකකැ"යි යනාදී වශයෙන් අපහාස කළ පවින් සය අවුරුද්දක් දුෂ්කර ක්‍රියා කිරීමට සිදු විය.

2. චිංචිමානවිකාවගෙන් බුදුන් වහන්සේට බොරු චෝදනා ලැබීමට හේතු වූ අකුසල කර්මය නම් : අප බුදුරජාණන් වහන්සේ නන්ද නමින් මහණව සිටියදී, සබ්බාභූ නම් බුදු රදුන්ට "මේ ශ්‍රමණයා දුස්සීලයෙකි, පවිටු අදහස් ඇත්තෙකි'යි යනාදී වශයෙන් කළ අපහාස නිසා, නිරයේ බොහෝ දුක් විඳ, පසුව මිනිසත් බව ලැබ, බුදු වූ ආත්ම භවයේ දී චිංචිමානවිකාවගෙන් අභූත චෝදනා අසන්නට සිදු විය.

3. බුදුරජාණන් වහන්සේට සුන්දරී නම් පරිබ්‍රාජිකාවගෙන් චෝදනා ලැබෙන්නට හේතු වූ අකුසල කර්මය නම් : අප බෝධිසත්වයන් වහන්සේ ආත්ම ගණනකට පෙර මොනාලි නම් සුරා සූදුවෙකුව ඉපිද, පාප මිත්‍ර සේවණය නිසා සරභූ නම් පසේ බුදුරදුන් දැක "මේ භික්ෂුව දුස්සීලයෙකි. පවිටු අදහස් ඇත්තෙකි." යනාදී වචන කියමින් බැණ වැදුන පවින් සුන්දරී නම් පරිබ්‍රාජිකාව ගෙන් ද, අන්‍ය තීර්ථකයන්ගෙන් ද නොයෙක් විදියේ ආක්‍රෝශ පරිභව අසන්නට ලැබිණ.

4. සුන්දරී නම් පරිබ්‍රාජිකාව මරණ ලදැයි බුදුන් වහන්සේ ඇතුළු අනික් භික්ෂූන්ට චෝදනා ලැබීමට හේතු වූ අකුසල කර්මය නම් : භීමසේන නම් ඍෂිවරයෙක් ළඟ අප බෝධිසත්වයන් වහන්සේ බ්‍රාහ්මණ කුලයක ඉපිද තාපසයෙක්ව පන්සීයක් මානවකයන් හට වේදය උගන්වමින් හිමවත පවුවෙහි වාසය කළහ. අප බෝසත් මානවක තෙමේ, අෂ්ටසමාපත්ති ලාභී වූ තාපසයා දැක

"දෙවූ වහාම කිරි නොමිදෙන්නාක් මෙන් කෙනෙකු විසින් කරන ලද පව වහා නොමෝරයි. එය අළු යට වූ ගිනි පුපුරක් මෙන් ඔහු දවමින් පසුපස ලුහු බඳී."

ඊර්ෂ්‍යාවෙන් කුපිතව මොහු කාමභෝගී නරක කෙනෙක් බවත්, ඔහුට පිණ්ඩපාතය නොදෙන ලෙසත් කීවේය. සිය අතවැසියන් එබස් අසා සමාපත්ති ලාභී තාපසයාට බැන වැදුනහ. ඒ කළ අකුසල කර්මයේ විපාකයෙන් බුදුන් වහන්සේ ඇතුළු අනෙකුත් භික්ෂූන් වහන්සේලාට සුන්දරිය මැරුවේ යැයි නින්දා අපහාස විඳින්නට සිදු විය.

5. බුදුන් වහන්සේට දෙව්දත් තෙර ගල් පෙරළීමට කළ අකුසල කර්මය නම් : පෙර ආත්මයක එක පියෙකුට දාව, මව්වරු දෙදෙනෙකුට පුතුන් දෙදෙනෙක් ඉපදුනේය. මෙහි එක් සහෝදරයෙක් අප බුදුන් වහන්සේය. පියාගේ ඇවෑමෙන් ඔවුහු ධනය නිසා විරුද්ධ විය. බෝධි සත්ව තෙමේ ධන තණ්හාවෙන් තම කනිටු සොහොයුරා බලයෙන් ගිරි දුර්ගයකට ගෙන ගොස් පහළට තල්ලු කර, ඔහුගේ මතට ගලක් පෙරලා මරණයට පත් කළේය. එහි ලද විපාක වශයෙන් අප බුදුරජාණන් වහන්සේට දෙව්දත් තෙර ගල් පෙරළීමෙන් ගල් පතුරක් ගැලවී මහපට ඇඟිල්ල තැලී ගියේය.


6. බුදුන් වහන්සේට විපාක දුන් අනික් අකුසල කර්මය නම් ගල් පතුරක් වැදී බුදුන් වහන්සේගේ පාදයෙහි ලේ සෙලවීමයි. හේතුව නම් : පෙර ආත්මයේ එක් කුල ගෙයක කුඩා දරුවකු සිටින අතර තුර මග අසල සෙල්ලම් කරන විට පිඬුසිඟා වඩින පසේ බුදුන් වහන්සේ කෙනෙක් දැක, "මේ මුඩු ශ්‍රමණයා කොහි යන්නේ"දැයි කියමින් ගලක් ගෙන උන්වහන්සේගේ පාද වලට වදින සේ ගැසීය. එම ගල වැදී පසේ බුදුන් වහන්සේගේ පාදයෙන් ලේ ගැලීය. එහි අකුසල විපාකය වශයෙන් දෙව්දත් තෙරුන් පෙරළු ගලේ පතුරක් ගැලවී ඇවිත් බුදුන්ගේ පාදයෙහි වැදී ලේ සෙලවීමක් ඇති විය.

7. දෙව්දත් තෙරුන් බුදුන් වහන්සේට නාලාගිරි ඇතු මෙහෙයවීමට හේතු වූ අකුසල කර්මය නම් : පෙර ආත්ම භවයක අප බෝසතාණන් ඇත්ගොව් කුලයක උපන්නේය. මෙම බෝසතාණෝ ඇත් ගොව්වෙකු වී ඇතු පිට නැගී යන විට මහමග පසේ බුදුරදුන් දැක, ඇතාට පහර දී කුපිත කර පසේ බුදුන් වෙත මෙහෙයවා ගස්වන ලද පවින්, බීමත් වූ නාලාගිරි ඇතා අප බුදුන් දෙසට පැමිණ කරදර කළේය.

8. අප බුදුන් වහන්සේ නිතර හිස රදයකින් පෙළෙන්නට හේතු වූ අකුසලය නම් : බුදුන් වහන්සේ පෙර බෝධිසත්ව කාලයේ දී මසුන් මරණ තැනැත්තෙකුගේ පුතෙකුව උපන්නේය. අප බෝසතාණෝ මසුන් මරණ තැනට ගොස් මසුන් ගොඩට දමා සිටින විට උන් දඟලන ආකාරය දැක සතුටු විය. එහි විපාකයක් වශයෙන් අප බුදුන් වහන්සේට නිතර නිතර හිස රුදාව ඇති විය.

9. අප බුදුන් වහන්සේ වේරඤ්ජාවේ දී වස් වසන්නට ගොස් තුන් මාසයක් යව හාල් වළදන්නට හේතු වූ අකුසල කර්මය නම් : අප බෝසතාණෝ වේරඤ්ජරා ගමේ බමුණෙක්ව ඉපිද, එකල බුදුව සිටි ඵුස්ස නම් බුදු හිමි ඇතුළු ශ්‍රාවක පිරිස මධුර සුවඳහැල් හාල් බත් වළදනවා දැක යවහාල් බත් දෙන්නැයි අපහාස කළේය. එහි විපාක වශයෙන් බුදුන් වහන්සේ ඇතුළු භික්ෂූන්ට තුන් මාසයක් යවහාල් වළඳන්නට සිදු විය.

10. බුදුන් වහන්සේට සුව නොවන කොන්දේ අමාරුවක් තිබීමට හේතුව නම් : අප බුදුන් වහන්සේ පෙර ආත්ම කාලයක මල්ලව පොර ශූරයෙක්ව උපන්නේය. මොහු අන්අයට වඩා මිටි වුවත් මල්ලව පොර ඇල්ලීමට දක්ෂයෙක් විය. දිනක් මල්ලව පොර ක්‍රීඩාවේ යෙදී සිටින අතර තුර දී ප්‍රතිවාදියා පොර බදා ඔහුගේ කොඳු නාරටිය කඩා දැමීය. එහි විපාකයක් වශයෙන් බුදුන් වහන්සේ ධර්මය දේශනා කරන විට කොන්දේ අමාරුවක් සැදී බොහෝ පීඩා වින්දේය.



11. බුදුන් වහන්සේට ලේ අතීසාර සෑදීමට හේතු වූ අකුසල කර්මය නම් : පෙර අප බෝධිසත්වයන් වහන්සේ දක්ෂ වෛද්‍යවරයෙක්ව උපන්නේය. ධනලෝභී සිටුවරයෙකුගේ පුතෙකුට රෝගී වී ඔහුට පිළියම් කළ පසු රෝගය සුව වුවත් වෛද්‍යවරයාගේ පොරොන්දු ඉටු නොවූ හෙයින් වෙනත් බෙහෙතක් දී අනවශ්‍ය ලෙස බඩ විරේක කරවීමේ පාපයෙන් බුදුන් වහන්සේගේ ලෝහිත පක්ඛන්දිකා නම් ලේ අතීසාරය රෝගය සෑදී පිරිනිවන් පෑමට ද හේතු විය.


මේ අනුව බලන විට සියළු කෙලෙසුන් නසා නැවත උපතක් නොලබන බුදු බව ලබාගත් බුදුන් වහන්සේ කෙනෙකුට පෙර ආත්ම භවවල දී කළ අකුසල කර්මයන් ඵලවිපාක දුන්නේ නම් පෘථග්ජන අප හට කෙසේ කර්ම ඵලවිපාක ඵල නොදේදැයි නුවණින් සලකා කුසල කර්මයන්හි යෙදීම යහපත් වන්නේය.

**ශාස්ත්‍රවේදී පූජ්‍ය තිබ්බටුවාවේ සිද්ධත්ථ හිමි**



# සසර කතරින් එතෙරව නිවන් දැකීමට නම් සමාධිය වැඩිය යුතුමය

ධර්ම දේශනය



දේශකයාණෝ - මහනුවර හයගිරි විජයසුන්දරාරාම විහාරද්වයාධිපති, ඓතිහාසික බදුලු මුතියංගණ රාජමහා විහාරාධිපති, ශ්‍රී දළදා මාලිගාවේ තේවාවහාර, අතිගෞරවාර්හ වරකාගොඩ ධම්මසිද්ධි ශ්‍රී පඤ්ඤානන්ද ඤාණරතනාභිධාන මහාවිහාරවංශික ස්‍යාමෝපාලි මහානිකායේ අස්ගිරි මහාවිහාර පාර්ශවයේ මහානායක මාහිමිපාණන් වහන්සේ

"සමාධිං භික්ඛවෙ, භාවෙථ. සමාහිතො භික්ඛවෙ, භික්ඛු යථාභූතං පජානාති. කිඤ්ච යථාභූතං පජානාති: ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති. අයං දුක්ඛසමුදයොති යථාභූතං පජානාති. අයං දුක්ඛනිරොධොති යථාභූතං පජානාති. අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති යථාභූතං පජානාති. සමාධිං භික්ඛවෙ භාවෙථ, සමාහිතො භික්ඛවෙ, භික්ඛු යථාභූතං පජානාති."

පින්වත්නි,

සච්චසංයුක්තයේ සමාධි සූත්‍රයට අනුව, සැවැත් නුවර දෙව්රම් වෙහෙරෙහි වැඩ විසූ බුදුරජාණන් වහන්සේ, භික්ෂූන් අමතා, මහණෙනි, සමාධිය වඩව්, එකඟ සිත් ඇති මහණ තෙමේ මේ දුකය, මේ දුක් හටගැන්මය, මේ දුක් වැළැක්මය, මේ දුක් වැළැක්මට පමුණුවන පිළිවෙතය යන සතර තතු සේ දැන ගනී. එහෙයින් දුක, දුක හටගැන්ම, දුක වැළැක්ම, දුක වැළැක්වීමේ පිළිවෙත යන මෙහිලා වීයඞ් කටයුතුයි.

සමාධිය නම් කුසල් සිත් පිළිබඳ ඒකාග්‍රතාවයි. චෛතසිකයන් ඔබ මොබ විසිර යෑමට ඉඩ නොදී නා නා ලම්භනයන්හි නො විසිරෙන බව සමාධියේ ඇති මූලික ලක්ෂණය වේ. සමාධිය, ලෞකික, ලෝකෝත්තර වශයෙන් දෙවැදෑරුම්ය. සුඛ සහගත සමාධි, උපේක්ඛා සහගත සමාධි

''සියල්ලෝ දඬුවමට තැති ගනිත්. සියල්ලෝ මරණයට බිය වෙත්. ඒ නිසා තමා උපමා කොට සිතා අනුන් නොනැසිය යුතුය. නොනැස්විය යුතුය.''

වශයෙන් ද දෙවැදෑරුම් වේ. සමාධිය වනාහි වැඩිය යුතු ධර්මතාවෙකි.

සුපරිශුද්ධ සීලයෙහි පිහිටා ආවාස, කුල (ඥාති හෝ උපස්ථායක කුල), ලාභ (සිවුපසය), ගණ (සූත්‍ර අභිධර්ම හදාරන ගණ), නව කර්ම (නව කර්මාන්ත), අද්ධාන (යම් තැනක යාමෙහි අපේක්ෂාව), ඥාති (මවුපිය, සහෝදර, ආචාර්ය, උපාධ්‍යාය), ආබාධ (රෝග), ග්‍රන්ථ (පර්යාප්ති හරණය - සජ්ඣායන, ධාරණ, පරිචය, පරිපුච්චාදී වශයෙන්), ඍද්ධි (පෘථග්ජන ඍද්ධිය) යන දසපළිබෝධ දුරු කොට කමටහන් ලබාදෙන කල්‍යාණ මිත්‍රයන් වහන්සේ නමක් කරා එළඹ කර්මස්ථානයක් ලබා ගෙන පළිබෝධ දුරු කොට සමාධිය වැඩිය යුතුයි.

සීලය සමාධියට ආධාර වේ. සමාධිය ප්‍රඥාවට ආධාර වේ. සමාධිය නැත්තෙකුට විදර්ශනාමය ප්‍රඥාවක් ලද නොහැකිය. සමාධිය දාන, සීල, භාවනා යන ත්‍රිශික්ෂාවට අයත්ය. දුස්සීලයෙකු කෙරෙහි සමාධිය නො පිහිටයි. සප්ත බොජ්ඣංගයන් අතර සමාධි සම්බොජ්ඣංග වශයෙන් ද, ආර්යඅෂ්ටාංග අතර සමාධි නාමයෙන් ද දක්නා ලැබෙන සමාධිය පංච ඉන්ද්‍රියන් අතර සමාධි ඉන්ද්‍රිය ලෙස ද, පංච බල ධර්මන් අතර සමාධි බල වශයෙන් ද සැලකේ. ආර්යඅෂ්ටාංගික මාර්ගය අතර සීල, සමාධි, ප්‍රඥා යන ත්‍රිශික්ෂාවෙහි ඇතුළත් වේ. සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව සීලයෙහි ද, සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි යන තුන සමාධියෙහි ද, සම්මා දිට්ඨි, සම්මා සංකප්ප ප්‍රඥාවෙහි ද ඇතුළත් වේ. ආර්ය අෂ්ටාංගික මාර්ගයෙහි එන සමාධිය නිවනට ද හේතුවේ.

සමාධිය නැති පුද්ගලයාගේ සිත ක්ෂණයක් පාසා නොයෙක් අරමුණුවල විසිර යයි. සමාධිමත් පුද්ගලයාගේ චිත්ත චෛතසිකයන් නා නා අරමුණු වලට දිව නොයයි. මෙසේ නො විසිරෙන ස්වභාවය සමාධියේ ඇති සාමාන්‍ය ලක්ෂණයයි. සමාධියෙන් කෙරෙන්නේ සිතේ විසිර යාම විධ්වංසනය කිරීමයි. චිත්ත චෛතසිකයන්ගේ නොසැලීමයි. එය සමාධියේ ඵලයයි.

පස්කම් සුවයෙන් ඈත් වී නිරාමිෂ ප්‍රීතිය ඇති කර ගැනීම සමාධියට හේතු වේ. සමාධිය පුරුදු කළ පුද්ගලයාට නිරාමිෂ ප්‍රීතිය ද ඇති වේ. සමාධියෙහි මූලික අරමුණ  චෛතසිකයන් එක් කුසලාරම්භනයක හසුරුවා ගැනීමයි. සමාධිය ඉබේටම ලැබෙන්නේ නැත. සිතේ ස්වභාවය පාපයට ඇදී යාම නිසා, ධර්මාවබෝධය ලබා ගෙනම කෙලෙසුන්ගෙන් දුර්වල වූ සිත වැඩිය යුතුය. සමාධියෙන් අදහස් කරන්නේ සිත පිළිබඳ වැඩීමයි. ලෞකික සමාධිය හා ලෝකෝත්තර සමාධිය ඇති වන්නේ මෙසේ සිත වැඩීමෙනි. සමාධි, සමථ, චිත්ත යන භාවනා තුනෙන්ම චිත්ත විශුද්ධිය ඇති කෙරෙයි. මෙසේ සමාධිය ඇති කර ගැනීමෙන් විදර්ශනාවට ද, විදර්ශනාවෙන් සිතෙහි රාගය ප්‍රහීණ කොට නිවනට පත්වීමට ද හැකිවේ.

සමාධිය පදනම් කොට ගෙන පඤ්චාභිඤ්ඤා අෂ්ට සමාපත්ති ලැබිය හැකි අතර, සමාධියෙන් විදසුන් වඩා ලෝකෝත්තර සැපය උපදවා ගත හැකි වේ. සම්මා වායාම, සම්මා සිහිය හෙවත් සතිය සමාධියට අයත් ධර්ම දෙකකි. සමාධිය වැඩීමට නම් සම්මා වායාම හා සම්මා සති අවශ්‍යමය. සමාධි භාවනාවට තමන් තෝරා ගත් කමටහන සිහිනුවණින් බලා වැඩිය යුතු වේ. අසංවර වූ සිතකින් අරමුණු ඇති සැටියෙන් බැලිය නොහැකිය. සිතේ ඒකාග්‍රතාව ඇති කොට අරමුණු දෙස බැලීමෙන් සැබෑ අවබෝධය ඇති වේ. තමන් තෝරා ගත් කමටහන නිතර සිහි කරමින් එයට සිතින් බැහැරට යාමට ඉඩ නොදී රඳවාගෙන සිහි නුවණින් යුතුව බැලිය යුතුය. එවිට සිත කාම වස්තූන්ගෙන් ඉවත් වේ. භාවනාවෙන් ලබන ධ්‍යානයන්ගෙන් කුසලයට විරුද්ධ අකුසලයන් දුරු කරයි. කුසල් සිත වළක්වන අකුසල ධර්ම පහකි. එනම් කාමච්ඡන්ද, ව්‍යාපාද, ථීනමිද්ධ, උද්ධච්ච කුක්කුච්ච, විචිකිච්ඡා යන පංචනීවරණයි. මෙම නීවරණ යටපත් කොට ප්‍රහාණය කිරීමෙන් ධ්‍යානාදියෙහි සමාධි බලය වැඩේ.

බුද්ධ ශාසනය පවතින්නා වූ දුර්ලභ උතුම් අවස්ථාව ඉක්ම ගිය හොත් සසර දුකින් මිදීමට දුෂ්කර වේ. එබැවින් මගඵල පිණිස සමාධියෙහි සිත පිහිටවිය යුතුය. තම සිතෙහි කාමච්ඡන්දාදී නීවරණයන්ට උපදින්ට ඉඩ තබමින් කොපමණ උත්සාහ කළත් සිත මැනවින් සමාධි ගත කර නොහැකිය. නීවරණයන් ඇති වීමට අවකාශයක් නොතබාම උත්සාහය අත් නොහැරම දිගින් දිගටම සතිපට්ඨාන භාවනාවේ යෙදෙන්නාට මගඵල ලබා ගැනීම දුෂ්කර නොවේ. සතිපට්ඨාන භාවනාවෙහි මැනවින් යෙදෙන විට සිතෙහි කාමච්ඡන්දාදී නීවරණයන්ට බලවත් වීමට ඉඩක් නොලැබේ. එමඟින් සමාධියේ හා ප්‍රඥාවේ දියුණුව ඇති වන්නේය. යම් කෙනෙකුට අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යන ත්‍රිලක්ෂණය අවබෝධ කරගන්නට ඕනෑ නම් සමාධිය තුළින්ම එය කළ යුතුය යනුවෙන් සංයුක්ත නිකායෙහි දැක්වේ. ඒ නිසා නිවන් අවබෝධයට සමාධිය වැඩිය යුතුමය.

ජීවත්වන සෑම සත්වයෙකුටම මුහුණ දීමට ඇත්තේ දුක් ගොඩකටය. ඉපදුණ සත්වයාට රෝගාබාධයන් ආදී දුක් කන්දරාවකට මුහුණ දීමට සිදු වෙයි. අවසන මරණය නියතමය. දුකින් මිදීමට ඇති එකම උපාය මගඵල ලබා ගැනීමයි. ඒ සඳහා සමාධිය වැඩිය යුතුමය.

සංයුක්ත නිකායේ ජලවග්ගයේ සමාධි සූත්‍රයට අනුව සමාධි ගත වූ විට ඇස, කන, කය ආදියෙහි අනියත බව තතු සේ දන්නා බව පැහැදිලි වෙයි. එසේ සමාධිගත වූ තැනැත්තා අනියත බව තතු සේ දැන ගනී. සමාධිගත ශ්‍රාවකයා සුව වේදනාත්, දුක් වේදනාත්, නොදුක් නොසුව වේදනාත්, වේදනාවන්ගේ සමුදයත් දැන ගනියි. වේදනාව ක්ෂය වීමෙන් තෘෂ්ණාව බැහැර වේ. නිවනත් වේදනා නැසීමට මගත් දැන ගනී. සසර බැඳ තබන සියලු කෙලෙස් ප්‍රහීණ කොට අජරාමර නිවනට පත්වීමට නම් සීල, සමාධි, ප්‍රඥා වඩා ගත යුතුමය. තෙරුවන් සරණයි.

"යම් තැනක සිට පවේ විපාකයෙන් මිදිය හැකිද එබඳු තැනක් අහසෙහිත් නැත. මුහුද මැදත් නැත. පර්වත කුහරයකවත් නැත. එබඳු බිම් පෙදෙසක් ලොව කොහේවත් ඇත්තේ නැත."



# අත්හරින්නට බැරිද..?

## පූජ්‍ය රාජගිරියේ ආරියඥාන ස්වාමීන්ද්‍රයන් වහන්සේගෙන් අසා දැන ගමු

❒ ගෞරවණීය ස්වාමීන් වහන්ස, අනිත්‍ය සංඥා වඩන හැටි මුලින්ම කියලා දෙන්න. මොකද සාමාන්‍යයෙන් අපි අනිත්‍ය භාව කිව්වාම අපි ඉර නැගලා එනවා බැහැලා යනවා දකිනවා. නමුත් කිසිම කලකිරීමක් ඇතිවෙන්නේ නැහැනේ. මලක් ගත්තොත් පරවෙනවා දකිනවා. නමුත් ජීවිතාවබෝධයක් ඇති වෙනවාද? මේ ගැඹුරට වඩා ගැඹුරු අනිත්‍යතාවක් දැකිය යුතු නිසානේ. ඒ කියන අනිත්‍යතාව කොහොමද උපදවා ගන්නේ? දියුණු කරන්නේ?

අද මම භික්ෂුවක්. ඒත් මටත් ගිහි ජීවිතයක් තිබුණා. මම ගිහි ජීවිතයේ බලාපොරොත්තු වෙච්ච ගොඩාක් දේවල් තිබ්බා. මං ප්‍රාර්ථනා කරපු දේවල්, මං මෙහෙම වෙන්න ඕනෑ කියලා හිතපු අවස්ථාවල් ඕන තරම් තිබ්බා. එතකොට මං පැවිදි භාවයට පත්වෙලා, මං හැමවෙලාවෙම ඒ රූපයන් මතු කරලා ගත්තා. මට දේශපාලනඥයෙක් වෙන්න කැමැති වුණාම දේශපාලනඥයා කියන චරිතය සිහියට ගත්තා. ඒ දේශපාලනඥයෝ දේශපාලනය කරලා බලයෙන් පිරිහිලා, අවසානයේ ලෙඩ ඇඳේ වැටිලා, අංශභාගය හැදිලා, රෝද පුටුවෙන් යනවා. නුවණින්, මනසින් මෙනෙහි කර කර බැලුවා. දේශපාලනඥයෝ අවසානයේ බෝම්බවලට අහුවෙලා කුඩුවෙලා, විසිරිලා, සවල්වලින් මේ කෑලි එකතු කරනවා මනසින් දැක්කා. දේශපාලනය කරලා අවසානෙදි පරාද වෙලා අඬනවා, කඳුළු සලනවා, ලෙඩ වෙනවා, මැරෙනවා. මම මනසින් බැලුවා. එහෙම බලමින් බලමින් දේශපාලනඥයා කියන රූපය කෙරෙහි තියෙන තෘෂ්ණාව නැතිකර ගත්තා.

එතනින් නැවතුණේ නෑ. ලෝකයටත් ගියා. එක්තරා රාත්‍රියකදී ඇමෙරිකාවේ හිටපු ජනාධිපති කෙනෙක් අවසානයේ මානසික රෝගියෙක් හැටියට මිය පරලොව යනවා මනසින් දැක්කා. රජීව් ගාන්ධි කියන මහත්මයා බෝම්බයක් පිපිරිලා කෑලි කෑලිවලට විසිරිලා යන හැටි මනසින් දැක්කා. ඉන්දිරා ගාන්ධි කියන කෙනා වෙඩි කාලා ලේ විලක් මැද වැටිලා ඉන්නවා මනසින් දැක්කා. ඊට පස්සේ ව්‍යාපාර ක්ෂේත්‍රය කියන දේ නුවණින් දැක්කා. ඒ ව්‍යාපාරික ක්ෂේත්‍රය තුළ කෝටිපති, ප්‍රකෝටිපති ව්‍යාපාරිකයක් විඳින සම්පත්, විඳින සැපයන් මනසින් දැක්කා. ඒ ව්‍යාපාර බංකොලොත් වෙලා ඒගොල්ලෝ දුකට පත්වෙලා අඬනවා මනසින් දැක්කා. ඒ ව්‍යාපාර උපාදනය කරගෙන මැරිලා, සතර අපායේ දුක් විඳිනවා මනසින් දැක්කා. මේ විදිහට මේ හැම රූපයක්ම මතුකර ගනිමින්, මතුකර ගනිමින් විදර්ශනා නුවණ සකස් කරගත්තා. පන්සල්වල නායක ස්වාමීන් වහන්සේලා, මහානායක ස්වාමීන් වහන්සේලා ඒ ඒ දේවල්

''යමෙක් මුලදී පමා වුවත් පසුව නොපමා වේද ඔහු වලාකුළින් නිකුත් වූ සඳක් මෙන් මේ ලෝකය බබුළුවයි.''

උපාදානය කරගෙන ඉන්නවා මනසින් දැක්කා. ඒ උපාදානයක් නිසා ඒගොල්ලන් පත්වෙන්නා වූ අපහසුතාවන්, පත්වෙන්නා වූ ප්‍රශ්න පිළිබඳව නුවණින් මෙනෙහි කරගත්තා. මෙනෙහි කරමින් මනුස්ස ලෝකය තුළ තියෙන්නා වූ සියලුම උපාදානයන් කෙරෙහි තියෙන කැමැත්ත පිළිබඳව, තියෙන උපාදානය අඩුකර ගත්තා. නැවත නැවත, නැවත නැවත නුවණින් මෙනෙහි කර කර බැලුවා. තවත් මේ මනුෂ්‍ය ලෝකය කෙරෙහි තෘෂ්ණාවක් තියෙනවද කියලා. මොකද ඉදිකටු තුඩක තරම් තෘෂ්ණාවක් යම් තැනක තිබ්බා නම් ඒ ඉදිකටු තුඩක ප්‍රමාණය ප්‍රමාණවත් විඤ්ඤාණය එතන බැස ගන්න. ඒ නිසා ඉදිකටු තුඩකවත් තෘෂ්ණාවක් තියෙනවද කියලා නුවණින් මෙනෙහි කළා. මේ ලෝකයේ රජකම ගත්තත් ඒ රජ්ජුරුවෝ ජාති, ජරා, ව්‍යාධි, මරණවලට ලක්වෙලා බියෙන් ජීවත් වන හැටි මනසින් දැක්කා. ජාත්‍යන්තරයටත් ගිහිල්ලා මේ අවසාන මනුස්ස ලෝකය තුළ ඉදිකටු තරම්වත් තෘෂ්ණාවක් නෑ කියන තැනට එනකම්ම නුවණින් මෙනෙහි කරගත්තා.

තමායි දන්නේ තමා තුළ මොන ආකාරයේ කෙලෙස් තිබ්බද කියලා. තමයි දන්නේ තමා තුළ මොන ආකාරයේ බලාපොරොත්තු තිබ්බද කියලා. මේ හැම දෙයක්ම නුවණින් මෙනෙහි කර කර, මනුස්ස ලෝකය තුළ ඉදිකටු තුඩක තරම්වත් තෘෂ්ණාවක් නැහැයි කියලා එයා සැක හැරලා දැනගත්තා නම් මේ විදර්ශනාවත් වැඩුවා. වැඩුණට පස්සේ එයා නිශ්චිතව දැනගත්තා දැන් මනුෂ්‍ය ලෝකය කෙරෙහි තෘෂ්ණාවක් නැහැයි කියන කාරණය. ඒ මනුස්ස ලෝකය කෙරෙහි තෘෂ්ණාවක් නැති වෙනකොට එයාට මනුස්ස ලෝකය කෙරෙහි තියෙන තෘෂ්ණාව අත හැරෙනවා.

ඊට පස්සේ එයා දිව්‍ය තල පීර පීරා මනසින් බලනවා දිව්‍ය තලවල කොතැනකවත් හෝ නිත්‍ය වූ, ස්ථිර වූ සැපයක් තියෙනවාද කියලා. එයා දකිනවා. ශක්‍රයා කියන රූපය, සතර වරම් දෙවියන් කියන රූපය, සුජම්පතී කියන රූපය මේ හැම දෙයක්ම නුවණින් මෙනෙහි කර කර දකිනවා. එයා දකිනවා, බුදුරජාණන් වහන්සේ දේශනා කරලා තියෙනවා. දෙවියනුත් දිව්‍ය ලෝකවලින් චුත වෙනකොට මල් පරවෙනවා, දහඩිය දමනවා, අඬා වැටෙනවා, අප්‍රමාණ දුකට පත්වෙනවා කියලා. එයා දෙවියනුත් අප්‍රමාණ දුකට පත්වෙලා අඬා වැටිලා, සතර අපායන්ට පත්වෙනා දකිනවා. දකිමින් දිව්‍ය ලෝකයේ කල්ප ගාණක් දිව්‍ය සැප වින්දත්, කවද හරි ඒ අය සතර අපායට වැටෙනවා කියන කාරණය නුවණින් දකිනවා. දකිමින් නැවත නැවත නුවණින් මෙනෙහි කරමින්, මෙනෙහි කරමින්, දිව්‍ය තල කෙරෙහි එයාට ඉදිකටු තුඩක තරම්වත් උපාදානයක්, කැමැත්තක්, තෘෂ්ණාවක් තියෙනවද කියලා බලනවා. එයා දකිනවා ශක්‍රයා කියන තැන හිත පිහිටුවගන්න පුළුවන් කියලා. එයා ශක්‍රයා කියන රූපය නුවණින් අරගෙන, නුවණින් විදර්ශනාවට ලක් කරමින්, ශක්‍රයාත් සතර අපායෙන් මිදිලා නැත්නම්, ශක්‍රයාත් නැවත සතර අපායට වැටෙන්න පුළුවන් කියන කාරණය නුවණින් දකිනවා.

මගේ අත්දැකීමයි මම මේ කියන්නේ. මෙහෙම දකිමින් දකිමින් එයා අවසානයේදී බලනවා දිව්‍ය තලය කෙරෙහි එයාගේ තෘෂ්ණාවක් තියෙනවද, නැද්ද, ඉදිකටුවක තුඩක තරම්වත් තෘෂ්ණාවක් තියෙනවද කියන එක. එයා සැක හැර දැනගන්නවා දැන් දිව්‍ය තල කෙරෙහි තෘෂ්ණාවක් අතහැරුණා කියන එක.

ඊළඟට එයා බලනවා රූපාවචර, අරූපාවචර බ්‍රහ්ම තල පීර පීරා මනසින් බලනවා, මේවා තුළ නිත්‍ය වූ, ස්ථිර වූ සැපයක් තියෙනවාද කියලා. බ්‍රහ්ම තලවල කවදාවත් බ්‍රහ්මයෝ දෙන්නෙක් එකට ඉන්නේ නැහැ. දිව්‍ය තලවල වගේ කණ්ඩායම් වශයෙන් බ්‍රහ්මයෝ කවදාවත් එකට ඉන්නේ නැහැ. බ්‍රහ්මයා හැමතැනම ඉන්නේ එකලාව තනියම. නැත්නම් එරමිණියා ගොතාගෙන. නැත්නම් සක්මන් කරමින්. මොකද ඒගොල්ලෝ තුළ පංච නීවරණ නැහැ. පංච නීවරණ යටපත් වෙලා නිසා දෙන්නෙක් කතා කර කර ඉන්න තැනක් බ්‍රහ්ම ලෝකවල කොතැනකවත් නැහැ. එයා බ්‍රහ්ම තල පීර පීර මනසින් රූපවචර, අරූපාවචර බ්‍රහ්මතල දකිනවා. දකිමින් එයා අවසානයේ දකිනවා මේ රූපාවචර, අරූපාවචර දිව්‍ය බ්‍රහ්ම තලවල ඉන්න බ්‍රහ්මයෝත්. මේ බ්‍රහ්ම තලවලින් චුත වෙලා නැවත සතර අපායන්ට වැටෙනවා කියලා එයා සතට අපායන්ට වැටෙන බ්‍රහ්මයන් නුවණින්, මනසින් දකිනවා. දකිමින් බ්‍රහ්ම තලවලට තියෙන තෘෂ්ණාව එයා අඩුකර ගන්නවා. එයා බලනවා ඉදිකටු තුඩක තරම්වත් තෘෂ්ණාවක් බ්‍රහ්ම තල කෙරෙහි තියෙනවද කියලා. එයා දකිනවා මහා බ්‍රහ්මයා කියලා කෙනෙක් ඉන්නවා කියලා. එයා නුවණින් මෙනෙහි කර කර මහා බ්‍රහ්මයා කියන රූපය විදර්ශනාවට ලක් කරනවා. එයා දකිනවා මහා බ්‍රහ්මයාත්, සතර අපායෙන් මිදිලා, නැත්නම් මහා බ්‍රහ්මයාත් ආයෙමත් සතර අපායට වැටෙනවා කියන කාරණය දකිමින් බ්‍රහ්ම තලය කෙරෙහි තියෙන අවසාන කැමැත්තත් විදර්ශනාවට එයා ලක් කරනවා.

එහෙම නම් අවසානෙදි මොකක්ද වෙන්නේ? මනුෂ්‍ය ලෝකය කෙරෙහි තියෙන තෘෂ්ණාවත්, දිව්‍ය තල, බ්‍රහ්ම තල කෙරෙහි තියෙන තෘෂ්ණාවත්, හිඳුන තැන හිත පිහිටන්නේ නිවනෙහි කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. අනිත්‍යයි කියන සංඥව මා තුළින් මා බැලුවේ ඔය ආකාරයටයි. මගේ ජීවිතයේ තෘෂ්ණාව කියන කාරණය හීන කරගත්තේ රූපය ඔය ආකාරයට අරගෙනයි. මොකද මම කැමති දේ, දන්න දේ, මගේ ස්වභාවය එකක්. තව කෙනෙක්ගේ, තව ස්වාමීන් වහන්සේ කෙනෙක්ගේ කැමැත්ත තව එකක් වෙන්න පුළුවන්. එතකොට ඒ තමා තුළ තියෙන දේ. තමා ඒ මතු කර කර, මතු කර කර විදර්ශනා නුවණින් දකිමින් ඒවා සමාජයත් එක්ක, ලෝකයත් එක්ක බද්ධ කර ගනිමින් ඒවා කෙරෙහි තියෙන තෘෂ්ණාවෙන් අපි මිදෙන්න ඕනේ.

**ධර්ම ගවේෂක**



"සුචරිතයෙහි හැසිරිය යුතුය. දුශ්චරිතයෙහි නොහැසිරිය යුතුය. ධර්මයෙහ් හැසිරෙන්නා මෙලොව පරලොව දෙකෙහිම සුවසේ වෙසේ."

# බුදු පිළිමයක හැඩරුව වෙනස් කළ හැකිද..?



මේ දිනවල නිතරම ඇසෙන්නේ බුද්ධ දේශනාව තම තමන්ගේ හිතුමතයට අර්ථකථනය කරන ආකාරයයි. බුද්ධ දේශනය පමණක් නොව බුද්ධ ප්‍රතිමාවද එක් එක් අයගේ හිතුමතයට වෙනස් කරන ආකාරය දූන් දක්නට ලැබේ.

චිත්‍ර ශිල්පියා යෙදී සිටින්නේ නිර්මාණ කාර්යයකය. කලින් දකින්නට නොලැබුණු දෙයක් නිර්මාණය කිරීම අපූර්වත්වයයි. එය කලාවේ විශිෂ්ට ලක්ෂණයකි. එහෙත් බුද්ධ ප්‍රතිමාවට එසේ කළ නොහැකිය. එයට සුවිශේෂ වූ අනන්‍යතාවක් ඇත. ඒ අනන්‍යතාවට පරිබාහිර වූ කිසිවක් එහි තිබිය නොහැකිය.

බුද්ධ ප්‍රතිමාවේ සමාරම්භය පිළිබඳ වඩාත් ප්‍රචලිත මත තුනක් තිබේ. ඒ ගන්ධාරය මුල් කොට 1 වන සියවසේදී කනිෂ්ක රජු දවස බුද්ධ ප්‍රතිමාව ආරම්භ වූ බව ඊට සුළු කලකට පසු මථුරා දේශයේදී බුද්ධ ප්‍රතිමාව ආරම්භ වූ බව සහ දේවානම්පියතිස්ස රජු දවස ශ්‍රී ලංකාවේදී බුද්ධ ප්‍රතිමාව ආරම්භ වූ බවයි.

බුද්ධ පරිනිර්වාණයේ සිට සියවස් හයක් ගත වනතුරු බුද්ධ ප්‍රතිමාවක් නිර්මාණය කළ බවට පැහැදිලි සාක්ෂ්‍යයක් දක්නට නොලැබේ. 1 වන ශත වර්ෂයේදී ගන්ධාරයේදී බුද්ධ ප්‍රතිමාව ඉදි කැරුණේ බුදුන් වහන්සේ ගැන අසා නැති, උන්වහන්සේගේ ධර්මය නොදන්නා අබෞද්ධ ග්‍රීක ශිල්පීන් විසිනි. ඔවුනට වුවමනා වූයේ වඩාත් ශෝභාවත් මිනිසකු නිර්මාණය කිරීම මිස ලොව ඉහළම තත්ත්වය වූ බුද්ධත්වයට පත් උතුමකු නිර්මාණය කිරීම නොවේ. එහෙයින් ඔවුන් නිර්මාණය කළ බුදු රුව බුදුරජාණන් වහන්සේගේ ප්‍රතිරූපයට තදබල ලෙස හානි කරන්නක් විය.

මේ වරද නිවැරදි කරන්නට, මෙතෙක් බුදු රුවක් නිර්මාණය නොකළ බෞද්ධ ශිල්පීන්ට අවශ්‍ය විය. මථුරා ශිල්පීන් බුදු රුව නිර්මාණය කළේ එහෙයිනි. ශ්‍රී ලාංකික බුදු රුව ස්වාධීන නිර්මාණයක් යැයිද, මථුරා හා ගන්ධාර සම්ප්‍රදායන් ආශ්‍රයෙන් නිර්මාණය වූවක් යැයිද මතවාද දෙකක් පවතී.

පසුකාලීන භාරතීය බුදුරුව මහායාන සංකල්පවලින් හා වෙනත් දේවරූප පිළිබඳ සංකල්පවලින් පිරිගිය මූලික අනන්‍යතාව ඉක්ම වූ ප්‍රතිමා විය. ජපන් හා චීන බුද්ධ ප්‍රතිමාවන්හි මේ සම්ප්‍රදායන් සියල්ලෙන් වෙනස් වූ ඔවුනටම අනන්‍ය වූ සම්ප්‍රදායක් විය.


මේ වනවිට සිංහල බෞද්ධ ශිල්පීහු බුද්ධ ප්‍රතිමා නිර්මාණයේදීත්, සිතුවම් කිරීමේදීත් තම තමනට හිතෙන පරිදි ඒ එක එකින් කෑලි අහුලා පුරුද්දා හෝ ඒවා ඒ ආකාරයෙන්ම අනුකරණය කර බුද්ධ රූප නිර්මාණය කරති. සමහරක් බුදු රූ බුදුන් වහන්සේගේ ප්‍රතිරූපයට සම්පූර්ණයෙන් පටහැනිය.

ඇතැම් නූතන ශිල්පීන් පශ්චාත් නව්‍යවාදී සංකල්ප අනුව අනෙකුත් මානව රූප නිර්මාණය කරන්නාක් මෙන් කළ තනි ඇසක් ඇති, දිගටි, ඇඹරුණු, වක ගැසුණු, විරූප වූ මුහුණු සහිත බුදු රූ පුවත්පත්වල හා සඟරාවල දක්නට ලැබේ. එය බෞද්ධයාගේ ශ්‍රද්ධාව හීන කරන, පිළිකුල දනවන ඒවා බව අමතක කළ යුතු නැත. එහෙයින් නියම බුද්ධ ප්‍රතිමාවක කෙබඳු ලක්ෂණ තිබිය යුතුදැයි සිතා බැලීම අද කාලෝචිත අවශ්‍යතාවක් වී තිබේ.

ගන්ධාර බුද්ධ ප්‍රතිමාවේ බුදුරදුන්ගේ හිසකෙස් බෙහෙවින් දිගට දක්වා තිබේ. පාකිස්ථානයේ හෝටිමර්දාන් ධාතු කරඬුවේ ඇති බුදු රූ දෙක පාකිස්ථානයේ තක්ෂිලා පුරාවිද්‍යා කෞතුකාගාරයේ ඇති බුද්ධ ප්‍රතිමා කීපය, කරච්චියේ පුරාවිද්‍යා කෞතුකාගාරයේ ඇති බුදුරුව, ඇෆ්ඝනිස්ථානයේ කාබුල් කෞතුකාගාරයේ ඇති බුදු රුව ආදී ගන්ධාර බුද්ධ ප්‍රතිමා මේ සඳහා නිදසුන් ලෙස දැක්විය හැකිය. මේ සියල්ල බුදුන් වහන්සේ පිළිබඳ කිසිවක් නොදත්, නොඇසූ ග්‍රීක ශිල්පීන් විසින් කරන ලද ඒවාය.

රෝම ශිල්පීන් විසින් කරන ලද බුද්ධ ප්‍රතිමාවල බුදුන් වහන්සේ හිස මුදුනෙන් විශාල කොණ්ඩයක් බැඳ ඇති අයුරු දක්වා තිබේ. කාබුල් කෞතුකාගාරයේ ඇති බුද්ධ ප්‍රතිමාවත්, ලාහෝර් කෞතුකාගාරයේ ඇති බුද්ධ ප්‍රතිමාවත්, මථුරා කෞතුකාගාරයේ ඇති සිවුවරම් දෙවිවරුන්ගෙන් පාත්‍ර පිළිග න්නා අයුරු දැක්වෙන ප්‍රතිමාවත් එයට නිදසුන් සේ දැක්විය හැකිය.

''තරුණ වියේදීම මව්පියන් හඬද්දීම කෙස් රැවුල් බහා කසාය වස්ත්‍ර හැඳ ගිහිගෙයින් නික්ම පැවිදි වීමි'' යි උන්වහන්සේම අරියපරියේසණ සූත්‍රයේදී සඳහන් කරති.



(මිල්ටන් මද්දුමාගේ, සරල සිංහල මජ්ඣිම නිකාය, 88 පිට) ඒ අනුව උන්වහන්සේ පැවිදි වනවිටම කෙස්, රැවුල් බෑ බව පැහැදිලිය. බුදුන් වහන්සේ භික්ෂූන් වහන්සේලාට ප්‍රකාශ කර සිටියේ දිගු කෙස් නොදැරිය යුතු බවයි. ''කිසියම් මහණ කෙනකු දිගු කෙස් දරා නම් එය දුකුළා ඇවත නම් වරදක් කළා වේ. (න භික්ඛවේ දීඝ කේසා ධාරේතබ්බා), (චුල්ලවග්ග පාළි - 2, බු.ජ.ත්‍රි. 8 පිට) භික්ෂූන් වහන්සේලාගේ විනය නීතිය අනුව කෙස් නොබා සිටිය හැක්කේ දෙසතියක් තරම් කාලයක් පමණි. නැතහොත් දෑඟුලක් වැඩෙන තෙක් පමණි. ඒ අනුව ගන්ධාර සම්ප්‍රදාය අනුගමනය කරමින් දීර්ඝ කෙස්වැටියක් සහිත හෝ මුදුන් කොට බඳින ලද ආකාරයේ හිසකේ ඇති ප්‍රතිමා නිර්මාණය කිරීම හෝ සිතුවම් කිරීම නොකළ යුත්තකි.

අනුරාධපුර යුගයේ සියලු බුද්ධ ප්‍රතිමාවන්හි හිස කෙස් දක්වා ඇත්තේ මුදු ආකාරයෙනි. ඒ ප්‍රතිමා ශිල්පියා අක්බමරු වූ කෙස් දැක්වූ ආකාරයයි.

බුදුන් වහන්සේට දිය බුබුලක් මෙන් වටවූ හිසක් තිබූ බව ලක්ඛණ සූත්‍රයේ (මිල්ටන් මද්දුමාගේ, දීඝ නිකාය, 223 පිට) දැක්වේ. සාමාන්‍ය මනුෂ්‍යයකුගේ මෙන් දිගටි හිස සහිත බුද්ධ ප්‍රතිමාත්, සිතුවමුත් අද කොතෙකුත් දක්නට ලැබේ. ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨතම බුද්ධ ප්‍රතිමාවන් වන මහමෙවුනාවේ සමාධි ප්‍රතිමාවේත්, තොළුවිල ප්‍රතිමාවේත් හිස දිය බුබුලක් මෙන් වෘත්තාකාර ය.

අද නිර්මාණය කෙරෙන ඇතැම් බුදු රුවල දෑස් මේකප් කරන ලද තරුණ නිළියකගේ මෙන් දිගටිය. එහෙත් බුදුන් වහන්සේගේ ඇස් අලුත උපන් වසු පැටවකුගේ මෙන් වටවූ බව (ගෝපමුඛතෝ) දෙතිස් මහ පුරුෂ ලක්ෂණවල දැක්වේ. (ලක්ඛණ සූත්‍රය) නළලේ තිබූ ඌර්ණ රෝම ධාතුව කපු පුළුන් රොදක් වැනි සියුම් රෝමයක් බව මහානිදාන සූත්‍රය දක්වා ඇත. එය සාමාන්‍ය ප්‍රමාණයේ ප්‍රතිමාවකින් හෝ සිතුවමකින් දැක්විය නොහැකි තරම් සියුම්ය.

බුදුන් වහන්සේ සිවුරු දරන ලද්දේ දෙඋර වැසෙන සේද නැත්නම් තනි උරය වැසෙන සේද යන්න ඇතැමුන්ට ගැටලුවකි. බොහෝ සූත්‍රයන්හි සිවුර ඒකාංශ කොට පොරවා යන්න සඳහන් වේ. භික්ෂූන් වහන්සේලා ආරාමයෙන් බැහැර යන අවස්ථාවේදී තෙමඬුළු වසා පිරිමඬුළු කොට හැඳ පටිය බැඳ දෙගුණ කොට සඟල සිවුර පොරවා යා යුතු යැයි චුල්ලවග්ග පාළියේ දක්වා ඇත. (සගුණං කත්වා සංඝාටියෝ පාරුපෙත්වා) (චුල්ලවග්ග පාළි - 1, බු.ජ.ත්‍රි. 96 පිට) උපාධ්‍යයන් වහන්සේට ගරු සත්කාර කරන හැමවිටම අන්තේවාසික භික්ෂුව සඟල සිවුර සකස් කොට පෙරවිය යුතුය. සඟල සිවුර එකස් කොට දැහැටි දිය යුතුය. (ඒකංසං උත්තරා සංසං කරිත්වා)

යථාවාදී තථාකාරී බුදුන් වහන්සේද ඒ පිළිවෙතම අනුගමනය කරන්නට ඇතැයි විශ්වාස කළ හැකිය. ඒ අනුව මහා මාර්ගයේ වඩින බුදුන් වහන්සේ දෙඋර වසාද, ගන්ධකුටියේ වැඩ සිටින විට තනි උරය වසාද නිර්මාණය කිරීම වඩාත් සුදුසු යැයි සිතේ. බුදුන් වහන්සේට නමස්කාර කරන මහාකාශ්‍යප තෙරණුවන් දෙඋර වසා එසේ කිරීම ඉහත සඳහන් විනය ශික්ෂා පදයට පටහැනිය.



ශ්‍රී ලංකාවේ පැරණි ප්‍රතිමා සියල්ල නිර්මාණය කොට තිබුණේ ඒකාංශ කොට පොරවා ඇති ආකාරයෙනි. අනුරාධපුර මහමෙවුනාවේ පිළිමය, තොළුවිල පිළිමය, මැදිරිගිරිය, පොළොන්නරුව වටදාගෙවල පිළිම මෙයට නිදසුන්ය. මහායාන බුදු සමයට වැඩි නැඹුරුවක් දැක්වූ අභයගිරියෙන් හමුවූ ක්‍රි.ව. 3 වන ශත වර්ෂයට පමණ අයත් වන හුණුගල් පිළිමද නෙළා තිබුණේ ඒකාංශ කොටය. ගන්ධාර ප්‍රතිමා ශිල්පීහු භික්ෂූන් වහන්සේලා සිවුරු පොරවන ආකාරය නොදැන සිටි බැවින් ග්‍රීක වංශවතුන් පොරවන ටෝගාව අනුව සිවුරු පෙරවීය. ගන්ධාර ප්‍රතිමාවන් දෙකක එක ආකාරයෙන් නොදැක්වෙන සේ විවිධ ආකාරයෙන් අක්‍රමවත් ලෙස සිවුරු පොරවා තිබේ.

බුදුන් වහන්සේ සිවුරු නොහැඳිය යුතු ආකාර පහක් චුල්ලවග්ග පාළියේ දක්වා තිබේ. (චුල්ලවග්ග පාළි - 2, බු.ජ.ත්‍රි. 96 පිට)

**හත්ථි සොණ්ඩිකං** - නැබ මුල සිට ඇත් සොඬක් මෙන් පහළට එල්බෙන සේ

**මච්ඡා වාළකං** - මත්ස්‍යයකු සේ වලිගය මෙන් දෙපසට කොන් විහිදෙන සේ සිවුරු දැරීම

''ආශාව නිසා ශෝකය හටගනී. බිය හට ගනී. ආශාවෙන් වෙන් වූවනට ශෝකයක් නැත. බියකුත් නැත.''

චතුකණ්ණකං - උඩට යටට කොන් සිටින සේ ඇඳීම

තාල වට්ටකං - තල් වැටක් මෙන් අඳනය එල්බෙන සේ ඇඳීම

සත වල්ලිකං - අඳනය රැලි ගන්වා ඇඳීම

මේ සියල්ල ගිහියන් අඳින විලාසිතාවන් බැවින් (ගිහී පාරුතං පාරුපෙන්ති) එසේ සිවුරු ඇඳීම දුකළා ඇවැත් වේ යැයි දක්වා තිබේ.

5 වන ශත වර්ෂයෙන් පසු බෙංගාලයේ ඉදිකරන ලද ප්‍රතිමාවන්හි දක්නට ලැබෙන්නේ මේ ආකාරයෙන් සිවුරු දරන ප්‍රතිමාවන්ය. ඒ වන විට භාරතයේ බුදු සමය අන්තයටම පිරිහී තිබුණු අතර හින්දු ආගමික සම්ප්‍රදායන් බහුල ලෙස සමාජගතව තිබිණි. බුද්ධ ප්‍රතිමාවද ඒ තත්ත්වයෙන් බැහැර නොවීය. ඇතැම් ජනප්‍රිය භික්ෂූන් වහන්සේලාගේ අනුශාසකත්වයෙන් අද දවසේ නිර්මාණය වන බුදු රුවල මෙබඳු ලක්ෂණ දැකීම කනගාටුවට කරුණකි.

සිද්ධාර්ථ කුමාරයන් ශාක්‍ය ගෝත්‍රයට අයත් බව සුත්ත නිපාතයේ පබ්බජ්ජා සූත්‍රයේ දක්වේ. (ගොත්තේන සක්‍ය ජාතියා), (මිල්ටන් මද්දුමාගේ, ඛුද්දක නිකාය - 1, 198 පිට)

කෙසේ වෙතත් බුදුන් වහන්ස් ලම්බකරණ ගෝත්‍රයට අයත් බව අපේ පිළිගැනීමයි. එහෙයින් බුද්ධ ප්‍රතිමාවේ කන් දිගට දැක්වීම සුදුසු වුවත් අභව්‍ය ලෙසින් දික් ගැස්සීම සුදුසු නොවේ. මුල්කාලීන අනුරාධපුර ප්‍රතිමාවන්හි එලෙස අතිශය දීර්ඝ කන් දක්වා නැත.


බුදුන් වහන්සේ චුල්ලවග්ග පාළියේදී භික්ෂූන් වහන්සේට මුතුවැල් ආදී කර්ණාභරණ (මල්ලිකං), ගෙළ පළඳනා (කණ්ඨ සුත්තකං), ඉණ පළඳනා (කටී සුත්තකං), අඟු පළඳනා (කෙයුරං), අත් පළඳනා (හත්ථාභරණං), මුදු (අංගුලි මුද්දකං) නොපැළඳිය යුතු බව ප්‍රකාශ කොට තිබේ. මහායාන දර්ශනයක් ඇති ජපානය, කොරියාව, ඉන්දුනීසියාව ආදී රටවලත් ථෙරවාදී සම්ප්‍රදාය සහිත තායිලන්තය, මියන්මාරය වැනි රටවලත් මෙවැනි ආභරණ සහ ඔටුණු සහිත බුද්ධ ප්‍රතිමා දක්නට ලැබේ. ශ්‍රී ලංකාවේ එවැනි බුද්ධ ප්‍රතිමා කිසිදිනක නිර්මාණය කළ බවක් දැනගන්නට නැත. මහායානික රටවලින් නොමිලේ ලබාදෙන බුද්ධ ප්‍රතිමාවන් අතර එබඳු ප්‍රතිමා බහුල වශයෙන් දක්නට ලැබේ. නොමිලේ ලැබෙන දෙයෙහි හොඳ නරක විනිශ්චය නොකිරීම අපේ සිරිතක් බැවින් ඒවා අපේ විහාරස්ථානවල ඉහළින්ම තැන්පත් කර ඇත. වර්තමානයේ ඒ ප්‍රතිමා අනුකරණය කරමින් ප්‍රතිමා නිර්මාණයේ යොදවන විහාරස්ථාන ඇත. ඒවා විනය විරෝධී බව අමුතුවෙන් කිව යුතු නොවේ.

බුදුන් වහන්සේ දෑත දෙපසට විහිදූ කල මැද ඇඟිලි තුඩු දෙක අතර දුරත්, ශරීරයේ උසත් එක සමානය. ඒ අනුව නොනැවී දණහිස් ස්පර්ශ කළ හැකිය. ගන්ධාර ප්‍රතිමා ශිල්පීන් බුද්ධ ප්‍රතිමා නිර්මාණය කළේ වඩාත් මිටි ස්වරූපයෙනි. එය ඔවුන්ගේ නොදැනුවත්කම නිසා වූවකි. තවදුරටත් අප එය අනුකරණය නොකළ යුතුය.

බුද්ධ ශරීරය බ්‍රහ්මයාගේ මෙන් ඍජුව පැවැති බව දීඝ නිකායේ අම්බට්ඨ සූත්‍රයේත්, මහානිදාන සූත්‍රයේත් දැක්වේ. මුල්කාලීන ශ්‍රී ලාංකික බුද්ධ ප්‍රතිමාවන්හි මේ ලක්ෂණය අනිවාර්යයෙන් දක්නට ලැබිණ. හාවභාව විලාසිතා දක්වන කාන්තාවන්ගේ මෙන් ඒ මේ අතට ඇඹරුණු ප්‍රතිමා දක්නට නොවීය. පොළොන්නරුව ගල් විහාර ප්‍රතිමාවේ තිවංක බව තිබුණද එහි ඍජු භාවයට කිසිදු හානියක් සිදුවී නැත. එහෙත් ඇතැම් බුද්ධ ප්‍රාසාදයන්හි නාරි ලාලිත්‍යයෙන් යුත් බුද්ධ ප්‍රතිමාත්, ශ්‍රාවක ප්‍රතිමාත් දක්නට ලැබේ.

මුල්කාලීන බුද්ධ ප්‍රතිමාවන්හි මුද්‍රාවන් පිළිබඳ එකඟත්වයක් තිබී නැත. ආන්ද්‍ර සම්ප්‍රදායේ බුද්ධ ප්‍රතිමාවන්හි අභය මුද්‍රාව දැක්වීමේදී එකිනෙකට වෙනස් වූ ආකාරය පැහැදිලිව දක්නට ලැබේ. ශ්‍රී ලංකාවේ බුද්ධ ප්‍රතිමාවන්හි අභය මුද්‍රාව දැක්වූයේ අවුකන ප්‍රතිමාවේ මෙන් දකුණු උරය ඉදිරියෙන් අත පැත්තට සිටින දැක්වීමෙනි. දේශපාලනඥයකු ජනතාව ඉදිරියේ අත දිගු කරන විලාසයෙන් නිර්මිත බුද්ධ ප්‍රතිමා නූතන ශිල්පීන් අතින් බිහිවී ඇත. ඒවා අයිති කුමන මුද්‍රාවකටදැයි, කුමන සම්ප්‍රදායකටදැයි කීමට නොහැකිය.

බුදුන් වහන්සේ වෙතින් බ්‍යාම ප්‍රභා, රංසි ජාල, රංසි චූළාමණී යන තුන් ආකාරයකින් රැස් විහිදුණු බව සඳහන් වේ. (පුන් කලස, ශාස්ත්‍රීය සංග්‍රහය, ලේක්හවුස් ප්‍රකාශනය) බ්‍යාම ප්‍රභාව නම් හිස මුදුනෙන් ඉහළට විහිදෙන රැස් මාලාවයි. එය කෙසේ නිර්මාණය කළ යුතුදැයි කල්පනා කළ ශිල්පියා හිස මුදුනෙන් ඉහළට විහිදෙන ඇඹරී ගිය යමක් නිර්මාණය කළේය. එයද ආරම්භ වූයේ ප්‍රතිමා කලාව පිරිහී ගිය මහනුවර යුගයේය. (අවුකන ප්‍රතිමාවට පසුව එක්වූවකි.)



ගන්ධාර ශිල්පීන් එබන්දක් නිර්මාණය කළේ සූර්ය දිව්‍ය රාජ ප්‍රතිමාවන්හි හිස මුදුනේ වූ චේඨනය අනුකරණය කිරීමෙනි. විදේශවලින් ගෙනා ඇතැම් ප්‍රතිමාවන්හි සුවිශාල ඔටුන්නක් හිස මත පළඳා ඇති ආකාරයේ ප්‍රතිමා දක්නට ලැබේ. ඒවා කෙතෙක් දුරට බෞද්ධ අනන්‍යතාවට ගැළපේදැයි සිතා බැලිය යුතුය.

පිරිසිදු ථෙරවාදී බුදු සමය පවතින අපටම උරුම වූ බෞද්ධ කලා සම්ප්‍රදායක් හා ශතවර්ෂ 20 ක් තරම් දීර්ඝ කාලයක් තිස්සේ සංවර්ධනය වූ බුද්ධ ප්‍රතිමා කලාවක් ඇති අපේ සංස්කෘතික හා කලා අනන්‍යතාව විනාශ කිරීම එතරම් යහපත් දෙයකැයි කිව නොහැකිය.

**මිල්ටන් මද්දුමාගේ දර්ශනපති**
**(බෞද්ධ කලා හා වාස්තු විද්‍යා)**

"ඇත්ත කිව යුතුය. අනුන්ට නොකිපිය යුතුය. අනිකකු යමක් ඉල්ලූ කල ටිකක් වුවත් දිය යුතුය. මේ තුන් කරුණෙන් කෙනෙකුට දෙවියන් වෙත යා හැකිය."

**පූජ්‍ය හැගොඩ විපස්සි හිමින්ගෙන් දහම් ගැටලුවලට පිළිතුරු**

# ශීලය යනු කුමක්ද?

ස්වාමීන් වහන්ස, ශීලය යනු කුමක්ද? ශීලය රකින්නේ කෙසේද යන්න පිළිබඳව අපට පැහැදිලි කර දෙන්න.

කරුණාරත්න දිසානායක - වැල්ලවාය

ශීලය පිළිබඳව සමාජයේ නිතර කතාබහට ලක්වෙයි. ශීලය යනු කයෙන් හා වචනයෙන් කරන වැරදිවලින් වැළකීමයි. ශීලයේ බීජය නම් වැළකීමේ චෛතසිකයයි. එනම් විරතියයි. සාමාන්‍යයෙන් ඒවායෙන් වැළකී සිටීමට සමාදානයක් (පොරොන්දුවක්) තිබිය යුතුයි. ප්‍රාණඝාතය, නොදුන් දෙය ගැනීම, කාමය වරදවා හැසිරීම ආදී දුෂ්චරිත කයින්ද, බොරු කීම ආදී වාග් දුෂ්චරිත වචනයෙන්ද කෙරෙන වැරදිය.

මේවායෙන් වැළකෙන බවට තමා විසින්ම හෝ වෙනත් උතුමකු වෙත එළඹ හෝ චෛත්‍යය, බෝධිය වැනි පූජනීය ස්ථානයකදී හෝ වචනයෙන් කියා පොරොන්දු වීම සමාදානයයි. සමාදානය යනු ගැනීමයි. මෙම පොරොන්දුව ඉටු කිරීමෙන් ශීලය රැකෙයි.

සාමාන්‍යයෙන් දෙවියන්ට බාර වූ විට එම බාරය බොහෝ බියෙන්, ගෞරවයෙන් ඉටු කළත් සිල් රකින බවට වූ පොරොන්දුව ඉටු නොකරන නිසා ශීලය ආරක්ෂා නොවේ. ඒ නිසා දෙවියන්ට වූ බාරය නිසි ලෙස ඔප්පු කළත් ශීලය ආරක්ෂා කරනවා යැයි කියා වූ බාරය ඉටු නොකිරීමෙන් ශීලය නොරැකෙයි.

සමාදන් වූ ශික්ෂා පද්ධතිය, අතට ගත් දෙයක් නොවිසිරෙන්නට, නොබිඳෙන්නට, නොවැටෙන්නට අල්ලාගෙන සිටින්නාක් මෙන් රැකගැනීම ශීලයේ ලක්ෂණයයි. සමාදන් වූ ශික්ෂා පද නොකඩවා රකින විට පුහුණුවක්, අභ්‍යාසයක් ඇති වෙයි. එය ඉබේම සිදුවෙයි. එවිට ඔහු සිල් ඇත්තෙක් වෙයි. ශීලය යනු ගතියට, ස්වභාවයටද නමකි. නිදසුනක් ලෙස නිදන ගතිය ඇති (නිද්‍රාශීලී), ප්‍රියගතිය ඇති (ප්‍රියශීලී) ආදී ස්ථානවලද කැඩෙන සුළු, ඇලෙන සුළු ආදී තැන්වලද මේ අදහස යෙදෙයි. මේ නිසා සතුන් නොමැරීම් ආදී පව්කම් නොකරන ගතියක් ඇත්තා ශීලවන්තයකු ලෙස සැලකෙයි.



''යකඩයෙන් නැගුණ මලකඩ එම යකඩයම කා දමයි. නුවණින් තොරව වසන තැනැත්තාගේ අකුසල් ඔහු දුගතියට යවයි.''

දළදා වරුණ


මාධ්‍ය විශේෂ ව්‍යාපෘති කාර්යාංශය
ශ්‍රී දළදා මාලිගය
මහනුවර
දුරකථන : 0812204684
ෆැක්ස් : 0812236202
E mail : media@sridaladamaligawa.lk
Web : www.sridalada maligawa.lk

# දැහැමි සමාජයක් ගොඩ නගමු

එදා අපේ දේශය විපතට හා විවිධ අභියෝගවලට ලක්වූ හැම අවස්ථාවකදීම එයින් රට ගලවා ගැනීමට මූලික වූවෝ භික්ෂූහුම වෙති. උන්වහන්සේලාගේ නිවැරදි මාර්ගෝපදේශකත්වය වටා ජනතාව රොද බැඳ ගත්තේ එකා මෙන් සමගි සම්පන්නවය. ගමේ අනුශාසකත්වය මෙන්ම රටේ අනුශාසකත්වයද මහා සංඝයා වෙත උරුම වූයේ ඒ නිසාමය. සිංහල බෞද්ධ ජනතාව සතුවූ මෙම සුවිශේෂී ගිහි-පැවිදි සමාජ බැම්ම විනාශ කිරීමට එදා විදේශිකයන් උත්සාහ කළද එය ඔවුනට කළ නොහැකි වූ බවට ඉතිහාසය දෙස් දෙයි. බෞද්ධ ශිෂ්ටාචාරය ලොව බොහෝ ජාතීන්ගේ ශිෂ්ටාචාර හා සසඳන කල ඉතා ඉහළ සම්භාවනාවකට පාත්‍ර වෙයි. අනුරාධපුර, පොළොන්නරු හා නැගෙනහිර පළාත්වල පෞරාණික නටබුන් තුළින්ද හෙළි කරන්නේ අපේ මෙම අතීත ශ්‍රී විභූතියයි. එකම පවුලක දූ දරුවන් මෙන් සහෝදරත්වයෙන් හා සමගි සම්පන්නව ජීවත් විය යුතුය යන ධර්මතාව අපි කවුරුත් හිස් මුදුනෙහිලා පිළිගත යුත්තේ එබැවිනි. එමනිසා වර්තමාන සමාජ දේහය තුළ හිස ඔසවන්නට තැත් කරන සියලු ජාතිවාදී බලවේග පරාජය කරන්නට අපි හැම එකට එක්විය යුතුය යන අදහස මෙහිදී අවධාරණය කර සිටින්නෙමු.

මෙලොවත්, පරලොවත් සැපසේ වාසය කරන්නේ ධර්මචාරී තැනැත්තා බව බුදුරජාණන් වහන්සේ ඉතා පැහැදිලිවම දේශනා කර තිබේ. උන්වහන්සේ පෙන්වා දුන් නිවැරදි ධර්ම මාර්ගයේ ගමන් කිරීම සියලු බෞද්ධයාගේ පරම අධිෂ්ඨානය විය යුත්තේය. මෙම අදිටන ගිහියාට පමණක් නොව භික්ෂූන් වහන්සේලාටත් එකසේ පොදුය.

බුදුදහම වනාහී ලෞකික සුවයත්, ලෝකෝත්තර සුවයත් සඳහා මග පෙන්වන යථාර්ථවාදී දහැමි දර්ශනයකි. එහිදී ගිහියාට හිමි ප්‍රතිපදාව උන්වහන්සේ සිඟාලෝවාද සූත්‍රයෙන් පෙන්වා දී ඇත්තාහ. ගිහි ප්‍රතිපදාව තුළ රාජ්‍ය පාලකයා දැහැමින් රට පාලනය කළ යුතු අන්දම ගැනද බුදුදහමේ ඉගැන්වේ. මෙහිදී මිථ්‍යා මතධාරී මෙන්ම දේශපාලන අන්තගාමීහුද මෙම යථාර්ථය අවබෝධ කරගැනීම අතිශයින් වැදගත්ය. රටේ සියලු ජනකොටස් නිවැරදි ධර්ම මාවතට යොමු කොට සුචරිතය හා ශීලාචාර දැහැමි සමාජයක් ගොඩනැගීම සඳහා ගිහි-පැවිදි බලධාරී සියලු දෙනා දායකවීම යුගයේ අවශ්‍යතාවක් බව අවධාරණය කර සිටිමු. ■



බුදු
දක්ව
ඉ

අප මහා සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේ උද්දේසික වශයෙන් පිදීම සඳහා ලෝකවාසී බෞද්ධ ජනතාව යොදගනු ලබන්නේ බුදු පිළිමයයි. ලොව පළමු බුදු පිළිමය නිර්මාණය කිරීමේ ගෞරවය හිමිවන්නේ කණිෂ්ක රජතුමාටය.

ථෙරවාදී බෞද්ධ සම්ප්‍රදයට අයත් විශිෂ්ට ගණයේ බුද්ධ ප්‍රතිමා දක්නට ලැබෙන්නේ ශ්‍රී ලංකාවේය. ලංකාවේ බුදු පිළිම ආන්ද්‍රා ශෛලියේ ආභාෂය ලබා ප්‍රභවය වූවක් බව සාමාන්‍ය පිළිගැනීමයි.

සිංහල බුද්ධ ප්‍රතිමා ශිල්පීහු සිය නිර්මාණයන්ට දේශීයත්වය සමාරෝපණය කළ මුල් අවධියේ ලක්දිව බුද්ධ පිළිමවලට මහායාන ආභාෂය ලැබී ඇත්තේ අල්ප වශයෙනි. මෙයට හේතුව ලෙස දක්වනු ලබන්නේ අනුරාධපුර මහාවිහාර සම්ප්‍රදය අති ප්‍රබලව පැවැතීමය. නමුත් පොළොන්නරු අවධියේ සිට මහායාන සම්ප්‍රදය මගින් කළ බලපෑම වැඩිවත්ම බුදු පිළිමය කෙරෙහිද එම ආභාෂය දක්නට ලැබේ. එහිදී එම බුදු පිළිමවල විදේශීය ලක්ෂණද ගැබ්ව ඇති අයුරු දක්නට ලැබේ.

ඉරියව්ව අනුව පිළිම වර්ග තුනක් දැකගත හැකිය. ඒවා නම්,

1. හිටි පිළිම, 2. වැඩ හිඳින පිළිම, 3. ඔත් පිළිම.


සිටගෙන සිටින ඉරියව්වෙන් නෙළා ඇති පිළිම

හිටි පිළිම
ඇති අඩි 6
පැරණිතම
දකුණු ඉන්
සම්ප්‍රදයට
බුදු පිළිමය,
හා ගල් විහ
පිළිමවලින්

බුදුරජා
නිරූපණය
හිඳි පිළිම
ඇති අඩි 5
දැවට හොඳි
වේ. එමෙන
මහමෙව්නා
පොළොන්
දෙකක්ද,
හිඳි පිළිම

ත්‍රි ශික්
බෞද්ධයන්
ආකාරයෙන
ඇති බව
නාග දරණ

''අසවලා මට බැන්නේය. මට ගැසුවේය. මා පැරදවූයේය. මා සතු දේ පැහැර ගත්තේය යනුවෙන් යම් කෙ



# ිළිමවල
# ට ලැබෙන
# යව් සහ
# ආසන

ැඳින්වේ. අනුරාධපුර මහඉලුප්පල්ලම
 හිටි පිළිමය දැනට ලංකාවේ
ිළිමය ලෙස සලකයි. මෙම පිළිමය
කිරිගරුඬ විශේෂයකින් අමරාවතී
ිර්මාණය කරන ලද්දකි. මාලිගාවෙල
න හිටි පිළිමය, බුදුරුවගල හිටි පිළිමය
 ඇති හිටි පිළිමය ලංකාවේ ඇති හිටි
කි.

හන්සේ වැඩ හිඳින ආකාරය
ළසට නිර්මාණය කරන ලද පිළිම
ැඳින්වේ. කොළඹ කෞතුකාගාරයේ
ල් 9 ක් උස තොළුවිල බුද්ධ ප්‍රතිමාව
ක්ෂා වී ඇති පැරණිම හිඳි පිළිමය
ති මුද්‍රාවෙන් නෙළා ඇති අනුරාධපුර
හි ඇති සමාධි බුදු පිළිමයද,
ල් විහාරයේ ඇති පිළිම හතරින්
න්නරුව වටදාගෙයි බුදු පිළිම හතරද
වන් නිර්මාණය වී ඇත.

මුල් තැන දෙන්නා වූ ශ්‍රී ලාංකික
ානුයෝගීව බුදුරදුන් සිහිපත් වන
 නිමවා ගැනීමට කැමැත්තක් දක්වා
වේ. හිඳි පිළිම තැනීමේදී මුචලින්ද
වරණය ලබමින් සය වැනි සතිය

බුදුරදුන් ගෙවූ ආකාරය දක්වීමද තවත් භාවිත වූ ක්‍රමයකි. මෙහිදී ධ්‍යාන මුද්‍රාවෙන් බුදුන් වහන්සේ වැඩ සිටිනා ආකාරයෙන් නා පෙණ ගොබ පිළිමයේ හිස මතින් ඊට ආවරණ සපයන අයුරින් මෙමගින් දක්නට ලැබේ. සේරුවාවිල ප්‍රදේශයේ මේ ගණයට අයත් පිළිමයක් දක්නට ලැබේ.

බුදුරජාණන් වහන්සේ සැතපෙන ඉරියව්වෙන් නිර්මිත පිළිම ඔත් පිළිම ලෙස හැඳින්වේ. විශාලතම ඔත් පිළිමය ලෙස පොළොන්නරුව ගල් විහාරය හෙවත් උත්තරාරාමයේ ඇති අඩි 46 ක් දිග සැතපෙන පිළිමය සලකනු ලබයි. දඹුල්ල දෙව්රජ විහාරයේ ඇති ශෛලමය ඔත් පිළිමය රන් ආලේපිතව නිර්මාණය කොට ඇත. තවද දෙගල්දොරුව ලෙන් විහාරයේත්, කැලණිය පැරණි විහාරයේත් ඔත් පිළිම දැකගත හැකිය.

බුදු පිළිම නිර්මාණයේදී ආසන වර්ග කිහිපයක්ද භාවිතයට ගනු ලැබේ. මෙම ආසන වර්ග හතරකි.

1. පද්මාසනය, 2. වීරාසනය, 3. භද්‍රාසනය, 4. වජ්‍රාසනය.

පද්මයක් ආකාරයට හිඳ ගැනීම පද්මාසනයයි. දණහිස නමා පතුල් උඩු අතට හැරුණු පරිදි දකුණු පාදය වම් කලවය උඩත්, වම් පාදය දකුණු කලවය උඩත් සිටින ආකාරයෙන් හිඳීම පද්මාසනයයි. ධ්‍යානාසනය හා කමලාසනය යන නම්ද මෙයට භාවිත කෙරේ.


දකුණු ඉන්දියාවේ හා ශ්‍රී ලංකාවේ බුදු පිළිමවල බහුලවම දක්නට ඇත්තේ වීරාසනයයි. කලවා එකට තැබූ විට වම් පාදය දකුණු පාදය යටින් හා දකුණු පදය වම් පාදය උඩින් සිටින සේ තබා හිඳ ගැනීම වීරාසනය නම් වේ.

භද්‍රාසනය යන්න අනෙක් ආසන වර්ගය වේ. මෙහි තේරුම නම් යහපත් වූ සුබ අසුන යන්නයි. තරමක් උසට තනන ලද විශේෂ ආසනයක් මත හිඳ කලවා දෙපසට විහිදුවා ආසනයෙන් පහත වැටෙන පාදෙක පීඨයක මත සිටින අයුරින් නිරූපණය කොට ඇත්තේ භද්‍රාසනයයි. මෙම භද්‍රාසනය සහිත පිළිම විවිධ රටවලින් ලැබී ඇතත් ලංකාවේ මෙම පිළිම දුලභය. අම්බලන්තොට රිදියගම විහාර භූමියෙන් භද්‍රාසන සහිත ලෝහ ප්‍රතිමාවක් ලැබී ඇත. එයද විදේශිකයන් ගෙන ආවා යැයි විචාරකයන්ගේ මතයයි.


ප්‍රතිමා කලාවේ බෙහෙවින් ප්‍රචලිත වන්නේ වජ්‍රාසනයයි. දණහිස නමා දෙපතුල් උඩු අතට දෙකලවා මත තබා ඒ මත දෙ අත්ල තබා සිටින වජ්‍රාසන ක්‍රමයයි. මෙයින් භාවනානුයෝගී ස්වරූපය සංකේතවත් කරයි. දැඩි අධිෂ්ඨානය, සත්‍යාවබෝධය බෝරුකට පිටදී වැඩ සිටීම වැනි ආකාර මෙයින් ප්‍රදර්ශනය වේ.


මේ ආකාරයට බුදු පිළිම නෙළීමේ කාර්යය තුළදී ආසන සතරක් සහ ඉරියව්ව වර්ග තුනක් භාවිත කරමින් එයින් විවිධ අර්ථකථනයක් දක්වමින් ලෝකවාසී බෞද්ධ ජනතාවගේ පහන් සංවේගය වර්ධනය කොට එමගින් ශ්‍රද්ධාව ඉස්මතු කරවීමට හෙළ කලාකරුවා මහත් වෙහෙසක් දරා තිබෙන බව මැනවින් පැහැදිලි වේ.

**ප්‍රකාශ් සංදීප්**
**සිරි දළදා දහම් පාසලේ ආචාර්ය**



ක්‍රෝධය සිතෙහි දැඩි කොට බැඳ ගනිත්ද ඔවුන්ගේ වෛරය නොසන්සිඳේ.'' - (ධම්ම පදයේ 3 වන ගාථාව)





# බුදු පිළිමවල දක්නට ලැබෙන ඉරියව් සහ ආසන

අප මහා සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේ උද්දේසික වශයෙන් පිදීම සඳහා ලෝකවාසී බෞද්ධ ජනතාව යොදගනු ලබන්නේ බුදු පිළිමයයි. ලොව පළමු බුදු පිළිමය නිර්මාණය කිරීමේ ගෞරවය හිමිවන්නේ කණිෂ්ක රජතුමාටය.

ථෙරවාදී බෞද්ධ සම්ප්‍රදයට අයත් විශිෂ්ට ගණයේ බුද්ධ ප්‍රතිමා දක්නට ලැබෙන්නේ ශ්‍රී ලංකාවේය. ලංකාවේ බුදු පිළිම ආන්ධ්‍රා ශෛලියේ ආභාෂය ලබා ප්‍රභවය වූවක් බව සාමාන්‍ය පිළිගැනීමයි.

සිංහල බුද්ධ ප්‍රතිමා ශිල්පීහු සිය නිර්මාණයන්ට දේශීයත්වය සමාරෝපණය කළ මුල් අවධියේ ලක්දිව බුද්ධ පිළිමවලට මහායාන ආභාෂය ලැබී ඇත්තේ අල්ප වශයෙනි. මෙයට හේතුව ලෙස දක්වනු ලබන්නේ අනුරාධපුර මහාවිහාර සම්ප්‍රදය අති ප්‍රබලව පැවැතීමය. නමුත් පොළොන්නරු අවධියේ සිට මහායාන සම්ප්‍රදය මගින් කළ බලපෑම වැඩිවත්ම බුදු පිළිමය කෙරෙහිද එම ආභාෂය දක්නට ලැබේ. එහිදී එම බුදු පිළිමවල විදේශීය ලක්ෂණද ගැබ්ව ඇති අයුරු දක්නට ලැබේ.

ඉරියව්ව අනුව පිළිම වර්ග තුනක් දැකගත හැකිය. ඒවා නම්,

1. හිටි පිළිම, 2. වැඩ හිඳින පිළිම, 3. ඔත් පිළිම.

සිටගෙන සිටින ඉරියව්වෙන් නෙළා ඇති පිළිම හිටි පිළිම ලෙස හැඳින්වේ. අනුරාධපුර මහඉලුප්පල්ලම ඇති අඩි 6 ක් උස හිටි පිළිමය දැනට ලංකාවේ පැරණිතම හිටි පිළිමය ලෙස සලකයි. මෙම පිළිමය දකුණු ඉන්දියානු කිරිගරුඬ විශේෂයකින් අමරාවතී සම්ප්‍රදයට අනුව නිර්මාණය කරන ලද්දකි. මාලිගාවෙල බුදු පිළිමය, අවුකන හිටි පිළිමය, බුදුරුවගල හිටි පිළිමය හා ගල් විහාරයේ ඇති හිටි පිළිමය ලංකාවේ ඇති හිටි පිළිමවලින් කිහිපයකි.

බුදුරජාණන් වහන්සේ වැඩ හිඳින ආකාරය නිරූපණය වන ලෙසට නිර්මාණය කරන ලද පිළිම හිඳි පිළිම ලෙස හැඳින්වේ. කොළඹ කෞතුකාගාරයේ ඇති අඩි 5 යි, අඟල් 9 ක් උස තොළුවිල බුද්ධ ප්‍රතිමාව දැවට හොඳින් සුරක්ෂා වී ඇති පැරණිම හිඳි පිළිමය වේ. එමෙන්ම ධ්‍යානි මුද්‍රාවෙන් නෙළා ඇති අනුරාධපුර මහමෙව්නා උයනෙහි ඇති සමාධි බුදු පිළිමයද, පොළොන්නරු ගල් විහාරයේ ඇති පිළිම හතරින් දෙකක්ද, පොළොන්නරුව වටදගෙයි බුදු පිළිම හතරද හිඳි පිළිම ඉරියව්වෙන් නිර්මාණය වී ඇත.

ත්‍රි ශික්ෂාවට මුල් තැන දෙන්නා වූ ශ්‍රී ලාංකික බෞද්ධයන් භාවනානුයෝගීව බුදුරදුන් සිහිපත් වන ආකාරයෙන් බුදුරුව නිමවා ගැනීමට කැමැත්තක් දක්වා ඇති බව පැහැදිලි වේ. හිඳි පිළිම තැනීමේදී මුචලින්ද නාග දරණයෙහි ආවරණය ලබමින් සය වැනි සතිය

බුදුරදුන් ගෙවූ
වූ ක්‍රමයකි. ...
වහන්සේ වැඩ
ගොබ පිළිම...
අයුරින් මෙම...
ප්‍රදේශයේ මේ
ලැබේ.

බුදුරජාණ...
ඉරියව්වෙන් නි...
හැඳින්වේ. විශ...
පොළොන්නරු...
උත්තරාරාමයේ...
පිළිමය සලකනු...
ඇති ශෛලමය...
නිර්මාණය කෙ...
ලෙන් විහාරයේ...
ඔත් පිළිම දැක...

බුදු පිළිම ...
කිහිපයක්ද භාවි...
වර්ග හතරකි.

1. පද්මාසනය, ...
4. වජ්‍රාසනය.

පද්මයක් ...
පද්මාසනයයි. ...
හැරුණු පරිදි ...
උඩත්, වම් පාද...
ආකාරයෙන් හිඳි...
හා කමලාසනය
කෙරේ.

දකුණු ඉන්දි...
පිළිමවල බහුලව
කලවා එකට තැ...
යටින් හා දකුණු
සේ තබා හිඳ ගැ...




පැරදවුයේය. මා සතු දේ පැහැර ගත්තේය යනුවෙන් යම් කෙනෙකු ක්‍රෝධය සිතෙහි දැඩි කොට බැඳ ගනිත්ද ඔවු...



# මිනිසෙකු මරා දැමීමේ වරදට තවත් මිනිසෙකුට මරණීය දණ්ඩනය ලබාදීම බුදු දහමට අනුව එකඟද..?

### රාජකීය පණ්ඩිත මිරිස්සේ ගුණසිරි මාහිමිපාණන් වහන්සේ දුන් පිළිතුරු



❐ බුද්ධෝත්පාද කාලවල පසේ බුදුවරුන් පහළ වෙනවාද?

ථෙරවාද බුද්ධ ධර්මයෙහි අයුරු නම් බුද්ධෝත්පාද කාලයන්හි පසේ බුදුවරුන් පහළ වීමට බැරිය. මහායාන සූත්‍රවල නම් කෙළ ගණන් පසේ බුදුවරුන් පිරිවරාගෙන සම්මා සම්බුදුවරුන් බණ වදාරන බවක් දක්වේ. ඔබ සඳහන් කරන කතාව මහායාන කතාවක් ආශ්‍රයෙන් ගෙතුණක් විය හැකිය.

❐ බුදුරදුහු යශෝධරාව අතහැර යාමෙන් ඇයට වූ ශෝකය ඉමහත්ය. එයින් බුදුරදුන්ට පවක් සිදුවූයේ නැද්ද?

සිදුහත් කුමරුන් සිය බිරිඳ වූ යශෝධරාව අතහැර ගියේ ද්වේෂ සහගත සිතින් නොව සියලු සත්ත්වයන් කෙරෙහි පතළ වූ මහා කරුණාවෙනි. එහෙයින් පවක් සිදුවීමට ඉඩක් නැත. බුදුන් රහතුන්ට හා වෙනත් ආර්ය පුරුෂයන්ට පව් සිදු නොවේ. බුදුන් රහතුන්ට නම් පින් සිදු නොවේ. එහෙයින් 'පුඤ්ඤ පාපපහීණ' යනු උන්වහන්සේලාට යෙදෙන ගුණ පදයකි. කුසලා කුසලකම්ම සංඛ්‍යාත සංස්කාරයන් අවිද්‍යාව නැසීමෙන් ප්‍රහීණ කළ හෙයිනි.

"නීතිගරුකව කටයුතු කිරීම හැම අතින්ම හිතකරය - ගග්ග ජාතකය"

## පසේ බුදුවරු පහළ වන්නේ කිනම් යුගයකද..?

## බිත්තර කෑමෙන් ප්‍රාණඝාත අකුසලයක් සිදුවෙනවාද..?

## සූත්‍ර සහ පිරිත් යන දෙකින් වඩා බලසම්පන්න කුමක්ද..?

## ප්‍රාර්ථනාවක් නොකර කරන පිංවලින් ප්‍රතිඵලයක් ලැබෙනවාද..?

❒ නිවන් අවබෝධ කරගැනීමට තැත් කරන බෝධියෙන් එක්තරා බෝධියකට පැමිණිය යුතුය. ගිය ආත්මවල තමන් පැතූ බෝධිය කුමක්දැයි පෘථග්ජන මනුෂ්‍යයා මේ ආත්මයේදී දැනගන්නේ කෙසේද?

එබඳු ප්‍රාර්ථනාවක් ස්ථිර වශයෙන් කළ තැනැත්තා හට පසු පස ආත්ම භාවයන්හිදී නෛසර්ගික වශයෙන් (ඉබේම වාගේ) තම ප්‍රාර්ථනාව සිතට එයි. එක ආත්ම භාවයකදී ප්‍රගුණ කළ දෙය අනතුරු අත්බැව්හිදී පුරුද්දෙන් එන්නාක් මෙනි. එයට සාක්කි කොතෙකුත් ලෝක ඉතිහාසයෙහි සටහන් වී ඇත. භවයෙන් භවයට මුහුකුරා යන මේ පැතුම් ශක්තිමත්ව ගොස් තමන් ප්‍රාර්ථනා කරන බෝධියකින් අදහස මුදුන් පැමිණේ. සත්ත්වයා වනාහි භවයෙන් භවයට වැළ නොකැඩී ගලා යන නාමරූප පරම්පරාවක් හෙයිනි.

❒ සූත්‍ර හා පිරිත් දෙකේ වඩා බලසම්පන්න කුමක්ද? වැඩියෙන් මෙනෙහි කළ යුත්තේ කුමක්ද?

පිරිත් යනු සූත්‍ර පිටකයෙන් තෝරා ගන්නා ලද සූත්‍ර ධර්ම මැයි. පිරිත් වශයෙන්, ආරක්ෂා වශයෙන් නිතර භාවිතයට තෝරා ගත් හෙයින් සූත්‍ර ධර්මම පිරිත් නමින් හැඳින්වේ. අටවිසි පිරිත, ජිනපංජරය ආදිය පිරිතට එකතු කරන ලද සත්‍ය ක්‍රියා පාඨයෝයි.

❒ ප්‍රාර්ථනාවක් නොකර කරන පින්වලින් ප්‍රතිඵල ලැබේද?

දානශීලාදි පින්වලින් ප්‍රාර්ථනා කළද, නොකළද ලැබෙන ස්වභාවික විපාක ඇත. බුදුවීම් ආදී විශේෂ කාර්යයනට නම් විශේෂ ප්‍රාර්ථනා තිබිය යුතුය. ප්‍රාර්ථනා නොකළත් නොලැබෙන නිවන් සුව නම් ප්‍රාර්ථනා කිරීම වටී.

ප්‍රාර්ථනා සංස්කෘතිය එක්තරා යුගයකදී බෞද්ධ සාහිත්‍යයෙහි නොයෙක් අතට විහිදී ගිය අයුරු පත පොතෙහි එන කථා ප්‍රවෘත්තීන්ගෙන් පෙනේ. සමහර ප්‍රාර්ථනා යාඥාවන්ගේ මුහුණුවර ගෙන තිබෙන බව නම් නොකියාම බැරිය.

❒ බොහෝ ගෙවල්වල හා පන්සල්වලද විනෝදය පිණිස මයින්, ගිරා, ගෝණ, මුව ආදි සතුන් ඇති කරනු දක්නට ලැබෙයි. එයින් සිදුවනනේ පවක්ද? පිනක්ද?

සතුන්ට අනුකම්පාවෙන් ඔවුන් සිය කැමැත්තෙන්ම නවාතැන් ගැන්වීමද, ඔවුන්ට ආහාර පානාදියෙන් සංග්‍රහ කිරීමද පිනකි. ඔවුන් බලෙන් කූඩුවල හිර කරගෙන තමන් විනෝදවීම නම් පිනක් යයි කිව නොහැකිය. තිරිසන් සතුන් පවා නිදල්ලේ විසීමට කැමැති හෙයිනි. අසරණ සතුන්ගේ තැන තමුන් සිට කල්පනා කිරීමෙන් මෙය කා හට වුවද මැනවින් වැටහේ.

❒ පඨවි, ආපො, තෙජො, වායො යන ධාතූන් සතර එක්වීමෙන් පෙර නොසිටි සත්ත්වයෙක් අලුතින් පහළ වෙනවාද? එසේ නැතිව තවමත් සැරිසරන්නේ මුලින් සිටි සත්ත්වයෝමද?

පඨවි ආදි ධාතූන්ගේ සංකලනයෙන් අමුතුවෙන් සත්ත්වයකු හටගැනීමක් ගැන බුදුදහමේ නොඉගැන්වේ. එය බුදු දහමට පටහැනි භෞතිකවාදීන්ගේ මතිමාත්‍රයකි. අවිද්‍යාදී අතීත භවයට අයත් හේතු පසක් නිසා පටිසන්ධිඥඥණාදී වර්තමාන පලපඤ්චකය මේ භවයෙහි පහළ වේ යයි උගන්වන පටිච්ච සමුප්පාද ධර්මය එසේ භවයෙන් භවයට සංක්‍රමය වන්නේද එම සත්ත්වයාමද නොව වෙන අමුතුම සත්ත්වයෙක්ද නොවේ යයි උගන්වයි. 'නවසො නව අඤ්ඤො' යනු එහිලා යෙදෙන න්‍යායයි. බුදුදහමෙහි පරමාර්ථ වශයෙන් සත්ත්වයෙක් පුද්ගලයෙක් නොලැබේ.

❒ අටසිල් සමාදන් දිනවල ගිහියන් විසින් අංග දෙක රක්ෂා කිරීමේදී උදේ ආහාර පිණිස තේ, කෝපි පමණවත් ගැනීම නුසුදුසුද? එසේ නම් දවල් දන් ගන්නා තුරු පානය කළ හැක්කේ ජලය පමණක්ද?

මෙහි අංග දෙක නම් පත්තපිණ්ඩිකාංග, එකාසනිකාංග දෙකය. ඔබ අහන ප්‍රශ්නය එකාසනිකාංගය සම්බන්ධයෙනි. පොතෙහි එන්නේ බෙහෙත් පිණිස (ගිලන් පස වශයෙන්) මිස ආහාර පිණිස කිසිවක් නොගත යුතු බවය. තේ, කෝපිවලට වඩා අෂ්ටවිධ පානයන්ගෙන් එකක් ගන්න. එය සෞඛ්‍යයටද හිතකරය. සිල් ඉටා ගන්ට පළමුවද ගිලන්පස ගැනීමේ වරදක් නැත. එයින් බිඳෙන සික පදයක් අටසිල් හා දසසිල්වල නැහැ නොවේද? ගිලන් පසකින් පිපාසාව මිස බඩගින්න මකා ගැනීමේ අදහසක් නැත.

❒ ගෞතම බුදුරජාණන් වහන්සේ පෙරුම් පුරන කාලයේදී ස්ත්‍රියක වී උපන්නාද?



"තමාගේ තරමට වඩා උඩඟුව කටයුතු කිරීමෙන් පිරිහේ - විනීල ජාතකය"

බුදු බැව් පතා නියත විවරණ ලැබීමේ පටන් බුදු වනතෙක්ම මහ ‹බෝසතුන් ස්ත්‍රී ආත්මයක නොඉපදීම ධර්මතාවකි.

☐ අප බුදු පියාණන් වහන්සේ පාවහන් පරිභෝග කළ සේක්ද? උන්වහන්සේගේ ශිෂ්‍ය භික්ෂූන් පාවහන් පරිභෝග කරන්නේ මන්ද? බුදුරදුහු එය අනුදූන වදළේද?

බුදුරදුන් පාවහන් පරිභෝග කළ බවක් විශේෂයෙන් සඳහන් නොවන මුත් උන්වහන්සේගේ භික්ෂූන්ට සුදුසු පරිදි පාවහන් පරිභෝග කිරීම අනුදූන වදළ සේක.

☐ අකුසල විපාක සිත් හැම විටකම 'අහේතුක' යැයි ගැනේ. එසේ ගැනෙන්නේ ලෝභ, දෝස, මෝහ යන අකුසල් මුල් එහි නැති නිසා යයි කියති. කුසල විපාක සිත් වනාහි අහේතුක සහේතුක දෙකොටසක් වේ. මේ මුල් ඇති නැති වීමේ වෙනස මට නොවැටහේ. කරුණාකර එය පැහැදිලි කරන්න?

මේ ගැටලුවට මූල හේතු ශබ්දයේ තේරුම් දෙසාක් වීමය.



කුසලාකුසල විපාක ක්‍රියා නමින් හැඳින්වෙන අහේතුක සිත් අටළොසෙහි නොලැබෙන්නේ හේතු සංග්‍රහයෙහි දැක්වෙන ලෝභාදි හේතු සයයි. එයින් ඒ සිත් අටළොස යම් කිසි හේතුවක් නැතිව ඉබේම ඇතිවන නිසා නොව, හේතු නමින් හැඳින්වෙන ලෝභාදීන් ගෙන් එකක්වත් ඔවුන්ට බල නොපාන හෙයින් අහේතුක නම් වේ. ලෝභාදි ධර්මයන් අභිධර්මයෙහි හේතු නම් වන්නේ යමක් ඇති කරන තේරුම් නොව, ගසකට මුල මෙන් චිත්ත චෛතසිකයන්ට අරමුණෙහි පිහිටා සිටීමට උපකාරී වන හෙයිනි. අභිධර්මයෙහි ධර්මයන් පිළිබඳ අහේතුක සහේතුක ප්‍රභේදය කියන්නේ මේ මූල හේතුන් සම්බන්ධයෙනි.. මේ අහේතුක සිත් දහ අට ගැනද කියන්නට තියෙන්නේ එයමය.

පටිච්චසමුප්පාදයේ හේතුඵල ධර්මය මෙය හා සම්බන්ධ කරගැනීම වැරදිය. එසේ ගැනීමෙන් බුදුදහමේ මූලික සිද්ධාන්තය වූ හැම සංස්කාරයකට හේතුවක් ඇත යන බණ පදයට පහර වැදේ.

කුසලාකුසල විපාක යන්නෙහි විපාක යන පදයෙන්ම ඒ සිත්වලට කුසලාකුසලයක් හේතුවන බවද 'සංඛාර පච්චයා විඤ්ඤාණං' යන්නෙහි එන හේතුඵල සම්බන්ධය මේ සිත් අටළොසට යෙදෙන බවද වෙන් කොට දැන ගන්න. හේතු යන පදයෙහි දෙවැදෑරුම් තේරුම්-බේරුම් කරන විට කාරණය හොඳින් පැහැදිලි වේ.

☐ 1. බුදුදහම නම් හේතුඵල ධර්මයකි. එසේ නම් අභිධර්මයේ අහේතුක සිත් 18 ක් සඳහන්ව ඇත්තේ කෙසේද?

2. ත්‍රිහේතුක කුසල් කියන්නේ මොනවාටද? මෙහි සහ අනිකුත් කුසල් සිත්වල වෙනස කිම?

3. ත්‍රිහේතුක ප්‍රතිසන්ධික කියන්නේ කුමකටද? ඥාන සම්ප්‍රයුක්ත විපාක සතරය කියා සඳහන් වේ. මෙය පැහැදිලි කරන්න.

1. මේ සම්බන්ධයෙන් නම වැනි ප්‍රශ්නයට දී ඇති පිළිතුරම ප්‍රමාණවත්ය.

2. අලෝභ, අදෝස, අමෝහ යන කුසල හේතුන්ගෙන් යුත් කුසල් ත්‍රිහේතුක කුසල නමින් හැඳින්වේ. පරිත්‍යාග චේතනාවෙන් ලෝභය මැඬගෙන ප්‍රතිග්‍රාහකයා කෙරෙහි මෛත්‍රියෙන් දීමේ අගය සලකමින් යමක් දෙන විට ත්‍රිහේතුක කුසලයක් සිදුවේ. දීමේ ආශා නොසලකා කර්මය කර්ම ඵලය නොතකා දෙන විට අමෝහ නම් වූ කුසල මෝහය නොයෙදේ. එහෙයින් එය අහේතුක වේ. වෙනසකට තිබෙන්නේ ඥානසම්ප්‍රයුක්ත වීම නොවීම පමණකි.

3. යම් පිනක් කරන විට එය හා යෙදෙන අලෝභ, අදෝස, අමෝහ යන කුසල හේතු තුන නිසා ලැබෙන විපාකයෙන් ඇති වන ප්‍රතිසන්ධිය 'ත්‍රිහේතුක ප්‍රතිසන්ධි' නම්. ඥාන සම්ප්‍රයුක්ත විපාක සතර යන්නෙන් හැඳින්වේනේ මේ කුසල් මුල්වලින් යුතු 'සොමනස්ස සහගතං ඤාණසම්ප්‍රයුක්තං අසංඛාරික මෙතං, සසංඛාරිකමෙතං' යනාදීන් සංගෘහිත මේ විපාකයන් සතරය. අහේතුක කුසලයන්ගෙන් ලැබෙන ප්‍රතිසන්ධියට වඩා ත්‍රිහේතුක ප්‍රතිසන්ධිය උසස්ය. ප්‍රණීතය. පශ්චිම භාවිතයන්ගේ, එනම් එම ආත්මයේදීම නිවන් ලබන සත්ත්වයන්ගේ ප්‍රතිසන්ධිය ත්‍රිහේතුකය.

☐ අවමඟුලකදී පාවිච්චි කරන 'මියගිය අයට නිවන් සැප ලැබේවා!' යන පාඨය ඇතුළත් දැන්වීම් ප්‍රදර්ශනය කිරීමෙන් දකින අයට මිස මියගිය අයට පිනක් සිදුවේද?

මරණයක් දුටු විට බෞද්ධයකු විසින් විසින් සිහිපත් කළ යුත්තේ සංස්කාරයන්ගේ අනිත්‍යතාවයි. එය විදර්ශනා භාවනාවට අයත් මහා පිනකි. 'නිවන් සුව ලැබේවා!' යි සිතීමෙහිද සංස්කාරක තත්ත්වය එනම්, සසර දකක් බව එහි මුල තණ්හාව බව ගැබ්වී ඇත. මියගිය අයට නිවන් සැප ලැබේවායි පැතීමෙහි දුක් විඳිමින් සිට මැරී මියගිය අය කෙරෙහි කරුණාවද, තමන් විඳිනා දුක් මෙනෙහි වීමෙන් විදර්ශනාවද සම්පූර්ණ වෙයි. මමද මෙබඳු මරණයකට ගොදුරු වෙමියි තමන්ගේ ජීවිතයෙහි ඇති දුර්වලතා අත හැර නිවන් ලබන මග සපිරීමට මෙවැනි ප්‍රාර්ථනා ප්‍රයෝජනවත් වේ.

☐ පන්සිය පනස් ජාතකයේ සිද්ධි බොහෝ සේ ඉන්දියාවේ වීමට හේතු මොනවාද?

ජාතක සාහිත්‍යය හැදී වැඩී ගියේ ඉන්දියාවේ නිසයි. ඉන්දියාවේ උපන් බුදුරජාණන් වහන්සේ ඉන්දියාවේ කථාවලින්ම ඉන්දියාවේ මිනිසුන්ට ධර්මය ඉගැන්වීම පහසු බව දැන සිටි හෙයිනි.

☐ සිතා විනිශ්චය නොකළ හැකි එහෙයින්ම නොසිතිය යුතු කරුණු සතරක් බුදුරජාණන් වහන්සේ දේශනා කර ඇත. එනම් බුද්ධ විෂයය, ධ්‍යාන විෂයය. කර්ම විපාක විෂයය, ලෝක විෂයය යනුයි. අපෙ හාමුදුරුවනේ... මේ ගැන තවත් පැහැදිලි කර දෙන්න?

මේවා ලියාද අවසන් කිරීම අමාරුය. සාමාන්‍ය පුහුදුන් සිතට නොවැටහෙන මෙවැනි දෙය තත්ත්වාකාරයෙන් අවබෝධ කිරීමට නම් භාවනා ප්‍රතිපදාවෙන් ගොස් නිවන් අවබෝධ කළ යුතුය. කඳු පාමුලදී නොපෙනෙන දේවල් කඳු මුදුනේදී පහසුවෙන් පෙනෙන්නාක් මෙන් පුහුදුන් අපට නොපෙනෙන මෙවැනි දේවල් නුවණ පිළිබඳ කන්දේ මුදුනට නැගි විට ඉතා පහසුවෙන් පෙනෙනු ඇත.

☐ බුදුන් වැඳීමට පිළිමයක් අවශ්‍යමද, නැද්ද?

බුදු පිළිමයක් අවශ්‍යම නොවේ. මුල් කාලවලදී බුදුරදුන්ගේ පිළිම සෑදීමට බෞද්ධයෝ බය වූහ. සිරිපා සලකුණ වැනි සංකේතයක්ම සාදගෙන ඒ පාඩුව පිරි මසා ගත්හ. පසුව බෞද්ධ කලාව දියුණු වත්ම බුද්ධ ප්‍රතිමා තනාගෙන වැඳුම් පිදුම් කිරීමට

පටන් ගත් ඔවුහු බුදුපිළිම උද්දේසික චෛත්‍ය වශයෙන් බෞද්ධ සිද්ධස්ථානයකට අවශ්‍ය අංගයක් ලෙස සැලකීමට පුරුදු වූහ.

සිද්ධස්ථානයක ත්‍රිවිධ චෛත්‍ය අදත් දක්නට ලැබෙන්නේ එහෙයිනි. බෞද්ධයෝ ශාරීරික චෛත්‍ය වශයෙන් දාගැබද, පාරිභෝගික චෛත්‍ය වශයෙන් බෝධීන් වහන්සේද, උද්දේසික චෛත්‍ය වශයෙන් ප්‍රතිමා වහන්සේද පිහිටුවා පිළිවෙළින් දාගැබ, මහබෝ පිළිම වැඳීමට ඇබ්බැහි වූහ.

බාහිර සංකේතයක් නැතිව සිතින්ම බුදුරදුන්ගේ උත්තරීතර ගුණයන් සිහි කොට වැඳීමෙන් පුණ්‍ය ඵලයෙහි අඩුවක් වෙතැයි කියනු බැරිය. මෙය කාටත් කළ හැකි වැඩක් නොවේ.

බුදුන් වැඳීමේ හා බුදු පිළිම වැඳීමේ වෙනසද මෙහිලා මතක් කරගත යුතුය. පිළිමය තුළින් කැපී පෙනෙන බුදු ගුණයම සිතට නගා ගෙන වැඳුම්-පිදුම් කරන අය බුදුන් වැඳීමේ නියම ඵලය ලබති.

**❒ මේ කාලයේ ලංකාවේ සෝවාන් පුද්ගලයෝ නැතැයි සමහරු කියති. එය එසේද?**

මේ කාලය අධිගම ලබන්ට බැරිය යනු පිළිගත නොහැකිය. බොදු පිළිවෙත නොඅඩුව පුරන, පව් නොකරන, හොඳ ගිහි පැවිදි අය අදත් ලංකාවේ වෙසෙති. ඔවුන්'තර සෝවාන් පුද්ගලයන් සිටින්ට බැරි නැත.

නියම ආර්යය පුද්ගලයෝ තමන් ලත් අධිගමනයන් නිකරුණේ කියා නොපාති. එහෙයින් ඔවුන් හැඳින ගැනීම ඉතා දුෂ්කරය.

මෙය හැර අසවල් කාලයේ මග ඵල ලැබිය හැකිය. අසවල් කාලයේ බැරි යයි බුදුරදුන් වදාළ තැනක් නැත. 'ඉමෙච සුභද්ද, භික්කු සම්මා විහරෙයුං න සුඤ්ඤො ලොකො අරහන්තෙහි අස්ස' යන්නෙන් බුදුරදුන් සුභද්‍ර භික්ෂූන් අමතා වදාළේ යම්තාක් භික්ෂූහු හොඳින් සිල් රැකගෙන සිටිත් නම් ඒතාක් ලෝකය රහතුන්ගෙන් හිස් නොවන බවය.

රහත් බව හෝ ඉන් පහළ මාර්ගඵල ලැබීමේ ප්‍රතිපදාමාර්ගය චතුස්සත්‍ය අතර සතර වැන්න වූ සම්මාදිට්ඨි ආදී ආර්ය අෂ්ටාංගික මාර්ගයයි. එකී නෛර්යාන්තිකත්වයට හෙවත් එය පිළිපැදීමෙන් නිවන් ලැබිය හැකි බවට කාල නියමකයක් නැත. හැබැයි එයින් ප්‍රයෝජන ගන්නන් කලින් කල අඩු වැඩි විය හැකිය.


අටුවාවන්හි එන විස්තරයටද අනුවද අදත් ආර්ය පුද්ගලයන් සිටිය හැකිය. මනෝරථපූරණී අට්ඨකතිෂාත වර්ණනාවේ එන කාලනිර්ණය අනුව අදත් සෝවාන් සෙද ගැමි, අනගැමි පුඟුලන් සිටිය හැකිය. මේ නිගමනයට විරුද්ධව නගින පෙළක් හෝ අටුවාවක් මූළ සාහිත්‍යයෙහිම නැත.

කරුණු මෙසේ හෙයින් රටක් වෙන් කොට එහි අසවල් රටේ සෝවාන් ආර්යයෝ නැතැයි කීමද සිටිතියි කීමද උගහටය. එහෙයින් ලංකාවේ මෙකල සෝවාන් පුද්ගලයෝ නැත්තාහ යන්න කවුරුන් කීවද ඔප්පු නොවන බව මෙහිලා විශේෂයෙන් සඳහන් කරමි.

**❒ මිනිසකු මරා දැමීමේ වරදට තවත් මිනිසකුට මරණීය දඬුවම දීම බුදු දහම අනුව සුදුසුද?**

මෙය සිදුවිය යුතු නැත. වරදට දඬුවම් දෙන්නේ කරුණු කීපයක් උඩය. සමාජයේ ආරක්ෂාව සැලසීම, වරද කිරීමේ ආදීනව මිනිසුන්ට පෙන්වීම, කළ වරදට දඬුවම් දීම යන මේවා ඉන් ප්‍රධානය. එයින් තුන්වැන්න ඉටු නොවන හෙයින් මෙවැන්නක් සිදුවිය යුතු නැත. මිනියක් මරා දඬුවමින් බේරීම එතරම් පහසු කාර්යයක් නොවූණද මිනීමරුවන් බේරී යද්දී අහිංසකයන් නීතියේ රැහැනට හසුවුණු වාර කොතෙකුත් අධිකරණ ලෝකයේ වාර්තා වී ඇත.

බුදු දහමට අනුව කියන්නට තිබෙන්නේ 'නිරපරාදේ කෙනෙකුන් මරණ දඬුවම ලබන්නේ මේ ආත්මයේදීම



කලින් වතාවක හෝ මීත් පෙර ආත්ම බවයෙකදී හෝ එවැනි දඬුවමකට තුඩු දෙන වරදක් කර තිබී එහි විපාකය මෙහිදී ලත් බවය. එයින් පුනරුත්පත්තියක් තිබේද යන ප්‍රශ්නයද ඉබේම විසඳේ.

**❒ බිත්තර කෑමෙන් නියම ප්‍රාණඝාත අකුසලයක් සිදුවේද?**

කරණීය මෙත්ත සූත්‍රයෙහි මෙත් වැඩීමේ ප්‍රතිපත්තිය උගන්වන්නේ "භූතාවා සම්භ වේසී වා සබ්බේ සත්තා..." යනාදී උපන් සත්ත්වයන් කෙරෙහි මෙත් ඉපදීමට බලාපොරොත්තුවෙන් දළබුවෙහි හෝ බිත්තර වැනි, තැන්වල වෙසෙන සතුන්ද ඇතුළත් කොටය. එහෙයින් ඇතුළේ සතෙකු සිටින බව දන දන බිත්තර කෑමෙන් ප්‍රාණඝාතයට අසු නොවේ යයි කිව නොහැකිය. කිකිළිය රැක්කත් පැටවුන් හට නොගන්නා බිත්තර හා පරණ වීම නිසා ඇතුළේ සත්ත්ව බීජය මැරුණු බිත්තර සම්බන්ධයෙන් මේ නීතිය නොයෙදේ.

බිත්තරවල ඇති පෝෂණයම ගෙන දෙන වෙනත් ආහාර වර්ග කොතෙකුත් තිබෙනවා නොවේද? ආහාර ගුණ උගන්වන පොතකින් විස්තර බලාගන්න. පණ ඇති බිත්තර කෑමෙන් ප්‍රාණඝාතයෙහි අංග පසම සම්පූර්ණ වන බව කිව හැකිය.

**❒ සෑම දෙයක්ම සිදුවන්නේ කර්මය නිසාද? එසේ නම් මල් පිපෙන්නේත්, ගෙඩි හටගන්නේත් කර්මය අනුවද?**

කර්මය ගැන මෙවැනි ඉගැන්වීමක් නැත. ලෝකය පවතින්නේ ස්වාභාවික නීති පසකට අනුවය. 'පඤ්ච නියාමධම්ම' යනුවෙන් ඉගැන්වෙන්නේ ඒ නීති පසය. සිත් පිත් ඇති සත්ත්වයන්ට කර්ම නියාමය බලපායි. අචේතනික වස්තූන්ට කර්මය බලපාන්නේ නැත. ගස්වල මල්, ගෙඩි හටගන්නේ බීජ නියාමයට අනුවය. (විස්තර නාරද හිමියන්ගේ 'ධර්ම සංග්‍රහ' 102 පිටුවෙන් බලා දන ගන්න.)


**❒ පැරණි බුදු මැදුරක් අලුත් කිරීමේදී පැරණි බුදු පිළිම කඩා බිඳ ඉවත් කිරීමෙන් පව් සිදුවේද? එසේ නම් පවට හිමි වන්නේ කඩන්නා නැතිනම් අනුබල දෙන්නාද?**

කඩන්නාට හෝ කඩවන්නාට පව් සිදුවීමට ඉඩක් නැත. චේතනාව හොඳ හෙයිනි. බුදුරදුන්ගේ ශරීරයෙහි ලේ සෙලවූ දෙදෙනෙකුන් ගැන බෞද්ධ ඉතිහාසය කියයි. ඔහු නම් දේවදත්ත ස්ථවිරයන් හා ජීවක වෛද්‍යවරයාය. දේවදත්තට ආනන්තරීය අකුසලයක් සිදුවූ අතර ජීවකතුමාට එය මහ පිනක් විය. චේතනාවේ වෙනස නිසා එසේ විය. දේවදත්තයන් තුළ ක්‍රෝධයද, ජීවක තුළ බුදුරදුන් කෙරෙහි ගෞරවාන්විත කරුණාවද ක්‍රියාත්මක විය. 'චේතනාහං භික්ඛවේ කම්මං වදාමි' යන දේශනාව මෙහිලා සිහි කළ යුතුය.

**දයා සිරිවර්ධන**

# සදහම් ප්‍රහේලිකා අංක - 102

ජයග්‍රාහී වාසනාවන්තයින් තිදෙනාට දයාවංශ ජයකොඩි පොත් මැදුරින් වටිනා ග්‍රන්ථයක් තිළිණ කෙරේ... දුරකථනය - 011-2695773




## උපදෙස් :

1. මෙය නිවැරදිව හා ඉතා පැහැදිලිව පුරවා තැපැල් පතක අලවා පහත සඳහන් ලිපිනයට එවිය යුතුය.
2. ලිපිනය - සදහම් ප්‍රහේළිකාව (101), 112, දයාවංශ ජයකොඩි පොත් සමාගම, පූජ්‍ය ඇස්. මහින්ද හිමි මාවත, මරදන.
3. පිළිතුරු පත් භාරගන්නා අවසාන දිනය දෙසැම්බර් 30 දය.
4. ජයග්‍රාහකයින් තේරීමේ අවසන් තීරණය ප්‍රධාන සංස්කාරක සතුවේ.
5. ප්‍රහේළිකාවේ අපැහැදිලි තැනක් වේ නම් 071-3391013 අමතන්න.
6. ත්‍යාගය සඳහා විමසීම් සඳහා 011 2695773 (සුසිල්) අමතන්න.

### හරහට

1. ප්‍රධාන ධ්‍යානාංගවලින් එකකි.
2. ත්‍රිවිධ මානයන්ට අයත්ය.
7. පව් කළ ඇත්තෝ යන තැන.
9. පොදුජනයා ගමන් බිමන් යන වාහනය.
13. ධ්‍යාන වර්ගයකි.
14. නාගයාගේ දළ දෙකේ මෙය රැඳී තිබේ.
15. මේවා තිත්ත බව කියැවේ.
17. පෙර රජ දවස සිටි ප්‍රකට රජ බිසවකි.

### පහළට

3. බුදුවරයකු උපත ලබද්දී සලකා බලන ප්‍රධාන සාධකවලින් එකකි.
4. ශක්‍ර දේවේන්ද්‍රයාගේ රියැදුරා ලෙස මොහු සැලකේ.
5. දිය ඈතට ගෙනයාමට මේවා භාවිත කෙරේ.
6. අටලෝ දහමට අයත් වේ.
8. යුද ශක්තිය සඳහා මෙම හමුදවන් යොද ගැනේ.
10. පුරාණ කාලයේ මෙරට මෙබඳු ගෝත්‍රකයන්ද විසූ බව ඉතිහාසයේ සඳහන් වේ.
11. බුදුන් සිඟාලෝවාද සූත්‍රය දේශනා කළේ මොහුව මූලික කොටගෙනය.
12. මිහිඳු හිමියෝ පිරිනිවන් පෑ ස්ථානය මේ නමින් හැඳින්වේ.
13. අහසේ බැබලෙයි.
14. එද බුදුන් දවස දුර්භික්ෂයක් ඇතිවූ නුවර.
16. සමහරු භික්ෂූන් වහන්සේලාව මෙම නමින්ද හඳුන්වති.

### ප්‍රහේළිකා අංක 98 ජයග්‍රාහී වාසනාවන්තයින්ගේ නම්

- කේ. එස්. ආරියරත්න, 28 සී, සැම්සන් මාවත, ඇත්තිලිගොඩ, ගාල්ල.
- ශිරානි අල්විස්, 8/14, 5 මාවත, අරුප්පොල, මහනුවර.
- කේ. ඒ. හේරත්, 185/3, ගලගෙදර පාර, කටුගස්තොට.

## ඔබත් දළදා වරුණට ලියන්න

**දළදා** වරුණ සැම විටම ඔබේ අදහස් උදහස් වලට ගරු කරන පුවත් සඟරාවකි. වසර දොළහකට ආසන්න කාලයක් තිස්සේ "දළදා වරුණ" සමඟින් ප්‍රවීණ ලේඛක මඬුල්ලක් බැඳී සිටින අතර ගිහි පැවිදි ඕනෑම අයෙකු අප වෙත ලබා දෙන කාලීන හරවත් සහ සමාජයට ප්‍රයෝජනවත් වේ යැයි සිතන දහම් ලිපි සඳහාද ඉඩ කඩ ලබා දීමට අප නිරතුරු සැලකිලිමත් වන්නෙමු. එහිදී දළදා වරුණ පුවත්පතේ පළවන සියලුම ලිපි, රචනා ඒ.ඒ. කර්තෘවරුන්ගේ අදහස් මිස දළදා මාලිගාවේ හෝ එහි සංස්කාරකවරුන්ගේ අදහස් නොවන බවද සිහිපත් කරනු කැමැත්තෙමි. තනි පිටුවේ පැහැදිලි අත් අකුරින් ලියන ලද හෝ යතුරු ලියනය කළ ඔබේ බෞද්ධ ලිපිය පහත ලිපිනය වෙත යොමු කළ යුතුය. සෑම ලිපියක්ම බෞද්ධ තේමාවක් ඔස්සේ පිටු 2 කට නොවැඩි වන සේ ලිවිය යුතු බවද සලකන්න.

සංස්කාරක
"දළදා වරුණ" මාධ්‍ය ඒකකය
ශ්‍රී දළදා මාලිගය, මහනුවර

- අන්තර්ජාලයෙන් පසුගිය "දළදා වරුණ" කියවන්න www.sridaladamaligawa.lk වෙබ් අඩවියට පිවිසෙන්න


## දළදා මාලිගයෙන් පණිවුඩයක්

- මෙම සටහන සිහියෙන්, සැලකිල්ලෙන් කියවන්න

1. ඔබගේ සංවර ඇඳුම ඔබේ හැදියාවේ සංකේතයයි.
2. ඔබගේ සංවර ඇඳුම මේ පින්බිම රමණීය කරයි.
3. ඔබගේ සංවරශීලී භාවය මේ පින්බිමට සෝභාවකි. එය ඔබට ගෞරවයකි.
4. දළදා සමිඳු වැඩ සිටින උතුම් පින්බිමට එනවිට ඔබ සැරසී සිටින ඇඳුම් උචිතදැයි සිහියෙන් සිතන්න.
5. ශ්‍රී දළදා මාලිගා පරිශ්‍රයට කොට කලිසම් (පිරිමි, ගැහැනු දෙපිරිසම) පලාපු සායවල්, අත් නැති/කොට හැට්ට, දණහිසෙන් ඉහළට වන සේ කොට වූ සායවල්, ඇඟ පසු පෙදෙස නිරාවරණය වන සේ වූ ඇඳුම් යනාදියෙන් සැරසී ඒමෙන් වළකින්න.
6. ඔබ දළදා මාලිගාවට පැමිණෙන විට චාම් ලා පාට ඇඳුමෙන් සැරසෙන්න.
7. තද පාට (කළු) ඇඳුම් පින් බිමට නොහොබින බව තේරුම් ගන්න.
8. ඇඳුම ඔබේ චරිතය කියාපාන කැඩපතක් බව සිතන්න.
9. දළදා මාලිගාව පින් බිමක් මිස පෙම්වතුන්ගේ පාරාදීසයක් නොවන බව සිහියට ගන්න.
10. ඔබට ඇත්තේ දෙඇසක් වුවද ඔබ වටා ඇස් දහසක් ඇති බව මෙනෙහි කරන්න.

ඔබ හැසිරිය යුත්තේ හැඟීම්වලට වහල් වී නොව බුද්ධිමත්වය. මෙම කරුණු අප ඔබ වෙත ඉදිරිපත් කළේ කරුණාවෙන් බවත්, රට භාර ගන්නට සිටිනා මතු පරපුරට ඔබගේ ආදර්ශයක් ලබාදීමට බවත් සිහිකරනු කැමැත්තෙමු.

"අධික ලෝභයෙන් යුතුව යුක්තියට පිටුපාන අය වැනසෙති - සේරිවාණිජ ජාතකය"



# දන්දීමේ අනුහස් ගැන කියවෙන කුම්මාසපිණ්ඩ ජාතකය

නවඅරහාදී මුණි ගුණ ඇති දෙතිස් මහා පුරුෂ ලකුණෙන් හෙබි තිලෝගුරු බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි මල්ලිකා දේවීන් අරභයා මෙම ජාතක කතාව දේශනා කොට වදාළ සේක.

මල්ලිකා දේවිය එක්තරා මාලාකාරයෙකුගේ රුවැති දුවක් වශයෙන් උපන් බැවින් මල්ලිකා දේවී නමින් ප්‍රකට වූවාය. ඇය තම සම වයසෙහි කුමාරිකාවන් සමඟ මල් උයනට යන අතර සර්වඥයන් වහන්සේ පිඬුසිඟා වඩිනු දැක කොමුපිඩු සතරක් පූජා කළාය. සර්වඥයන් වහන්සේ ඒ කොමුපිඩු දානය පිළිගෙන සිනහ පහළ කොට වැඩි සේක. එසේ සිනහ පහළ කළේ කවර කාරණයක් නිසාදැයි ආනන්ද මහතෙරුන් වහන්සේ විමසූ කල්හි ඒ කුමාරිකාව අද සවස් වන විට රජුගේ අගමෙහෙසි තනතුරට පැමිණෙතැයි වදාරා විහාරයට වැඩි සේක.

"වැඩිහිටියන්ට අකීකරු වීම විපතට හේතුවේ - ඉන්ද්‍රගුත්ත ජාතකය"

කෝසල රජ්ජුරුවෝ යුධ පිණිස ගොස් පරාජය වී අසු පිට නැගී මල්වත්ත සමීපයට පැමිණියේය. රජු එනු දැක මාලාකාර කුමාරිකාවෝ බියපත්ව ඒ මේ අත දිව ගියාහුය. එහෙත් මල්ලිකා දේවිය ධෛර්‍ය්‍ය සම්පන්නව, කිසි සැකයක් නැතිව රජු ළඟට පැමිණ, අසුගේ රැන අල්වාගෙන සිටියාය. රජ්ජුරුවෝ කුමාරිකාව දැක, ඔබ සස්වාමික දැයි විමසා සිටියේය. එවිට මල්ලිකා දේවිය, සස්වාමිකැයි කී කල්හි, රජු මල්වත්තට පැමිණ ඇයගේ ඇකයට පිට හිස තබා ගමන් විඩාව නිවාගෙන රජ මාළිගාවට ගොස්, මහපෙරහරකින් මල්ලිකා කුමරිය රජ මාළිගාවට ගෙන්වා ගෙන රුවන් රැසක සිටුවා අභිෂේක ජලය වත් කොට සොළොස් දහසක් බිසෝවරුන්ට අගමෙහෙසි තනතුරෙහි පිහිටවූහ. මල්ලිකා දේවිය රජු කෙරෙහි මහත් ස්නේහ ඇත්තීය. සර්වඥයන් වහන්සේට උපාසිකා තනතුරෙහි ද පිහිටියාය. මෙසේ මල්ලිකා දේවිය අගමෙහෙසියක බවට පත් වූයේ බුදුරජාණන් වහන්සේට පිදූ කොමුපිඩු දානයේ ආනිසංශයෙනැයි ප්‍රකාශ විය.

මෙම කථාව දම්සභා මණ්ඩපයේ රැස් වූ භික්ෂූන් වහන්සේ කතිකා කරමින් වැඩ සිටිනා තැනට බුදුන් වහන්සේ වැඩම කළ සේක. මහණෙනි, මා එන්ට පෙරාතුව කුමන කතාවක් මුල් කොට සිටියාහු දැයි විචාරා, සාකච්ඡාවට බඳුන් වූ පුවත, මා වැනි ලොව්තුරා සර්වඥයන්ට දන් දී එම මොහොතෙහිම ආශ්චර්‍ය්‍ය ලබන්නට හේතු වූයේ යැයි වදාරා පළමු පසේ බුදුන් වහන්සේට දන් දී එවිටම මෙබඳු ආශ්චර්‍ය්‍ය ලද්දේ යැයි වදාරා ඉකුත් වත් දක්වා වදාළ සේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ කෙනෙකුන් රාජ්‍ය කරන සමයෙහි බෝධිසත්වයෝ දුප්පත් කුලයෙක ඉපිද අනුන්ට බැලමෙහෙ කොට ජීවත් වූහ. ලුණු නැති තෙල් නැති කොමුපිඩු සතරක් අරගෙන අනුන්ට බැලමෙහෙ කිරීමට සී සාන්නට යන අතර පසේ බුදුන් වහන්සේලා සතර නමක් පිඬු සිඟා වඩිනු දැක, මා අත තිබෙන කොමුපිඩු පිළිගන්වමියි සිතා ආරාධනා කොට පසේ බුදුවරුන් සතර දෙනා වහන්සේ වැඩමවා රුක් සෙවණක් සමීපයට ගොස් එහි වැලි ගොඩ සතරක් තනා, ඒ වැලි ගොඩ සතරෙහි කොළ එලා වඩා හිඳුවා පැන් ගෙනැවිත් පිළිගන්වා, කොමුපිඩු සතර ගෙන ස්වාමීනි, ගැත්තාට අනුකම්පා පිණිස වැළඳුව මැනවැයි පිළිගැන්වූහ. අනතුරුව පසේ බුදුවරුන් වහන්සේලා අනුමෝදනා බණ වදාළ සේක. බෝසත්තුමා මහත් සන්තෝෂයෙන් මෙසේ දුඃඛිත වූ කුලයෙක නොඉපිද, ධනවත්ව උපදිම්වායි ප්‍රාර්ථනා කළහ. පසේ බුදුවරයන් වහන්සේලා, ඔබ කළ ප්‍රාර්ථනාව ඉටුවේවායි කියා පෙරළා වැඩම කළ සේක.

ඉන් නොබෝ කලකින් පසු මිය ගොස් එම බරණැස් නුවර බිසොවුන්ගේ කුස පිළිසිඳ දස එකඩ මසකින් උපත ලදහ. රජ කුමාරයා වැඩිවිය පැමිණ රජ වී නුවර සරසා ඔවුණු පැළඳ අමාත්‍ය මණ්ඩලය හා බ්‍රාහ්මණ සමූහයා පඬුරු පාක්කුඩම් ගෙන ඒ ඒ තැන සිටින්නවුන් හා සොළොස් දහසක් බිසෝවරුන්, සොළොස් දහසක් නාටක ස්ත්‍රීනුත්, පංචාංග තූර්‍ය්‍ය නාදයත් පිරිවරා ගෙන, ශක්‍ර දේවේන්ද්‍ර විලාසයෙන් සිටියහ. රජතුමන්ට ජාතිස්මරණ ගුණ නුවණ පහළව, මා මේ ඓශ්චර්‍ය්‍යය ලද්දේ පසේ බුදුන් වහන්සේට පිළිගැන්වූ කොමුපිඩු සතරේ විපාකයෙනැයි සිතා සිංහාසනයෙහි ඉඳ ප්‍රීතියෙන් උදම් ඇනූහ. මම පසේ බුදුන් වහන්සේට ගිය ජාතියෙහි පිළිගැන්වූ ලුණු නැති, තෙල් නැති ගින්නේ තබා පිළියෙල කළ කොමුපිඩු සතරක් දන් දී බ්‍රාහ්මණ ගෘහපති අමාත්‍ය මණ්ඩලයන් හා සොළොස් දහසක් බිසෝවරුන්, සොළොස් දහසක් නාටක ස්ත්‍රීන්, චතුරාංගනී සේනාව හා පංචාංගික තූර්‍ය්‍ය නාදත්, තුන්සියයක් යොදුන් බරණැස් නුවරත්, සියලු සම්පත්තීන්ගෙන් අඩු නැතිව ලද්දේ මා දන දුන් කොමුපිඩු සතරෙකිනැයි ගාථා දෙකකින් පැවසීය. බ්‍රාහ්මණ, ගෘහපති, අමාත්‍ය මණ්ඩල හා බොහෝ මනුෂ්‍යයෝ රජ්ජුරුවන් වහන්සේ විසින් කී ගාථා දෙකකැයි කියා ගාථාවල අර්ථය නොදැන කීහ.

කෝසල රජ්ජුරුවන්ගේ දියණියන් මේ රජුට අගමෙහෙසිය කළාය. ඒ බිසව ගාථා දෙක ඉගෙන එක්වරම කියන්නීය. ඇය මෙම ගාථා දෙකේ අර්ථය කවදා විචාරම්දැයි සිතමින් සිටිනා විට, එක් දවසක් බිසොවුන් රජ්ජුරුවන්ට කළ සංග්‍රහයක් නිසා බිසොවුන්ට රජ්ජුරුවන් විසින් ඔබ කැමති වරයක් ගන්නැයි කීවේය. එවිට අගමෙහෙසිය ඔබ ඔටුණු පැළඳ සිට වදාළ ගාථා දෙකෙහි අර්ථය අසනු කැමැත්තෙමැයි කීවාය. රජ්ජුරුවෝ, එය ඔබට තනිව නොකියමි. දොළොස් යොදුනක් පමණ බරණැස් නුවර බෙර ගසා, පිරිවර රැස් කරවා, විසිතුරු මණ්ඩපයක් කරවා, රත්න පර්යංකව, අමාත්‍යන් හා බමුණන් ද, නුවර වැස්සන් ද, සොළොස් දහසක් පුරාංගනාවන් ද විසින් පිරිවරන ලදුව රත්න මණ්ඩපයෙහි හිඳ කියමියි පැවසූහ.

රජ්ජුරුවෝ කී පරිද්දෙන් සියල්ල සමෘද්ධි කරවා නාට්‍යාංගනාවන් විසින් පිරිවරන ලදුව ශක්‍ර දේවේන්ද්‍රයා පරිද්දෙන් මහත් වූ ජන සමූහයා පිරිවරාරත්න පර්යංකයේ හුන්හ. මල්ලිකා දේවිය ද සර්වාභරණයෙන් සැරසී රජ්ජුරුවන්ට බල බලා කථා කරන්නට සුදුසු ස්ථානයක හිඳ රජතුමනි, නුඹ වහන්සේ සතුටුව කියන්නා වූ මංගල ගීතිකාවෙහි අර්ථය මට ප්‍රකාශ කොට වදාළ මැනව. කුසල ධර්මයෙහි කැමති රාජෝත්තමයාණන් වහන්ස, සතුටු සිත් ඇතිව ගාථා දෙක අර්ථය සමඟ පවසන්නැයි ඉල්ලා සිටියාය.

ඉක්බිති බිසොවුන්ට අර්ථ ප්‍රකාශ කරමින්, එම්බා භද්‍රාව මම නාම ගෝත්‍රයෙන් අප්‍රසිද්ධව, දිළිඳු කුලයෙක උපන්නෙමි. දිළිඳු බැවින් අනුන්ට මෙහෙ කොට මෙහෙ කරනා මෙහෙකරුවෙකුව සිටියෙමි. දුප්පත් වුව ද දුශ්ශීල භාවය හැර දමා පංච සීලයෙහි පිහිටා සිටියෙමි. සිල්වත් මා විසින් කාමාදී ආශ්‍රව රහිත බුදුන් වහන්සේ සතර නමක් දුටිමි. උන්වහන්සේලා කෙරෙහි සිත පහදවාගෙන වැලි ගොඩ සතරක් කොට, ඒ මත කොළ අතුරවා, වඩා හිඳුවා දක්ෂිණෝදකයෙහි කර්මාන්ත භූමියේ දී මා කන්ට ගෙන යමින් සිටි, තෙල්, මී සකුරු ආදී කිසිදු රසයක් නැති කොමු පිඩු සතරක්, සතර දෙනා වහන්සේලාගේ පාත්‍ර වලට සියපතෙක තබා පිළිගැන්වීමි. ඒ කුසල කර්මයේ විපාකයෙන් මෙබඳු කුසල විපාක හේතු කොට ගෙන ධන, රාජ්‍යාදී සියලු වස්තුවෙන් පිරුණු රජ බවට පත්වීමි. භද්‍රාව, ඔබ ප්‍රධාන කොට ඇති සොළොස් දහසක් පුරඟනන් හා මාගේ මේ සියලු සමෘද්ධි ඒ පසේ බුදුන් සතර දෙනා වහන්සේට චේතනාව පිරිසිදු කොට පිළිගන්වා ලූ කොමුපිඩු සතර නිසායි. මෙසේ තමන් පෙර ජාතියේ කළ කුසලය ප්‍රකාශ කොට කීවේය.

බෝසතාණන් වහන්සේ තම පෙර ජාතියේ කළ කුසල විපාක විස්තර කළ පසු, ඒ අසා පහන් වූ සිත් ඇති මල්ලිකා දේවී, මහ රජ්ජුරුවන් වහන්ස, ප්‍රත්‍යක්ෂ කොට දානයේ විපාක දන්නා වූ නුඹ වහන්සේ මෙතැන් පටන් එක බත් පිඩක් පමණකුත් ලැබ ධාර්මික ශ්‍රමණ, බ්‍රාහ්මණාදීන්ට දන් දීලාම අනුභව කළ මැනවැයි බෝධිසත්වයන් වහන්සේට ස්තුති කොට, කුසලයේ අධිපති වූ රජ්ජුරුවන් වහන්ස, දුගී, මගී යාචකාදීන්ට ලත් දෙයක් පරිත්‍යාග කොට අනුභව කළ මැනව. දානාදී කුසලයන්හි ප්‍රමාද නොවුව මැන. ප්‍රතිරූප දේශ වාසාදී චතුර්විධ ධර්ම චක්‍රය පැවැත්වුව මැනව. යමෙක් අධර්මිෂ්ඨව ධනය රැස් කළත්, නුඹ වහන්සේ එසේ අධර්මිෂ්ඨ නොවුව මැනව.



"දානං සීලං පරිච්චාගං අජ්ජවං මද්දවං තපං
අක්කොධො අවිහිංසාච, ඛන්තිච අවිරොධතා"

යන දසවිධ රාජ ධර්ම රැක්ක මැනව. ඒ මල්ලිකා දේවීන් කී බස් පිළිගත්තා වූ මහබෝසතාණෝ, සොඳුර කෝසල රජ්ජුරුවන්ගේ දියණියනි, මා විසින් දන් දෙන ලද්දේ යැයි තෘප්තියක් නොකොට නැවත නැවත බුද්ධාදී මහෝත්තමයන් හැසුරුණා වූ දාන මාර්ගයේ හැසිරෙමි. අග්‍රදක්ෂිණෙය්‍ය බැවින් අරහත් වූ ඒ උත්තමයෝ දක්නට මනාමය. යහපත එසේ හෙයින් ඒ උත්තමයෝ දකිනු කැමැත්තෙමි.

මල්ලිකා දේවීන්ගේ සියලු සමෘද්ධිය දැක, සොඳුර දැන් මා පෙර ජාතියේ කළා වූ කුසල කර්මය ප්‍රකාශ කරන ලදී. ඔබ මේ සොළොස් දහසක් පමණ පුරාංගනාවන් හා නාටක ස්ත්‍රීන් මධ්‍යයෙහි රූපයෙන් ද, ලීලාවෙන් ද ස්ත්‍රී විලාසයෙන් ද සදෘශ්‍යව සිටින්නීය.ඒ එකදු ස්ත්‍රියක් ඔබ මෙන් නොමැත. ඔබ කවර කුසලයක් කොට මේ සම්පත්තිය ලද්දේ දැයි විමසා සිටියේය. සොඳුර කොසොල් රජ්ජුරුවන්ගේ දියණියෙනි, ඔබ රූප සමෘද්ධියෙන් දිව්‍ය ලෝකයේ ශක්‍ර දේවේන්ද්‍රයන්ගේ එක්තරා දිව්‍ය ස්ත්‍රියක් මෙන් මේ ස්ත්‍රී සමූහයා මධ්‍යයේ ශෝභාමත් වූයේ පූර්වයේ කළ කවර කුසලයක් නිසා දැයි විමසීය. එවිට මල්ලිකා දේවිය, පෙර ජාතියේ තමා කළා වූ කුසල කර්මය ජාතිස්මරණ ඥානයෙන් දැක පැවසුවාය.

රජ්ජුරුවන් වහන්ස මම පූර්වයෙහි එක් කෙළෙඹි කුලයක දාසිව උපන්නෙමි. අනුන් විසින් ඒ ඒ කටයුතු කරනු පිණිස නියෝග ලද්දෙමි. සෙසු කෙල්ලෝ දුශ්සීලය. මම සිත, කය, වචනය යන දොරටු වලින් අකුසල් නොකොට නිරන්තරයෙන් පංසිල් රැකීමෙන් සීල සම්පන්න වූයෙමි. දැහැමින් සෙමින් පවත්වන ලද ජීවිකා ඇත්තේ වූයෙමි. ආචාර සම්පන්න ගුණ ඇත්තේ වූයෙමි. යහපත් දර්ශනයක් ඇත්තෙමි. ප්‍රිය වූ ස්වභාවයක් ඇත්තෙමි. එකල්හි ස්වාමිදරුවන් විසින් මට කොටස් කර තබන ලද්දා වූ මට ලැබුණු බත් කොටස ක්ලේශයන් බිඳලූ පසේ බුදු කෙනෙකුන් වහන්සේට සොම්නස් සිතින් ආහාරයෙහි ලෝභ තෘෂ්ණාවක් නොමැතිව මුල මැද අග යනාදී වශයෙන් චේතනාව පිරිසිදු කොට පිළිගැන්වීමි. ඉන් අනතුරුව කාලක්‍රියා කොට සැවැත්නුවර කොසොල් රජ්ජුරුවන්ගේ අගමෙහෙසුන් කුස පිළිසිඳ බිහිව, නුඹ වහන්සේට පාදපරිචාරිකාව ලෙස වෙසෙමින් සම්පත්ති අනුභව කරමින් මෙසේ රූප සමෘද්ධියෙන් යුක්ත වූයෙමි. රජ්ජුරුවන් වහන්ස, ඒ පසේ බුදුන් වහන්සේට, අනුනට දාසිව සිට සිත පහදවාගෙන මා දන් දුන්නා වූ බත් කොටසෙහි විපාක මෙසේ යැයි කියා තමන්ගේ පූර්ව චරිතය විස්තර කළාය.

මෙසේ රජ්ජුරුවන් හා මල්ලිකා බිසොවුන් යන දෙදෙනාම තම පූර්ව ජාතියේ කුසල කර්ම විස්තර කොට නුවර සතර වාසල් දොර සිට නුවර මැද ද මාළිගා දොරකඩ ද යන මේ ස්ථානයන්හි දන්සැල් සයක් කරවා මහ දන් පවත්වා පංචසීල රැක පෙහෙවස් ආරක්ෂා කොට ජීවිතයේ ආයු කෙළවර දී දෙව්ලොව උපන්නාහයි තිලෝගුරු බුදුරජාණන් වහන්සේ  මේ ජාතක කතාව ගෙනහැර දක්වා මෙම කුම්මාසපිණ්ඩි ජාතකය නිමවා වදාළ සේක. එකල මල්ලිකා දේවීන් නම් රාහුල මාතාවන්ය. රජ්ජුරුවෝ නම් ලොව්තුරා බුදුන් වහන්සේය. මෙම ජාතක කතාවෙන් හෙළිවන පරිදි සසර ගමනේ දුක් ගිනි නිවා ගැනීමේ අදිටනින් මහෝත්තමයාණන් වහන්සේලා විසින් අනුදැන වදාළ දානයෙහි නිර්ලෝභීව දායක වීමට අදිටන් කර ගනිමු.

**කේ. මීගහකුඹුර**

"මරුවාගෙන් පහර ලද්දහුගේ රැකවරණය පිණිස වන දරුවෝත් නැත. මවුපියෝත් නැත. නෑයෝත් නැත. නෑදෑ ආදී කිසිවකුට ඔහු බේරාගත නොහැක.



### ඉපදෙන ඉපදෙන ආත්ම ගණනේ

# පින් පව් එනවා ඔබ පිටුපස්සේ

සියලු බුදුවරයන් වහන්සේලාගේ අනුශාසනාවන්හි "සබ්ප පාපස්ස අකරණං - කුසලස්ස උපසම්පද" යනුවෙන් සඳහන් කර ඇත. එසේම අප ගෞතම බුදුරජාණන් වහන්සේ වසල සූත්‍රයේදී "කම්මනා වසලෝ හෝති - කම්මනා පච්ත හෝති බ්‍රහ්මනෝ" යනුවෙන්ද වදාළහ. "නාහං භික්ඛවෙ කම්මං වදමි" යි යනුවෙන්ද දේශනා කිරීමෙන් කර්මය චේතනාව මුල් කොට ඇති බව වදාළ සේක. මේ අනුව අපගේ සිතිවිලි සමග අප කරන ක්‍රියාවන් බැඳී ඇති බව පැහැදිලිය.

බෞද්ධයාගේ අත්පොත සේ සලකන ධම්ම පද ගාථාවල යමක වග්ගයේ පළමු හා දෙවන ගාථාවලින් සඳහන් කොට ඇත්තේ සිත කිළිටි කර දුසිරිත් කරයි නම් හෝ සිතයි නම් ඒ හේතුවෙන් කරත්ත රෝදය ගොනුන් පසුපස එන්නා සේ දුකද තමන් පසුපස එන බවකි. පසන් සිතින් සුසිරිතෙහි යෙදෙයි නම් හෝ කරයි නම් ඒ හේතුවෙන් තමන් අත්නොහැර යන හෙවනැල්ල මෙන් සැපයද තමා සමග සිටිනා බවකි.

මේ අනුව වර්තමානයේ අප ගත කරන්නේ අතීත උපත්වලදී අනුව කරන ලද පාප හෝ පුණ්‍යකර්මවල ඵලවිපාක පරිදි සකස් වූ ජීවිතයකි. වර්තමානයේ කරන, කියන, සිතන දේ අනාගත උප්පත්තීන්වලට බලපානු ඇත. එසේ සිදුවී ඇති හෝ සිදුවන ආකාරය වර්තමානය ඇසුරින් සමාජයේ හමුවන චරිත විමසා බලා තේරුම් ගත හැකි ය. ඒ කෙසේද යත්,

### • පාපකර්ම ඵලදෙන ආකාරය

සමාජය තුළ ඇතැම් මව්පියන්ට තමා ජීවත්ව සිටියදීම තම දරුවන් අඩු වයසින් මිය යාමට සිදුවීම නිසා දුක්වන්නට සිදුවන අවස්ථා අප කොතෙකුත් දක ඇත. මෙයට හේතු වන්නේ දරුවන් තමන්ට කරදරයක් බරක් යැයි සිතමින් දරුවන් විනාශ කර දැමීමේ පාපය පලදීම නිසාය. මෙහිදී ප්‍රාණඝාත අකුසලය වෙනම විඳ ඇති අතර එයට අමතරව මෙම පලදීමද සිදුවේ. (පවුල් පාලනයද, ගබ්සා කිරීමද මෙයට අයත් වන අතර මේ සඳහා අපාගතව දුක් විඳ යළි භවයක් ලද විට නැවත නැවත මෙසේ දුක් විඳීමට සිදුවේ.)

අඩු වයසින් මිය යාමට හේතු වන්නේ පෙර භවයන්හි ප්‍රාණඝාතය සිදුකිරීම හේතුවෙනි. ප්‍රාණඝාතය වැඩි වැඩියෙන් සිදුවීම නිසා කකුසඳ බුදු සසුන පැවැති සමයේ වසර 80,000 ක් වූ මිනිස් ආයුෂය වර්තමානයේ අවුරුදු 70 ක පමණ තෙක් අඩුවී ඇත.

සමාජය තුළ නිතර කතා කරන මාතෘකාවක් වන්නේ දුප්පත්කමය. දුප්පත්කම නැති කිරීමට රාජ්‍යයන් විසින් විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කරති. එහෙත් සමාජයෙන් දුප්පත්කම තුරන් කිරීම අපහසු වී ඇත. මෙයට හේතුවී ඇත්තේ අනුන් සතු දේ සොරකම් කිරීම, පැහැර ගැනීම, අල්ලස් ගැනීම, වංචනික ලෙස දේපොළ අයිති කර ගැනීම මෙන්ම මල් විනාශ

"නිතර අනුන්ගේ දෙස් සොයන්නා වූ, අනුන් හෙළා තලා කතා කරන්නා වූ පුද්ගලයාගේ කාමාදී පාප ධර්ම වැඩෙත්. ඔහු රහත් ඵලයෙන් ඈත්ය."

කිරීම වැනි පාප ක්‍රියාවල යෙදීමය.

ඇතැම් අය විවාහ වුවද කෙටි කලකින් තම කලත්‍රයා මියයාම හෝ හැරයාම නිසා තනිවීමට සිදුවේ. එයට හේතුවන පාප කර්මය වන්නේ සිය කලත්‍රයාට නිසි ලෙස නොසැලකීමය.

එසේම ඇතැමුන් ජීවිත කාලයම විවාහයක් කරගැනීමට නොහැකිව ඒ නිසාම දුකින් කාලය ගත කරති. මෙයට හේතු වන්නේ පර සැමියන් හෝ පර අඹුවන් කරා යමින් අනාචාරයේ හැසිරීමේ පාප කර්මය කිරීමත්, අන් අයගේ සැපත දැක එයට ඊර්ෂ්‍යා කිරීමත්ය.



කෙනකු අන්ධ භාවයට පත්වන්නේ අන් අයව රවටා මුලාකර තිබීම නිසා වන අතර සතුන්ගේ ඇස් අන්ධ කිරීමේ පාපය කර තිබීමද හේතුවකි.

එසේම ගොළුවන් වශයෙන් උපත ලබන්නේ හෝ ගොළු භාවයට පත්වන්නේ තම දෙමාපියන්ට, වැඩිහිටියන්ට, ගුරුවරුන්ට හා පැවිදි උතුමන්ට බැණ වැදී අපහාස, උපහාස කිරීමේ පාපය නිසාවෙනි.

අංගවිකලව අබ්බගාතයකු වී ඉපදීමට හේතු වන්නේ සොරකම් කිරීම මෙන්ම සතුන්ගේ අවයවවලට හානි කිරීමය. මෙවැනි පාපකර්ම දුප්පතුන් වී ඉපදීමටද හේතු වේ.

අනුන්ගේ බැල මෙහෙවර කරමින් දස භාවයෙන් ජීවත් වන්නට සිදු වන්නේ සමාජ පිළිගැනීමට ලක්වූ අය කෙරෙහි ගුණමකු ලෙස කටයුතු කිරීමය.

එසේම සමාජයේ කුලහීනව හෝ අන් අයගේ පිළිගැනීමට ලක් නොවී සමාජය තුළ පහත් තත්ත්වයෙන් සැලකීම් ලැබීමට හේතුවන්නේ සිල්වතුන්, උගතුන්, ප්‍රභූන්, වැඩිහිටියන් යන අයට ගරහමින් කටයුතු කිරීමය.

සමහර තැනැත්තන් සුව නොවන රෝගයකින් පෙළෙන පුද්ගලයකු වී ජීවිත කාලයම ඒ මත දුක් වීමට සිදුවන්නේ සිල්වත් පැවිදි උතුමන් වෙත මස් මාංශ අනුභවයට පිළිගන්වා තිබීම නිසාය.

සිර දඬුවම් හෝ බන්ධනාගාර ගතවන පුද්ගලයන්ට එසේ දඬුවම් ලැබීමට හේතු වන්නේ සතුන් සිර කොට තබා ගැනීම, අනුකම්පා රහිතව සමාජ විරෝධී ක්‍රියාවල නියැළී සතුටුවීම වැනි පාප කර්ම සිදුකොට තිබීම නිසාය.

වර්තමානයේද ඇතැම් දේශවල මිනිසුන් හාමතේ මිය යන අවස්ථා අපට අසන්නට ලැබේ. මෙයට හේතු වන්නේ සතුන් හිරකොට ඔවුන්ට ආහාර ලබා ගැනීමට තිබූ අවස්ථා අසුරා තබමින් ඔවුන් මිය යාමට සැලැස්වීමය.

කෙනකු වස පානය කර මිය යාමට හේතු වන්නේ ජලය, වාතය හා ආහාරවලට වස විෂ එකතු කොට, සතුන් මරණයට පත්කොට තිබීම නිසාවෙනි. මෙම පාප කර්මයේ විපාක අපායේදී විඳින අතර ඉන් අනතුරුව මෙසේ තවදුරටත් විපාක විඳිති.

යමෙකුට ගෙල සිරවීමෙන් හෝ ගෙල වැළලාගෙන මරණයට පත්වීමට සිදුවන්නේ සතුන්ට උගුල් ඇටවීම, මදු ගැසීම හෝ වෙනත් ආකාරයක හිංසාවකින් සතුන් මැරීමට කටයුතු කිරීමය. මෙම පාප කර්මය කළ අය අනතුරුවලින් මිය යාමටද ලක්වේ.

කිසිවකු රෝග පීඩාදියෙන් දුක් විඳිමින් අල්ප ආයුෂ ඇතිව මිය යන්නේ බුද්ධ පූජාවට මස් මාංශ පූජා කිරීම හේතුවෙනි.

ඇතැම් අය මිටි අය වශයෙන් ඉපදීමට හේතු වන්නේ බිම දිගාවී දහම් ශ්‍රවණය කිරීම, බිම දිගාවී දහම් පොත් කියවීම, දහම් පොත් ලිවීම ආදී කරුණු හේතුවෙනි.

තම ධනය ගින්නෙන්, ජලයෙන්, සුළඟින් හෝ වෙනත් හේතු මත විනාශ දුක් වීමටත්, අනාථ වීමටත් හේතු වන්නේ අන් අයගේ දේපොළවලට හිතාමතාම හානි කිරීම, වංචා සහගතව වෙළෙඳාම් කර ධනය ඉපයීම වැනි පාපයන් නිසාය.

අන් අය කෙටවීම, කේලාම් කියා තරහ කරවීම වැනි පාපයන් නිසා වෙනත් සතුන්ගෙන් හිංසාවට ලක්වී දුක් විඳීමට සිදුවේ.

## පුණ්‍යකර්ම ඵල දෙන ආකාරය

සමාජයේ පුද්ගලයන් බොහොමයකට ගමන් බිමන් යාමට සැප පහසු යාන වාහන ලැබීමට හේතුවී ඇත්තේ ඔවුන් පෙර භවයන්හිදී මාර්ග ඉදිකිරීම, සිල්වතුනට පාවහන් පූජා කිරීම, මගීන්ට ගමන් යාමට වෙනත් අයුරින් උදව් කිරීම ආදී පින්කම්ය.

එසේම ඇතැම් අයට හිඟයකින් තොරව ඇඳුම් පැළඳුම් ලැබීමට හේතු වන්නේ පෙර භවයන්හිදී පැවිදි උතුමන්ට සිවුරු පිරිකර පූජා කිරීම, ඇඳුම් පැළඳුම් හිඟ අයට ඒවා ලබාදීම, ඔවුන්ගේ සිත් සතුටු කිරීම වැනි කාරණාවන්ය.

ඇතැම් අය සමාජයේ කැපී පෙනෙන තැනැත්තන් බවට පත් වන්නේ පෙර උපත්වලදී බුද්ධ ප්‍රතිමා නිර්මාණය කිරීමට දායක වීම නිසාය.

"යම් කෙනෙකුගේ සිත දිවා රෑ දෙකේ අහිංසාවෙහි ඇළුණේද ඒ ගෝතම ශ්‍රාවකයෝ හැමදම සුවසේ නිදා පුබුදිත්."

එසේම නිවාස හා ගොඩනැගිලි සුබෝපභෝග ලෙස ලැබෙන්නේ සිල්වතුන්ට, පැවිදි උතුමන්ට ආරාම පූජාව, දාන මානාදිය පූජා කිරීම ආදී පුණ්‍ය ක්‍රියාවන් හේතුවෙනි.

ජීවිත කාලය තුළ ආහාර පානාදිය අඩුවක් නැතිව රසවත්ව ලැබීමට හේතු වන්නේ දුගී දුප්පත් අයට, තිරිසන් සතුන්ට රසවත් ආහාර පාන පිළිගන්වා ඔවුන්ද සතුටු කර තමන්ද සතුටු වූ නිසාය.

පුද්ගලයන් අන් අයට ප්‍රියමනාප පුද්ගලයන් වීමට හේතු වන්නේ සිය නෑදෑ හිත මිත්‍රාදීන් සමග මනා සම්බන්ධයක් පවත්වා ගනිමින් ඔවුන්ට නිරන්තරයෙන් උපකාර කරමින් ඔවුන් සතුටු කිරීම නිසාය.

කිසියම් තැනැත්තකු රූපයෙන් අන් අයට වඩා කැපී පෙනෙන තත්ත්වයට පත් වන්නේ බුදුන් වහන්සේ කෙරෙහි ශ්‍රද්ධාවෙන් යුතුව මල්, පහන් පූජා කර තිබීම නිසාය. මෙවැනි අය දෙව්ලොව උපන්නත් අන් අයට වඩා රූපශ්‍රීයෙන් බබලන්නාහ.

අඹු-සැමියන් උපරිම විශ්වාසයෙන් යුතුව ඉතා සතුටින් සාර්ථක පවුල් ජීවිත ගත කරන්නේ අලංකාර විහාර මන්දිර ඉදිකිරීම, තිර රෙදි, බුමුතුරුණු පූජා කොට විහාරාරාම ලස්සන කිරීම වැනි පින්කම් නිසාය.

සමාජය තුළ ඇතැම් දෙමව්පියන් තුන් මුණුපුරන් පවා දකිමින් දීර්ඝ කාලයක් දරු මුණුපුරන් සමග ඉතා සතුටින්, සෙනෙහසින් ගත කරන අවස්ථා සමාජය තුළ දක්නට ඇත. එහෙත් විරලය. එවැනි මව්පියන් පෙර භවයන්හිදී අසරණව තනිවූ අයට උදව් උපකාර කරමින් ඔවුන් තනි නොකිරීම නිසා එම සතුට භුක්ති විඳිති. වියපත් මව්පියන් තනි නොකොට, ඇප උපකාර කිරීම එවැනි පින්කමකි.

එසේම කිසියම් කෙනකුට සහෝදර සහෝදරියන්, දූ දරුවන් ඇතුළු පවුලේ සාමාජික සංඛ්‍යාව වැඩියෙන් ලැබී ඉතාමත් සතුටින් ජීවත් වන්නට හේතු වන්නේ බුදු දහම අන් අයට දේශනා කිරීම, දේශනා කිරීමට ආරාධනා කොට, පිරිස එක්රැස් කොට දහම් ඇසීමට සැලැස්වීම. දහම් පොත් පත් මුද්‍රණය කර අන් අය අතට බෙදාහැරීම වැනි පින්කම් නිසාය. මිත්‍යාදෘෂ්ටික මතයක් වන කුඩා පවුල රත්තරන් යන මතය මෙවැනි පින්කම් කළ අය පිළිගන්නේ නැත.


මෙම භවයේදී යහපත් ශරීර සෞඛ්‍යයෙන් යුතුව විනෝදයෙන් හා සතුටින් දීර්ඝායුෂ විඳීමට හේතු වන්නේ කූඩු කර සිටින සතුන්ට නිදහස ලබාදීමට කටයුතු කර තිබීම නිසාය.

ඉහත සඳහන් කළ පරිදි කරන ලද පාප කර්මවල ඵල විපාක සතර මහා අපායන්හි ඉපිද, අනේක දුක් විඳ මිනිස් භවයක උපත ලැබූවද දුක් විඳීමට සිදුවන්නා සේම පින්කම්වල ඵලවිපාක සුගතිවල ඉපිද අපමණ සැප, සතුට ලබා මිනිස් භවයක උපත ලැබූ පසුවද සුඛදායක ඵලවිපාක විඳීමට හේතු වේ. ඇතැම් විට ඇතැම් කර්ම විපාක භවයන් සිය දහස් ගණනක් විඳීමට සිදුවන අවස්ථා ගැනද ධර්මයේ සඳහන් වේ. අගසව් මහා මොග්ගල්ලාන රහතන් වහන්සේ පෙර භවයක මව්පියන් මරා කරන ලද ආනන්තර්ය පාපකර්මයක් නිසා අවීචි මහා නිරයේ කල්ප ගණන් දුක් විඳ රහත් වූ පසුවද එම පාප කර්මය තවදුරටත් ඵල දුන් බව සඳහන් වේ.

මේ නිසා සෑම අවස්ථාවකම පාප ක්‍රියාවන්ගෙන් මිදී පුණ්‍ය ක්‍රියාවන්හි නිරතවීම යහපත් භවයන්හි සැප විඳීමට හේතුවන කාරණයක් බව සිහි තබා ගත යුතුය.

"සචිත්ත පරියො දපනං
ඒතං බුද්ධානු ශාසනං"


**බණ්ඩාර ඇකිරියගල**



# බුදු හිමි මෙනෙහි කොට මෙය උදේ සවස කියවන්න

මහා කාරුණික වූ ශාන්ති නායකයාණන් වහන්ස
ජීවිතයම පුදා... ඔබවහන්සේ සරණ යමි...
යන අතක් නොම දැන, ක්ලේශ විසඟයට හසුවූ මාගේ ජීවිතය පූජා කරමි...
හිස් වචන දොඩමින් අයාලේ ගිය මගේ සිතුවිලි...
මේ මොහොතේ පටන් හරිමගට ගෙන එමි...
බුද්ධං ජීවිත පරියන්තං සරණං ගච්ඡාමි...
මගේ දිවි දෙවැනි කොට බුදුරජාණන් සරණ යමි...
සිතනා මොහොතකින් සියලු දුක් නිවී යන ඔබවහන්සේ සරණ යමි...
ඔබේ රුව දුටු පමණින් ශාන්ත සුවයෙන් සිත පිරී යයි...
සිතනා ඇසිල්ලකින් සිතට සහනය ගෙනේ...
ජීවිතේ දෙවැනි කොට ඔබවහන්සේ සරණ යමි...
හිස් වචන දොඩමින්... නිසරු දේ ගැන සිතමින් ගෙවුණු කාලය නිමා කරමි...
නොදැන මා කළ සියලු වරදට සමාවන සේක්වා...
පා දූවිල්ලක් සෙයින් සිරිපා සිඹිමි... ශාන්තියෙන්...
සියලු සත්වයන්ගේ සැපත සැනසුම සඳහා තම ජීවිතයම පූජා කළ බව සත්‍යයි...
එම සත්‍ය ගුණයට මාගේ ජීවිතය පූජා වේවා...//
මුළු ලොවට වැඩ පිණිස අනේක හිරිහැර විඳි බව සත්‍යයි...
මාගේ සිතද ඒ මගට යොමු වේවා...
ජීවිතයම පුදා තම සෙනඟ රැකගත් බව සත්‍යයි...
මාගේ ජීවිතයද ඒ මගට යොමු වේවා...
මගේ සිරස මහා කාරුණිකයන් වහන්සේට සුව යහනක් වේවා!!!
මගේ හදවත බුදු කුටියක් වේවා...
දිය පොදක් නැති කතරට මහා වැස්සක් වේවා!!!
අන්ධකාරයට ආලෝකයක් වේවා!!!
රුවලක් නැති නැවට රුවලක් වේවා!!!
තරණය කරන්නට පාලමක් වේවා!!!
ශාන්ති නායකයාණන් වහන්ස, මාගේ ජීවිතය බුද්ධ පූජාවක් ලෙසින් පූජා කරමි!!!
බුදු සිරිපා මුල පා දූවිල්ලක් සෙයින් දාසයෙක් වෙමි...
පා පිස්නා පිස්සක් සෙයින් මානය දුරලමි...
නිසා යන පුන් සඳ සේ අප වෙත ගලා එන්නේ ඔබවහන්සේගේ හදවතින් ගලා ගිය සිසිලසයි...
උදෑසන රන් හිරු සේ ගලා එන්නේ අවබෝධයේ රැස් කිරණයි...
මහා බුදු අනුහසින් මා වෙළා ගනිත්වා...
මාගේ ජීවිතය මේ මොහොතේ පටන් සිරි පා තුළ වැතිර පූජා කරමි...
පූජා වේවා!!!

"ධර්ම දානය සියලු දානයන්ට වඩා ශ්‍රේෂ්ඨයි."



# බුදු දහම ලොව පුරා ව්‍යාප්ත වීමට බෝධි වන්දනාව ඉවහල් වූ හැටි

සුගත තථාගත අප සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ පරිනිර්වාණයෙන් පසුව මන්දනමානන පූජා සත්කාර සඳහා භාජන වූ පූජාර්හ වස්තු කීපයක් විය.

**1. බෝධිය, 2. ධර්ම චක්‍රය, 3. සිරි පතුල, 4. ශාරීරික ධාතු.**

මෙම සංකේත වස්තු තම තමන් හදගෙන හෝ පොදු මධ්‍යස්ථාන වන වෙහෙර විහාරවල සාදවා හෝ වැඳුම් පිදුම් කර ඇති අතර එයින් ජනතා සිත් සතන් තුළ ශ්‍රද්ධාදී කුසල චේතනාවන් වර්ධනය විය.

බෝධීන් වහන්සේ නමකයෙන් අපට ලැබෙන පරිකල්පනය හා ප්‍රඥාව විශ්ව ශක්තියක් බවට පත්වන්නේ බුදුරජාණන් වහන්සේගේ ජීවන චරිතය හා දේශනාවන් නිසාය. දෙවියන්, මිනිසුන්, යකුන් අසුරයන් ආදී සියලුම සත්ත්වයන්ගේ විඥානය හා මනෝ රථයන් ඒකීයත්වයෙන් කේන්ද්‍රගත කරගෙන යළි එය ගුණාත්මක භාවයෙන් හා නිර්මාණාත්මකව ප්‍රදනය කිරීමේ වාසනා මහිමයක් සෑම බෝධීන් වහන්සේ නමකටම පවතින්නේය. ශ්‍රද්ධාවත්, ප්‍රඥාවත්, අධිෂ්ඨානයත් ඇතිව බෝධීන් වහන්සේ නමකට පුද පූජා පවත්වා තම අපේක්ෂාවන් ඉදිරිපත් කරන්නේ නම් කෙදිනක හෝ ඉෂ්ට සිද්ධ වන්නේය.

බෝධි වන්දනාව නිසා දියුණු විෂයයන්

**1. මූර්ති කලාව, 2. චිත්‍ර කලාව,** 3. භාෂා සාහිත්‍ය, 4. සංගීතය, 5. සිරිත් විරිත්.

භාරත දේශයේ මෞර්ය කලා සම්ප්‍රදායන් දියුණු පවුණු වීමට මෙන්ම එම කලාවන් ජාත්‍යන්තරව ව්‍යාප්තවීමට බෝධි වෘක්ෂය මූලික වූ අයුරු සාංචි, භාර්හුට්, අමරාවතී යන කලා නිර්මාණවල දක්නට ඇත. බුද්ධ රූපය නිර්මාණය වනතුරු බුදුන් වෙනුවට බෝධිය හා වජ්‍රාසනය පෙන්නුම් කරන කැටයම් රාශියක් විශේෂයෙන් සාංචි ස්ථූපයේ තොරන්වල දක්නට ඇත.

බුදුරජාණන් වහන්සේ නොදුටු මූර්ති ශිල්පියාට බුදුන් කෙසේ නිර්මාණය කරන්නේද නම් යන උභතෝකෝටික ප්‍රශ්නයේදී බෝධි වෘක්ෂය පිළිබඳව අවධානය යොමු විය. බුදු දහම ජාත්‍යන්තරව ව්‍යාප්ත කිරීමට තම රාජ්‍ය බලය උපරිම වශයෙන් ප්‍රයෝජනයට ගත් ධර්මාශෝක රජතුමා විසින් ජීවමාන බුදුරදුන් දක නැති වුවද බුදුරදුන් වෙනුවට කළ හැකි උපරිම ආමිස පූජා පැවැත්වීමට, පූජා කිරීමට බෝධිය යොදගෙන ඇත.

මිනිසුන් පමණක් නොව දෙවියන්ද වන්දන මානන කරන්නේ දිවමන් බුදුන් පරිකල්පනය කොට බෝධියට හා සිරි පතුළටය.


බෝධි වන්දනාව කේන්ද්‍ර කරගෙන ලාංකේය ජනතාවට ලැබුණු ප්‍රයෝජන මෙසේය.

1. රාජ්‍ය තන්ත්‍රය තහවුරුවීම
2. කෘෂි කර්මාන්තය දියුණුවීම
3. ජනතාවගේ චින්තනය ප්‍රභාමත්වීම
4. රටේ හා ජනතාවගේ ආරක්ෂාව ඇතිවීම
5. පාරම්පරික සිරිත් විරිත් ක්‍රියාත්මක කිරීම.

භෞතික වශයෙන් මෙවන් ප්‍රයෝජන ලබන අතර ලෝකෝත්තර වශයෙන් නිවන් අවබෝධයටද බෝධි පූජාවේ ආනිශංස වශයෙන් හේතුවාසනා වන්නේය.

ශ්‍රී ලංකාවේ පිහිටුවන බෝධීන් වහන්සේ අප බුදුරජාණන් වහන්සේගේම අධිෂ්ඨාන බලයක් බව සමන්ත පාසාදිකා විනයපට්ඨ කතාවේ මෙන්ම සෙසු ඓතිහාසික ග්‍රන්ථවලද සඳහන් වන්නේය. එසේ පිහිටුවා ලංකාවාසී ජනතාවට කළ මහඟු දයාදය සම්පත ශ්‍රී සම්බුද්ධ ශාසනය පවත්නා තාක් දේශ දේශාන්තර ජනතාවගේ නෙත් සිත් සනසමින් විරාජමාන වන්නේය.

අනුරාධපුර ශ්‍රී මහා බෝධීන් වහන්සේ මෙන්ම අෂ්ටඵලරුහ, දෙතිස්ඵලරුහ බෝධීන් වහන්සේලා මෙන්ම ගම් නියම්ගම් රාජධානිවල වැඩ සිටින බෝධීන් වහන්සේලා පන්සල්, වෙහෙර විහාර ආදි කොට ඇති පරිසරය ආරක්ෂා කරන, වඳින පුදන සත්ත්වයාට නිරෝගී සම්පත හා මෙලොව පරලොව යහපත ඇතිකරන සුගති සංඛ්‍යාත දේව මානුෂිකාදී භව සම්පත්ද අවසානයේ නිවන් සම්පත් ලබා දෙමින් මනුලොව කල්ප වෘක්ෂයක් සේම විරාජමාන වන්නාහ.



පූජ්‍ය අමුණුපුර පියරතන හිමි

"ද්වේශ රහිත වූ යමෙක් බැණීම් ගැහීම් හා වධ බන්ධනත් ඉවසාද, ඉවසීම බලය කොටත් බල ඇණිය කොටත් ගත් ඔහු උත්තමයෙකි."

# දළදා මැදුරේ පත්තිරිප්පුව වෙනුවෙන් දිවි පිදූ දේවේන්ද්‍ර මූලාචාරි

මේ රටේ සිංහල බෞද්ධ ජනතාවගේ මුදුන් මල්කඩ වන දළදා වහන්සේ වැඩ සිටින මහනුවර සෙංකඩගල දළදා මාලිගාව ජනතාවගේ අප්‍රමාණ ගෞරවයට හා භක්තියට ලක්ව ඇති උතුම් මන්දිරයකි. දළදා මන්දිරය, දළදා මාලිගාව යන නම්වලින්ද හැඳින්වෙන දළදා මැදුර මේ රටේ පමණක් නොව සමස්ත ලෝකවාසී බෞද්ධ ජනතාවගේද අප්‍රමාණ ගෞරවයට හා භක්තියට පාත්‍රවී ඇත. එපමණක් නොව දේශීය විදේශීය වෙනත් ආගම්කාරයන්ගේ මෙන්ම බැතිමතුන්ගේද මහත් ඇගැයීමට මෙන්ම පූජනීයත්වයටද ලක්ව ඇත.

රටේ අභ්‍යන්තර අවුල් වියවුල්වලින් පසුව දළදා හාමුදුරුවන් සෙංකඩගල නුවරට වැඩම කිරීමෙන් පසුව දළදා මන්දිරය මුල්වරට ඉදිකරන ලද්දේ 1 වැනි විමලධර්මසූරිය (ක්‍රි.ව. 1952-1604) රජතුමා විසිනි. එහෙත් පත්තිරිප්පුව (අටපට්ටම් පොත්ගුල) සහිත වර්තමාන දළදා මන්දිරය ඉදිකරන ලද්දේ සිංහලේ අවසාන රජතුමා වන ශ්‍රී වික්‍රම රාජසිංහ (ක්‍රි.ව. 1797-1815) රජතුමා බව ප්‍රකටය.

දළදා මාලිගාව සඳහා ලංකාවේ කිසිම ස්ථානයක දක්නට නොලැබෙන අන්දමේ විශිෂ්ට නිර්මාණයක් කරවීමට ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමාට අවශ්‍ය විය. රජතුමා ඒ සඳහා රජ වාසල සියලුම ශිල්පීන්ට සහ නිර්මාණකරුවන්ට නියෝග කර ඇත. අවසානයේදී අටපට්ටම් හැඩයෙන් දර්ශනීය පත්තිරිප්පුව ඒ සඳහා තෝරාගෙන ඇත.


මෙම මහා අසදිස අසහාය නිර්මාණය ඉදිරිපත් කර ඇත්තේ රජවාසල රන් ඔටුණු පට්ටලයේ සේවය කළ දේවේන්ද්‍ර මූලාචාරියා (දෙවුන්දර මූලාචාරීයො) නමින් ප්‍රකට අලකේෂ්වර ඩිංගිත්තා අප්පු නමැත්තාය.

ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමාට දළදා මාලිගාව සඳහා මෙතෙක් ශ්‍රී ලංකාවේ කිසිවකු ඉදි නොකළ අන්දමේ නව හැඩයෙන් යුත් අලංකාර මන්දිරයක් සෑදීමට අවශ්‍ය වූ විට මහනුවර සෙංකඩගල රජවාසල නිර්මාණකරුවන්ට මෙන්ම උඩරට සියලුම ශිල්පීන්ට දන්වා සිටියේය. ඒ සඳහා විවිධ හැඩයෙන් යුත් ආකෘති බොහෝ ඉදිරිපත් කර ඇත.

දේවේන්ද්‍ර මූලාචාරියා නමින් ප්‍රකට අලකේෂ්වර ඩිංගිත්තා අප්පුද මේ සඳහා සැලසුමක් ඉදිරිපත් කරන



"කෝපයෙන් මත් වූ තැනැත්තා උමතු අශ්වයෙකු පිට නැගී යන්නෙකු වැනිය"



ලදී. අටපට්ටම් හැඩයෙන් යුක්තව ඉදිරිපත් කරන ලද මෙම නව ආකෘතිය දුටු රජතුමා ඉන් ඉතාමත් අතෘප්තිමත්ව ඒ ආකෘතිය අනුව මන්දිරය ඉදිකිරීමට නියෝග කර ඇත. අද දක්නට ලැබෙන අටපට්ටම් හැඩයෙන් යුත් පත්තිරිප්පුව (පොත්ගුල) දේවේන්ද්‍ර මූලාචාරියා විසින් ඉදිරිපත් කරන ලද ආකෘතිය අනුව ඉදිකරන ලද දළදා මන්දිරයයි.

දේවේන්ද්‍ර මූලාචාරියා විසින් මෙම නව ගොඩනැගිල්ලේ ආකෘතිය ඉදිරිපත් කර ඇත්තේ කෙසෙල් පතුරු සහ ගොක් කොළ උපයෝගී කරගෙනය.

දේවේන්ද්‍ර මූලාචාරියා ඉදිරිපත් කළ සැලසුම් ගැන ප්‍රසාදයට පත් රජතුමා ඒ අනුව මෙම පත්තිරිප්පුව ගොඩනගන ලදී. ඒ අසදිස මහා නිර්මාණයෙන් තුටු පහටු වූ රජතුමා දෙවිනුවර මූලාචාරියාට උඩුනුවර සන්නස මගින් උඩුනුවර මැද පළාතින් අරත්තන ප්‍රදේශයෙන් ගොඩ මඩ ඉඩම් ප්‍රදානය කළ බව සඳහන් වෙයි.

උඩරට ගෘහ නිර්මාණ කරන අවධියෙහි දෙවුන්දර මූලාචාරියා තාවකාලිකව අරත්තන විසූ බව පැවැසේ. ඔහුගේ නිවස ප්‍රකට වූයේ දෙවුන්දර ගෙදර නමිනි. ගෙබිම පිළිබඳ ශුභා ශුභ දක්වෙන ශාස්ත්‍රය වූ වාස්තු විද්‍යාව හා තාක්ෂණ ශිල්ප (වඩු කර්මාන්තය) උගත් ගෘහ නිර්මාණ විශේෂඥයකු වූ දේවේන්ද්‍ර මූලාචාරියා දළදා මැදුරේ පත්තිරිප්පුවට අමතරව මීදෙණිය මඩුවේද නිර්මාණ ශිල්පියා වෙයි.

මූලාචාරියාගේ නව කර්මාන්ත පිළිබඳව අතිශය සතුටට පත්වූ රජතුමා විසින් මෑතක් වනතුරුම ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චය ශාලාව වශයෙන් පැවැති මහනුවර මගුල් මඩුව සෑදීමද ඔහුට බාරදී ඇත. මහනුවර මගුල් මඩුවේ ප්‍රධාන ගෘහ නිර්මාණ ශිල්පියා දේවේන්ද්‍ර මූලාචාරියා බව ශ්‍රී වික්‍රම රාජසිංහ චරිතයේ 47 වැනි පිටුවේ අධෝලිපියේ සඳහන් වෙයි.

එහෙත් මෙවන් අතිවිශේෂ නිර්මාණ කළ ලෝක ප්‍රකට ශිල්පියාගේ අවසානය ඉතාමත් ඛේදජනක විය. මෙම ඛේදජනක ඉරණමට ඔහුට මුහුණ පාන්නට සිදුවී ඇත්තේ මගුල් මඩුවේ නිර්මාණ කටයුතු සිදුකිරීමේදීය. මහනුවර මගුල් මඩුව සෑදීම බාරගෙන වැඩ කිරීමේදී වටිනා දැව දඬු අඟලක් කොට කිරීම නිසා රාජ පුරුෂයන්ට අසුව ඊට දඬුවමක් වශයෙන් දේවේන්ද්‍ර මූලාචාරියාගේ ඇඟිල්ලක් කපා දැමීමට රජතුමා නියෝග කර ඇත. එහෙත් ඇඟිල්ල නොමැතිව ජීවත්වීමට වඩා මියයාම යෙහෙකැයි සිතූ දේවේන්ද්‍ර මූලාචාරියා බෝගම්බර වැවට පැන සිය දිවි නසාගෙන ඇත.

මධ්‍යකාලීන සිංහල කලා (Mediaeval Sinhalese Art 1909 Ananda Coomaraswami) පොතෙහි ආචාර්ය ආනන්ද කුමාරස්වාමි ඒ බව සඳහන් කර ඇත.

මේසා උසස් නිර්මාණයන් කළ උසස් ශිල්පියකු කිසිදු දිනක දැව දඬු කපා කොට කිරීම කිසිසේත් විශ්වාස කළ නොහැකි බව පවසන ඇතැමුන් එය සම්පූර්ණයෙන්ම කුමන්ත්‍රණයක ප්‍රතිඵලයක් බව සඳහන් කරයි.

පුරාණ කතාවලට අනුව දේවේන්ද්‍ර මූලාචාරියාට රාජ පුද පඬුරු හා පාත්කුඩම් ලැබ යෙහෙන් වැජඹීම නොරිස්සූ තවත් කලා ශිල්පීහු රැසක් කන්ද උඩරට වාසය කළහ. කලා ශිල්පීන් පමණක් නොව උඩරට සමහර රදළයන් හා ප්‍රභූහුද දේවේන්ද්‍ර මූලාචාරියා ගැන ප්‍රසාදයෙන් පසු නොවූහ. මෙම පිරිස රාජ පුරුෂයන් සමග එක්වී දේවේන්ද්‍ර මූලාචාරියාගේ ඉල්ලීම පරිදි රාජ නියමයෙන් මගුල් මඩුව සෑදීම සඳහා ගෙන්වන ලද කළුවර, බුරුත, හල්මිල්ල, මහෝගනී, ගම්මාලු ආදී වටිනා දැව දඬු අවශේෂ වඩුවන්ගේ සහාය ඇතිව අඟල, දෙක කපා ඇත. මෙය දේවේන්ද්‍ර මූලාචාරියා සිදුකළ බවට ප්‍රචාරයක් ගෙන ගොස් ඇත.

මෙයින් කෝපයට පත් රජතුමා දේවේන්ද්‍ර මූලාචාරියාගේ ඇඟිල්ලක් කපා දමන්නට නියම කර ඇත. ඇඟිල්ලක් නොමැතිව ජීවත් වන්නට වඩා මිය යාම යෙහෙකැයි සිතූ දේවේන්ද්‍ර මූලාචාරියා පසු දින හිමිදිරි පාන්දරම කාටත් හොර රහසේ මහනුවර බෝගම්බර වැවට පැන සියදිවි නසා ගත්තේ සිය අභිමානයත්, ගෞරවයත් ආරක්ෂා කරගන්නටය.

මේ පිළිබඳව තවත් මත උඩරට ප්‍රදේශය පුරා පැතිර පවතී. සාමාන්‍යයෙන් ලෝකයේ අති දුර්ලභ විස්මිත නිර්මාණ කළ පසු තවත් එවැනි නිර්මාණයක් කරාවි යැයි යන සැකය මත ඇතැම් රජවරුන් එම ශිල්පියා කිසියම් අපහසුතාවන්ට පත්කිරීම සිරිතක්ව පැවැත ඇත. ඒ අනුව ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමාද බොරු චෝදනාවක් පටලවා දේවේන්ද්‍ර මූලාචාරියාට දඬුවමක් දෙන්නට අදහස් කරන්නට ඇතැයි යන ප්‍රකට මතයක්ද වෙයි.

මුම්ටාස් දේවිය සිහිවීමට සාජහන් රජු විසින් කරවූ ටජ්මහල් නම්වූ ලෝකයේ විස්මිත නිර්මාණයක් කළ ශිල්පියාට එම නිර්මාණය කිරීමෙන් පසු සිය කටයුත්ත පවා පියවි ඇසින් දකින්නට නොහැකිව සදාකාලිකව අන්ධයකු ලෙස දිවි ගෙවන්නට සිදුවී ඇත.

කෙසේ වෙතත් අපේ රටේ ඉතාමත් දුර්ලභ නිර්මාණයක් කළ දේවේන්ද්‍ර මූලාචාරියාටද සිදුවූයේ ජීවිතයෙන් වන්දි ගෙවීමටය.

**ජයතිස්ස තෙන්නකෝන්**